


SUSARA CLASSICS

# අරාබි නිසොල්ලාසයේ කතා

SUSARA CLASSICS

# අරාබි නිසොල්ලාසයේ කතා

**අරාබි නිසොල්ලාසයේ කතා**

© සිරිමා බස්නායක
සුසර ප්‍රකාශකයෝ

ප්‍රථම මුද්‍රණය - 2013

ISBN 978-955-676-733-9
Agreement No: 288

පරිවර්තනය
සිරිමා බස්නායක

මුද්‍රණය
සුසර මුද්‍රණාලය
නො: 429/120, ග්‍රීන්ග්ලේඩ් පාර්ක්, කඩවත

ප්‍රකාශනය හා බෙදාහැරීම
සුසර ප්‍රකාශකයෝ
නො. 180/43, පීපල්ස් පාර්ක්, කොළඹ 11.
දු.ක. - 0112 430721 ෆැක්ස් - 0112 334597
*E-mail: susarapub@gmail.com*
*Web: www.susarapublications.net*
*Facebook: www.facebook.com/susarapublications*

# අරාබි නිසොල්ලාසයේ කතා

පරිවර්තනය

**සිරිමා බස්නායක**

SUSARA CLASSICS

# පටුන

පරිච්ඡේදය

i. එක් දහස් එක් රැයක ආරම්භක කථාව

ii. ගානට්ගේ කතාව

iii. මෝසල්හි තරුණයා

iv. කුදාගේ කතාව

v. අලිකොජියාගේ රන් මසු දහස

vi. ග්‍රිසෙල්ඩාගේ ආදරය

# එක් දහස් එක් රැයක ආරම්භක කතාව

බොහෝ ඈත අතීතයේ පර්සියාවේ ශාඃරියර් නමැති ඉතා බලසම්පන්න යහපත් රජෙක් සිටියේ ය. ඔහු තම රාජ්‍යය දෙකට බෙදා තර්තරිය නම් වූ ප්‍රදේශය ශාඃසේනත් නමැති තම මලණුවන්ට භාර දුන්නේ ය. ඔහුද තාර්තරියේ අගනුවර වූ සමර්-කණ්ඩ් නගරයේ පදිංචි වී රාජ්‍යය කළේ ය. අවුරුදු කීපයක් මෙසේ වෙන්ව විසූ පසු ශාඃරියර් රජුට තම බාල සොහොයුරා බැලීමට ආශාවක් ඇතිවිය. ඔහු තම මලණුවන් කැඳවනු පිණිස මහාමාත්‍යයා යැවීමට අදහස් කළේ ය. එසේ සිතා මහාමාත්‍යයාට සෑහෙන පමණ පරිවාර ජනයා සමග තාර්තරියට ගොස් ශාඃසේනත් රජ හමුවී ඔහු කැඳවාගෙන පැමිණෙන ලෙස රජතුමා නියම කළේ ය.

මහ ඇමතිතුමා ද පිරිවර සමග සමර්කන්ඩ් නගරයට ගොස් ශාඃසේනත් රජතුමා හමුවීමට ගියේ ය. තමාගේ සොහොයුරාගේ මහ ඇමති පැමිණි බව දැනගත් ශාඃසෙනත් රජු ඉමහත් ප්‍රීතියට පත්ව ඉතා ආදරයෙන් ඔවුන් පිළිගත්තේ ය. ඉන්පසු තම වැඩිමල් සහෝදරයා වන ශාඃරියර් රජතුමාගේ සුව දුක් විචාළේ ය. මෙසේ තොරතුරු කතා කිරීමෙන් පසුව තමා පැමිණි කාරණය ගැන ශාඃසේනත් රජතුමාට කීවේ ය.

එය ඇසූ ශාඃසේනත් රජතුමා.... වහාම තම සොහොයුරා බැලීමට යාමට කටයුතු සූදානම් කළේ ය. ගමනට සූදානම් වීම සඳහා දින දහයකට වඩා කාලයක් අවශ්‍ය නොවන බැවින් මහ ඇමති තුමා ඇතුළු පිරිසට සමර්කණ්ඩ් නගරයේ ම නවාතැන් ගැනීමට ශාඃසේනත් රජතුමා ඉල්ලීමක් කළේ ය. ඒ අනුව මහ ඇමති ඇතුළු පිරිස කූඩාරම්ලා එහි නැවතුණේ ය. පිරිසට අවශ්‍ය ආහාර පාන ආදී සියල්ලම රජතුමා සැපයූයේ ය. දින 10 ක් ගතවන විට ගමනට අවශ්‍ය සියලු දේ රජතුමා සූදානම් කළේ ය. තමා ආපසු පැමිණෙන තුරු අනුශාසනා කිරීමට මන්ත්‍රී සභාවක් ද ප්‍රධාන මන්ත්‍රීවරයෙක් ද පත් කළේ ය. ඉන්පසු තම ආදරණීය භාර්යාවගෙන් සමුගෙන පිරිවර සේනාව සමග ගමන් අරඹා සන්ධ්‍යා භාගයෙහි මහ ඇමති සිටි කූඩාරමට පැමිණියේ ය. එහිදී රාත්‍රී ආහාරය ද අනුභව කර මධ්‍යම රාත්‍රිය වන තුරු තොරතුරු කථා කරමින් සිටියේ ය. සමර්කණ්ඩ් නගරයෙන් පිට වීමට පෙර තවත් වරක් තම ආදරණීය බිසව බලා ගැනීමට සිතූ ශාඃසේනත් රජු කිසිවෙකුටත් නො කියා ආපසු මාලිගාවට ගොස් බිසව සිටින ඇතුල් මාලිගාවට ගියේ ය.

මේ අවස්ථාවේ රජුගේ ආපසු ඒම ගැන අපේක්ෂා නො කළ බිසව, මාලිගාවෙහි සිටි ඉතා සුළු දාසයකු සමග දැඩි නින්දේ පසු වූවා ය. මේ බැව් නො දත් රජ තෙමේ තම බිසව පුදුමයට පත් කිරීමට සිතා නිසොල්මනේ යහන්ගෙය තුළට පිවිසියේ ය. යහන් ගෙය තුළ ඇති ආලෝකයෙන් බිසව දාසයෙක් සමග නිදන අයුරු රජතුමා දුටුවේ ය. ඔහුගේ ඇස් අදහාගත නොහැකිව තවත් ළංවී බැලුවේ ය.

"අහෝ දෙවියනි, මේ කුමක් සිදුවන්නේ ද? මා මාලිගයෙන් පහතට බැස සමර්-කණ්ඩ් නගරයේ ප්‍රාකාරය

ආසන්නයේ සිටියදී ම මෙවැනි නීච ක්‍රියාවක් නිර්භය ලෙස මගේ බිරිඳ විසින් කරන ලද ද? අහෝ ! කාලකන්නි වංචාකාරයිනි, තොප විසින් කරන ලද මේ වරදට තොප දඬුවම් විඳිය යුතුයි. මම රජෙක් බැවින් මගේ රාජ්‍යයේ දී කළ නීච ක්‍රියාවට දඬුවම් කරමි. කුපිත ස්වාමි පුරුෂයකු මෙන් තොපගෙන් පළිගනිමි.'' යනුවෙන් රජතුමා සිතුවේ ය. කෝපයෙන් වියරු වැටුණු රජතුමා කඩුව ඇද බිසව හා දාසයා නින්දේ සිටියදී ම එක කඩු පහරින් මරා මෘත ශරීර දෙක ගෙන කවුළුවෙන් මාලිගාව අසල වූ අගලකට වීසි කළේ ය.

ඉන්පසු කිසිවක් සිදු නොවූ කලෙක මෙන් රහසින් ම ආපසු කූඩාරමට ගොස් සිදු වූ පුවත් ගැන කිසිවෙකුට නො කියා පසු දින ගමනට සූදානම් වූයේ ය. පංච තූර්ය වාදන හා ගීත ගායනා මැද්දේ පිරිවර සේනාව සමග රජතුමා ගමන් ආරම්භ කළේ ය. ගමන් ගත් සියල්ලෝ ම ගායන වාදන ඇසීමෙන් හා ගීත ගායනා කිරීමෙන් ප්‍රීති වූ නමුත් රජතුමා පමණක් කනස්සල්ලෙන් පසු විය. බිසව විසින් කරන ලද නීච ක්‍රියාව ගැන ඔහුට වරින් වර මතක් විය. ගමන මුළුල්ලේ ම ඔහු මලානික ස්වභාවයකින් පසු වූයේ ය.

ශාඃසේනත් රජතුමා ඇතුලු පිරිස තම නගරයට ආසන්න වූ කල්හි ශාඃරියර් රජතුමා තම පිරිස සමග පෙර මගට ගොස් ආදරණීය මලණුවන් පිළි ගත්තේ ය.

ඔහු තම මලණුවන් සිප වැළඳගෙන ගෞරවාදර පවත්වා නැවත ප්‍රීති ඝෝෂා මැද්දේ පෙරහරින් නුවරට කැඳවාගෙන ගියේ ය. ශාඃරියර් රජු තම මලණුවන් වෙනුවෙන් සියලු පහසුකම් සහිත ඉතා අලංකාර මාලිගාවක් සාදවා තිබිණ. මාලිගාව ඉදිරිපස ඉතා අලංකාර උයනක් ද විය.

රජවරු දෙදෙනා ගිමන් හැර ස්නානය කොට හැඳ පැළඳගෙන තොරතුරු කථා කිරීමට පටන් ගත්හ. මේ දෙදෙනා සොහොයුරන් මෙන් ද මිත්‍රයින් මෙන් ද බොහෝ වේලාවක් ඉතා සතුටින් අල්ලාප සල්ලාපයෙහි යෙදුනාහ. ඉන්පසු රාත්‍රී භෝජන ගැනීමේ වේලාව පැමිණි බැවින් ආහාර අනුභව කළහ. ආහාරයෙන් පසු නැවතත් බොහෝ වේලාවක් සල්ලාපයෙහි යෙදෙමින් සතුටු වී රෑ බෝවී ඇති බැවින් දෙදෙනා සමුගෙන නිදා ගැනීමට ගියහ.

සහෝදරයා සමග සතුටු සාමීචියෙන් පසුවීම නිසා තම ක්‍රෝධය තරමක් දුරට අඩු වී තිබුණ නමුත් තනිවම සයනයට ගිය පසු ශාඃසේනත් ට තම බිසව කරන ලද නීච ක්‍රියාව වරින් වර මතක් වීම නිසා චිත්ත සන්තාපය ඇති විය. මෙසේ එළිවන තුරු නිදි නොලැබ මහත් දුක්ඛිත සිතුවිලි වලින් පීඩිතව රාත්‍රිය ගත කළේ ය. පසුවදා එළිවන විට ශාඃසේනත් රජුගේ මුහුණ මලානික ස්වභාවයක් ඉසිලුවේ ය. මේ බව වැඩිමහල් සහෝදර ශාඃරියර් රජුට ඉතා හොඳින් පෙනුනේ ය. මලණුවන්ගේ මුහුණෙහි ඇති කනගාටුදායක පෙනුම ගැන ඔහු සිතුවේ ය.

''අහෝ ! මගේ මලණුවන් මෙතරම් මලානිකව සිටීමට කාරණාව කුමක් ද? මා විසින් ඔහු පිළිගැනීමේ දෝෂයක් වී ද? ඒකාන්තයෙන් ම නැත. මගේ පෙම්බර සොහොයුරකු මෙන් ද තාර්තරියේ රජතුමා මෙන් ද මම ඔහුට ආදර ගෞරව දක්වා පිළිගතිමි. එහෙයින් මා අතින් වරදක් වී නැත. එසේ නම්, ඔහු තම බිරිඳගෙන් බැහැර වී සිටීම නිසා ඇය නොදැක්මෙන් දුක් වන්නේ ද? එසේ නම් ඔහු සිතූ විටක වහාම ආපසු යාම සඳහා මා විසින් ඔහුට දීමට අදහස් කළ තෑගි බෝග ඉක්මනින්ම දිය යුතුය.'' මෙසේ සිතූ ශාඃරියර් රජු තාරත

දේශයේ ඉතා දුර්ලභ බොහෝ වටිනා වස්තු මලණුවන්ට තෑගි කළේ ය. ශාඃරියර් රජු දිනපතා ම ඉතා අලංකාර වටිනා තෑගි බෝග දීමෙන් ද ඉතා රසවත් ආහාරපාන දීමෙන් ද, විශිෂ්ය ලෙස සත්කාර කිරීමෙන් ද මලණුවන් සතුටු කිරීමට උත්සාහ ගත් නමුත් ශාඃසේනත් රජුගේ කණස්සලු ස්වභාවය තුරන් කිරීමට නොහැකි විය.

දින කීපයකට පසු ශාඃරියර් රජතුමා සිය මලණුවන් සතුටු කිරීම සඳහා ඔහු සමග දඩ කෙළියෙහි යාමට දිනයක් නියම කර ගත්තේ ය. ඔහු තම මලණුවන්ට ද මේ බව දැන්වූයේ ය. එහෙත් ශාඃසේනත් තමාට අසනීප බැව් කියා දඩ කෙළියේ නොගොස් මාලිගාවේ නතර වූයේ ය. ශාඃරියර් රජු සහ පිරිස දඩ කෙළිය සඳහා සැන්දෑයාමයේ පිටත් වූ පසු ශාඃසේනත් රජු තම ඇතුලු මන්දිරයේ දොර වසාගෙන තම බිසවගේ දුෂ්ය ක්‍රියාව ගැන සිතමින් කවුළුවෙන් උයන දෙස බලා සිටින්නට විය.

මෙසේ බලා සිටින ශාඃසේනත් රජුට හදිස්සියේ ඉතා පුදුම දෙයක් දක්නට ලැබුණේ ය. මාලිගාවේ රහස් දොරක් හදිසියේ ම විවෘත වී එයින් ස්ත්‍රීහු විසි දෙනෙක් පැමිණියහ. ඔවුන් සමග තම සහෝදරයාගේ අග බිසව ද සිටියා ය. මෙම පිරිස ශාඃසේනත් රජු මාලිගාවේ රැඳී සිටින බව නොදැන ඔහු සිටි කවුළුව අසලට ම පැමිණියහ. ශාඃසේනත් රජු ද සිදුවන්නේ කුමක්ද යි සැඟවී බලා සිටියේ ය. පරිවාර ස්ත්‍රීන් ලෙස පැමිණි අයගෙන් දස දෙනෙක් කාල වර්ණ පුරුෂයන් වූහ. ඔවුහු තම තමන්ගේ ස්ත්‍රීන් තෝරා ගන්නට වූහ. අග මෙහෙසිය සොර සැමියා බලාපොරොත්තුවෙන් වට පිට බැලුවා ය. එවිට ම කාල වර්ණ හැඩි දැඩි පුරුෂයෙක් ගසකින් බැස බිසව කරා ආවේ ය. ඉන්පසු රජ බිසවත්, ඇයගේ පරිවාර ස්ත්‍රීහුත් මධ්‍යම

රාත්‍රිය වන තෙක් ම ඔවුන්ගේ සොර සැමියන් සමඟ පෙම් බස් දොඩමින් සිප වැළඳ ගනිමින් උයනේ තැනින් තැනට වී සතුටු වූහ. ඉන්පසු අග බිසවගේ සොර සැමියා හැර අනෙක් පුරුෂයන් ද ස්ත්‍රීන් ද රහස් දොරින් මාලිගාවට ඇතුල් වූහ. අග බිසවගේ සොර සැමියා ගසට නැග තාප්පයෙන් පිටතට පැන ගියේ ය. මේ සියලු සිද්ධීන් සියැසින් දුටු ශාඃසේනත් මෙසේ සිතන්නට විය.

''මගේ බිරිඳ පමණක් නොව මගේ සහෝදරයාගේ බිරිඳ ද සොර සැමියන් සමඟ අනාචාරයේ හැසිරෙයි. මට වඩා සුප්‍රසිද්ධ රජකුවන ශාඃරියර් රජුට ද දුක් වීමට හේතු ඇත. ඒ නිසා දිවි නැසෙන තුරු ශෝකයෙන් සන්තාපයෙන් සිටීම මා කරන මෝඩ ක්‍රියාවකි. සදාකාලික පසුතැවිල්ලෙන් සිටීම සුදුසු නැත. ශෝකය මැඩ පවත්වාගෙන සතුටින් සිටිය යුතුය. මගේ රට වැසියන් ගැන සිතිය යුතුය.''

මෙසේ සිතූ ශාඃසේනත් රජතුමා එදින රාත්‍රියේ සතුටින් නිදා ගත්තේ ය. මිහිරි සංගීතයට සවන් දෙමින් සතුටු වූයේ ය. තමාගේ සොයුරු ශාඃරියර් දඩ කෙළියේ ගොස් ආපසු පැමිණි බව අසා ඉතා ප්‍රසන්න ලෙස පෙර මගට ගොස් ප්‍රිය මනාප වචනයෙන් කතා කරමින් ඔවුන් පිළිගත්තේ ය. ශාඃරියර් ද දඩ කෙළියෙන් සතුටු වූ ආකාරය පැවසුවේ ය. දෙදෙනාම මනාප ලෙස කතා සල්ලාපයෙහි යෙදුනාහ.

ශාඃරියර් රජු තමාගේ මලණුවන්ගේ මෙම වෙනස් වීම ගැන පුදුම විය. ඉතා කනගාටුවෙන් මලානික මුහුණකින් යුතුව සිටි ශාඃසේනත් මෙසේ සතුටින් සිටිනු දැක දෙවියන්ට ස්තුති කළේ ය. එහෙත් මලණුවන් කනගාටුවෙන් සිටීමත්, දැන් ප්‍රීතියෙන් සිටීමත් ඔහුට ප්‍රහේලිකාවක් විය. එබැවින් ශාඃරියර් රජු වෙනසට හේතුව කුමක්දැ යි මලණුවන්ගෙන්



ඇසුවේ ය. එවිට මලණුවන් එම ප්‍රශ්නයට පිළිතුරු නොදී සිටීමට අයියාගෙන් අවසර ඉල්ලා සිටියේ ය.

''මගේ මලණුවනි, ඔබට එම ප්‍රශ්නයට පිළිතුරු නොදී සිටීමට අවසර නොදෙමි. ඔබ පිළිතුරු දිය යුතුම ය.'' යනුවෙන් ශාඃරියර් රජු කීවේ ය. ''ඔබ තුමා මට බල කරන්නේ නම් කියන්නෙමි.'' යනුවෙන් පවසා තමාගේ මෙහෙසියගේ අශීලාචාර හැසිරීම ගැනත් එදින සිදු වූ සියලු දේ පිළිබඳවත් කීවේ ය. ශාඃරියර් රජු මෙය අසා මහත් සේ කෝපයට පත් වූයේ ය. ''ඔබ දඬුවම් කළ ආකාරය ඉතා හොඳයි. එහෙත් මෙය නම් ශෝක කළ යුතු කතාවක්ම ය. අනේ දෙවියනි, මෙවැනි ශෝකජනක සිදුවීමක් කාටවත් සිදුනොවේවා''යි ඔහු කීවේ ය.

ඉන්පසු ශාඃරියර් රජු නැවතත් කථා කළේ ය. ''හොඳයි ඔබ ශෝකයට පත්වූ කාරණාව මම දැනගතිමි. දැන් ඉතින් ඔබ ශෝක නොවී සතුටින් සිටීමට හේතුවූ කාරණාව දැනගනු රිසියෙමි.'' යනුවෙන් කීවේ ය. තමාගේ දුක නැතිවීමට හේතුව කීමට ද ශාඃසේනත් අකමැති විය. එහෙත් ශාඃරියර්ගේ බලවත් ඉල්ලීම නිසා එයට හේතුව ද කියන්නට සිදුවිය. ශාඃරියර් රජු දඩ කෙළියෙහි ගිය දවසේ ඔහුගේ බිසව සහ වහල් ස්ත්‍රීන් ඔවුන්ගේ සොරසැමියන් හමුවී හැසුරුණු ආකාරය පිළිබඳ සියලු විස්තර කීවේ ය. මෙම සිද්ධිය දුටුවායින් පසුව තමාට පමණක් නොව සියලුම පුරුෂයින්ට මෙසේ භාර්යාවන් විසින් සතුරුකම් කරන බව සිතා, සිත සනසා ගත් බව කීවේ ය. තම සොහොයුරාට ද මේ සිද්ධිය ගැන කම්පා නොවන ලෙස කියා සිටියේ ය.

එහෙත් මෙම සිද්ධිය ඇසූ විගස ශාඃරියර් බලවත් සේ කෝපයට පත්විය. තමා දුටු සිද්ධිය සත්‍යද යි බැලීමට

අවශ්‍ය නම්, දඩ කෙළියට යන බව බිසවට දන්වා, මාලිග යෙන් පිටවී ශාඃසේනත් සිටින මාලිගයට වී සැඟවී බලා සිටින ලෙස ශාඃසේනත් තම වැඩිමහල් සහෝදරයාට කීවේ ය. ඒ අනුව දඩ කෙළියට යන දිනයක් නියම කොට එදින රජවරු දෙදෙනා ම පිරිවර සමග ගොස් කූඩාරම් වල නැවතී සිටියහ. රෑ බෝවුන පසු ශාඃරියර් රජතුමා මහ ඇමති තුමාට කතා කොට තමා මලණුවන් සමග ටික වේලාවකට පිටතට යන බවත්, එසේ ගියපසු කිසිවෙකුටත් කූඩාරමෙන් පිටතට යාමට ඉඩ නො දෙන ලෙසත් පැවසුවේ ය. ඉන්පසු රජවරු දෙදෙනා ශාඃසේනත් නැවතී සිටි මාලිගාවේ කවුළුව ළඟට ගොස් උයන දෙස බලා සිටියහ.

ටික වේලාවකට පසු මාලිගයේ රහස් දොර විවෘත විය. බිසවත් පරිවාර ස්ත්‍රීහුත් පැමිණියහ. ඔවුහු සොර සැමියන් හා එක්වූහ. බිසවගේ සොර සැමියා වූ මන්සූර් නමැත්තා ද ගසින් බැස පැමිණ ඇය වැළඳ ගත්තේ ය. මෙම දර්ශනය තම දෑසින් ම දුටු ශාඃරියර් රජතුමා කෝපයෙන් වියරු වැටී තම මලණුවන් තරයේ වැළඳ ගත්තේ ය. ''අනේ! දෙවියනි, මේ කවර නින්දාවක් ද? භයංකාර දෙයක් ද? දුෂ්ඨ ක්‍රියාවක් ද? මා වැනි රජෙකුගේ බිසවකට මෙසේ නීච අන්දමට හැසිරීමට පුළුවන් ද? මලණුවෙනි, මේ ලෝකයේ කිසිම පුරුෂයකුට ඔවුන්ගේ භාර්යාවන් විශ්වාස කළ හැකි ද? දැන් අප මහත්සේ නින්දාවට පත්ව ඇත. ඒ නිසා අපි දෙදෙනා මේ රාජ්‍යයත් අතහැර වෙනත් රටකට ගොස් අප්‍රසිද්ධියේ ජීවත් වෙමු.'' යනුවෙන් ශාඃරියර් රජු තම මලණුවන්ට කීවේ ය. ශාඃසේනත් රජු ද මෙම අදහසට එකඟ වූයේ ය.

එදින රජතුමා දඩකෙළියේ නොයන බව මහ ඇමතිට දන්වා යවා, රජවරු දෙදෙනා පසුවදා උදේ හොර රහසේ

මාලිගයෙන් පිටවී පිටරටකට යාම සඳහා ගමන් ඇරඹූහ. එදින දවස මුළුල්ලේ ඇවිද රාත්‍රි කාලයේ ගසක් යට නිදා ගත්හ. පසුවදා නැවත ගමන් කොට මුහුද අසල පිහිටි රමණීය ස්ථානයකට පැමිණ ගස් සෙවණක සිට උදේ ආහාරය අනුභව කරන්නට සූදානම් විය. එවිට, මුහුද දෙසින් ඝෝෂාවක් හා අතිභයංකාර ශබ්දයක් ඇසෙන්නට විය. ඒ සමග ම සාගරය මැදින් විශාල දුමක් මතුවන්නට විය. දුම අතරින් කළු පාට කණුවක් මතුවිය. එම කණුව මත විශාල වීදුරු පෙට්ටියක් විය.

එම කණුව හෙමින් හෙමින් වෙරළ දෙසට ඇදෙන්නට විය. එය කණුවක් නොව ඉතා භයංකාර දුෂ්ට රාක්ෂයෙක් බව සහෝදරයින් දෙදෙනාට පෙණින. ඔවුහු බියෙන් වෙව්ලමින් අසල තිබූ ගසකට නැග ගත්හ. රාක්ෂයා ද පෙට්ටිය හිස තබාගෙන ගස දෙසට පැමිණ ගසමුල පෙට්ටිය තැබුවේ ය. රජවරු දෙදෙනා ද මර භයින් වෙව්ලමින් රාක්ෂයා කරන්නේ කුමක්ද යි විමසිලිමත්ව බලා සිටියහ. රාක්ෂයා තම ඉන පටියේ වූ යතුරක් ගෙන පෙට්ටිය ඇරියේ ය. එවිට පෙට්ටිය තුළින්, ඉතා අලංකාර වස්ත්‍රාභරණයෙන් සැරසීගත් මනා රූප සම්පත්තියෙන් යුත් තරුණ කාන්තාවක් එළියට ආවා ය. රාක්ෂයා ඇයට තමාගේ පසෙකින් ඉඳගන්නට සලස්වා ඇය දෙස ආදරයෙන් බලා මෙසේ කියන්නට වුයේ ය. ''තරුණ රූමත් කාන්තාවන් අතුරින් පළමුවන ස්ථානය හිමි මගේ ආදරණීය සොඳුරිය, මම, ඔබ විවාහ වන දිනයේ රාත්‍රියේ ඔබව පැහැර ගතිමි. එදා පටන් මම ඉතා ආදරයෙන් ඔබව රැක ගතිමි. මට ටික වේලාවක් ඔබේ උකුලේ නිදා ගැනීමට අවශ්‍ය බැවින් මේ ස්ථානයට පැමිණියෙමි.'' මෙසේ කියා යෝධයකු තරම් මහත් වූ ශරීරයක් ඇති රාක්ෂයා කාන්තාවගේ උකුලේ හිස තබා, මුහුද දක්වා කකුල් දිගහැර නිදන්නට විය.

මද වේලාවකින් මුහුදේ හඬටත් වඩා හඬ නංවමින් රාක්ෂයා ගොරවන්නට විය.

රාක්ෂයාගේ හිස අතගාමින් සිටි කාන්තාව හදිසියේ ම උඩ බැලුවා ය. ඇය ගස උඩ සිටින රජවරු දෙදෙනා දුටුවා ය. රජුන් දෙදෙනාට ගසින් බැස එන ලෙස ඇය අතින් සංඥාවක් කළා ය. රජවරු දෙදෙනා බිය වී ඔවුන්ට ගස උඩ හිඳීමට ඉඩදෙන මෙන් සංඥා කළහ.

එවිට ඕතොමෝ රාක්ෂයාගේ හිස හෙමින් ඔසවා බිම තබා නැවත හිස අතගා රාක්ෂයා නිදිකරවා ගස මුල සිට ගත්තා ය. ඉන්පසු රජවරුන්ට ගසෙන් බැස තමා ළඟට එන මෙන් හෙමින් කීවා ය. රජවරු ගසෙන් බැසීමට බිය බවත්, ඒ ගැන සමාවන ලෙසත් පැවසුහ. එවේලෙහි රජවරු ගසින් බැස තමා ළඟට නොපැමිණිය හොත් රාක්ෂයාට කියා ඔවුන් මරා දමන බව ඇය කිවා ය. මෙබස් ඇසූ රජවරු දෙදෙනා මහත් භීතියට පත්ව රකුසා අවදි නොවන සේ ඉතා හෙමින් ගසෙන් බැස කාන්තාව ළඟට පැමිණියහ.

එවිට කාන්තාව මේ දෙදෙනා දෙස ප්‍රේමණීය බැලුම් හෙලා ගසක් යටට කැඳවාගෙන ගොස් පෙම් වදන් පවසන්නට වූවා ය. ඇය ඔවුන් දෙදෙනාට තුරුළු වෙමින් සිප වැළඳගමින් සතුටු වූවා ය. රාක්ෂයා මෙම කාන්තාව ගැන සැක කරමින් විදුරු පෙට්ටියක දමා මුහුද පතුලේ සඟවාගෙන සිටින ආකාරයත්, එහෙත් සැමියාට රහසින් වෙනත් සොර සැමියන් සමග ජීවත් වූ හැටිත් ඇය රසකරමින් කීවා ය. ඉන්පසු ඇගේ සළු පොටක ගැට ගසා තිබූ පෙට්ටියක් ගෙන එයින් මුදු වැලක් ඉවතට ගෙන පෙන්නුවා ය. එහි ඉතා අගනා මුදු අනූ අටක් විය. එම මුදු අනූ අටම තමා ඇසුරු කරන ලද පුරුෂයන්ගේ බවත් ඔවුන් සිහිවීමට එවා තැගි

කරන ලද බවත් කීවා ය. ඉන්පසු රජවරු දෙදෙනාත් තම තමන්ගේ මුදු ගලවා ඇයට දුන්හ. රාක්ෂයා කොපමණ රැකවරණ යොදා තමා ආරක්ෂා කළත් දූන් තමා ළඟ පුරුෂයින් සීයක් මතක් වීමට මුදු සීයක් ඇති බව කාන්තාව කීවා ය. ස්වාමිපුරුෂයින් විසින් තම භාර්යාවන් කොපමණ රැකවරණ යොදා ආරක්ෂා කළත්, භාර්යාවන් කෙසේ හෝ තමන්ගේ අදහස් මුදුන් පමුණුවා ගන්නා බව ද ඇය පැවසුවා ය. එසේම විශ්වාසවන්ත භාර්යාවක් ඇති ස්වාමියෙක් මේ ලෝකයේ සොයාගත නොහැකි බවත් කීය. රජවරුන්ට යාමට අවසර දී ඇය නැවත රකුසාගේ හිස තම උකුලේ තබා ගෙන පිරිමදින්නට වූවා ය.

මෙම සිදුවීමෙන් පසුව රජවරු දෙදෙනාගේ ම සිත් වෙනස් විය. ලෝකයේ විශ්වාස කළහැකි කිසිම භාර්යාවක් නැති බව රජවරු සිතූහ. ''මෙතරම් භයංකාර බලවත් රාක්ෂයකුටත් තම භාර්යාව සොර සැමියන්ගෙන් රැක ගන්නට නොහැකි වී ඇත. ඒ අනුව බලන කල අප දෙදෙනා රාක්ෂයාට වඩා වසනාවන්ත ය. එමනිසා අපේ භාර්යාවන්ගේ දුෂ්ඨකම් ගැන සිතා පසුතැවිලි වීමට අවශ්‍ය නැත. අපි අපේ රටවැසියන් ගැන සිතා නැවත රාජ්‍යයන් කරා ගොස් රජකම් කරමු'' යනුවෙන් දෙදෙනා කතිකා කරගත්හ.

''මලණුවනි, එහෙත් මගේ භාර්යාව විසින් කරන ලද වරදට දඬුවම් කරමි. එසේම මගේ විවාහක බිරිඳගෙන් ලැබිය යුතු විශ්වාසය කඩ නොකොට පවත්වා ගැනීමට ද උපක්‍රමයක් මා ළඟ ඇත. තව ටික දිනකින් එය ක්‍රියාත්මක වන විට ඔබටත් අසන්නට ලැබෙනු ඇත. එවිට ඔබත් එසේ කරනු ඇතැ යි මම සිතමි.'' යනුවෙන් ශෘරියර් තම මලණුවන්ට කිවේ ය. ඉන්පසු දෙදෙනාම ශෘරියර් රජුගේ මාලිගාවට පැමිණියහ.

ශාහ්රියර් රජු මාලිගාවට පැමිණි වහාම බිසව ගෙන්වා ඇය තමා ඉදිරියේ බන්දවා බෙල්ල මිරිකා මැරීමට මහා ඇමතිට අණ කළේ ය. ඇමති ද හේතු නොවිමසා ම බිසවගේ බෙල්ල මිරිකා මැරුවේ ය. ඉන්පසු පරිවාර ස්ත්‍රීන්ගේ හිස් ගසා දමා මැරීමට නියෝග කළේ ය. කිසිම ස්ත්‍රියක් විශ්වාස නොකරන බැවින් එක් රාත්‍රියකට එක් ස්ත්‍රියක් බැගින් විවාහ කර ගැනීමට රජතුමා සිතුවේ ය. එක් දිනක් එක් ස්ත්‍රියක් සමග රාත්‍රිය ගත කර පසුවදා ඇය මරා දැමීමට නියෝග කළේ ය. එවිට තමාගේ බිරිඳ සොර සැමියන්ගෙන් රැක ගැනීමට රැකවරණ යෙදීමට අවශ්‍ය නැති බව ද තමාට සැනසිල්ලෙන් සිටිය හැකි බව ද රජතුමා ප්‍රකාශ කළේ ය.

තම මලණුවන් ආපසු සිය රටට ගිය විගසම ශාහ්රියර් රජු මෙම නීතිය ක්‍රියාත්මක කළේ ය. පළමුවන රාත්‍රියේ සෙන්පතියකුගේ දියණියක් ගෙනෙන ලෙස මහ ඇමති තුමාට නියෝග කළේ ය. ඇමති තුමා ද සෙන්පතිගේ දියණිය ගෙනැවිත් රජුට බාර කළේ ය. එදින රාත්‍රිය ඇය සමග වාසය කොට පසුදින උදේ ඇගේ බෙල්ල මිරිකා මරණ ලෙස රජතුමා මහ ඇමතිට නියෝග කළේ ය. ඉතා අකමැත්තෙන් වුව ද මහ ඇමති මෙම අණ ඉටු කළේ ය. දෙවන දින රාත්‍රියේ උප සේනාපතියකුගේ දියණිය ගෙන එන ලෙස කිවේ ය. එදා රාත්‍රියේ ඇය සමග වාසය කොට පසුවදා උදේ ඇයගේ ද බෙල්ල මිරිකා මැරීමට අණ කළේ ය. රජතුමාට ඇති බිය නිසා ඇමති තුමා ද මෙම අප්‍රසන්න කාර්ය කළේ ය. තුන්වන දින ගම් වැසියකුගේ දියණියක් සමග වාසය කොට ඇය ද පසුවදා මරණයට පත් කළේ ය.

මේ අයුරින් දිනපතා ම කාන්තාවක් ගෙන්වා ගෙන රාත්‍රිය ගත කර පසුවදා ඇය මරා දැමීම දිගින් දිගට ම සිදුවිය.

රජතුමාගේ මෙම ක්‍රියාව නිසා රට වැසියෝ මහත් සේ බියට හා කම්පාවට පත්වූහ. දියණිවරුන් ඇති මව්වරු හා පියවරු මහත් ශෝකයට පත්වූහ. රට වැසියෝ මෙම දූෂ්‍ය ක්‍රියාව නිසා රජු කෙරෙහි කලකිරීමට පත් වූහ. රජතුමා දිනෙන් දිනම අපකීර්තියට පත්විය. රටවැසියන්ගේ ප්‍රශංසා වෙනුවට නින්දා අපහාස හා ශාප කිරීම් තුඩ තුඩ පැතිර ගියේ ය. තරුණියෝ මරණ බියෙන් තැති ගෙන විලාප නැගූහ. රට වැසියන්ට මොහු ඉතා නීච ක්‍රියා කරන භයන්කාර යක්ෂයෙක් ලෙස පෙණින. එහෙත් රජුගේ බලසම්පන්නකම නිසා මෙම ක්‍රියාවට විරුද්ධව නැගී සිටීමට කිසිවෙක් ඉදිරිපත් නොවූයේ ය. ඔවුන් කළ එකම ක්‍රියාව රජුට දොස් නැගීම, ශාප කිරීම, දෙවියන්ට කීම හා හඬා වැළපීම පමණක් විය.

මෙම සාපරාධී දඬුවම ක්‍රියාත්මක කරන මහා ඇමති තුමාට ද දියණිවරුන් දෙදෙනෙක් වූහ. වැඩිමහල් දියණිය ෂිහරසාදි වන අතර දෙවන දියණිය දිනර්සාදි විය. ෂිහරසාදි ඉතා එඩිතර, තීක්ෂණ බුද්ධියෙන් යුත් තරුණියක් විය. ඇය පොත පත කියවා ඉතිහාසය, කලාශිල්ප ආදිය ගැන මනා දැනුමක් ලබා තිබුණා ය. පද්‍ය හා ගද්‍ය මෙන් ම අද්භූත කතා ප්‍රබන්ධයෙන් ද ඇය අති දක්ෂ විය. කුතුහලය ඇවිස්සෙන සුළු අපූර්ව කතා ප්‍රබන්ධ කිරීමටත් ඉතා චතුර ලෙස එවා ආකර්ෂණීය ලෙස කීමටත් ඇයට මනා කුසලතාවක් තිබිණ. එකල විසූ සියලු සාහිත්‍යධරයින්ගේ ප්‍රබන්ධ අතරින් ඇගේ ප්‍රබන්ධවලට විශේෂ ස්ථානයක් හිමිවිය. තව ද ඇය මනා රූපසම්පත්තියෙන් ද යුක්ත වූවා ය. ඇගේ නැගණිය වන දිනර්සාදි ද ඉතා රූමත් එඩිතර තරුණියක් විය. මෙම සහෝදරියන් දෙදෙනා ද රටේ රජතුමාගේ දූෂ්‍ය ක්‍රියා කලාපය ගැනත්, රටේ තරුණියන්ට මුහුණ දීමට සිදුවී ඇති අප්‍රසන්න හා භයානක ඉරණම ගැනත් කෝපයටත්, කම්පාවටත්,

කළකිරීමටත් පත් වූහ. මෙම විපතින් තරුණියන් මුදා ගැනීමට ෂිහර්සාදි උපක්‍රමයක් කල්පනා කළා ය.

ෂිහර්සාදිට එක් දිනකට රජතුමාගේ බිසව වීම සඳහා ඇය පියතුමාගෙන් අවසර ඉල්ලුවා ය. මෙය ඇසූ මහ ඇමති තුමා මහත්, විමතියටත්, කෝපයටත්, ශෝකයටත් පත්විය. තම දියණිය සිහි මඳ ගතියෙන් කතා කරන්නේදැ යි ඔහුට සිතුණේ ය. ''දියණියනි, ඔබ මේ කුමක් කතා කරන්නෙහි ද? තරුණියක් අද දින රජතුමාගේ බිසව වුවහොත් හෙට උදෑසන ඇයගේ මරණය සිදුවන බව නියත ය. මගේ ආදරණීය දියණිය අද දින රජුගේ බිසව වුවහොත් හෙට ඔබ මරන්නට සිදුවන්නේ මට ය. ඉතින් මගේ දියණිය, මගේ අතින් බොටුව මිරිකා මරන්නට අණ ලැබුනහොත් මගේ සිහි විකල් වනු ඇත. ඇයි ඔබට ඒ ගැනවත් සිතන්නට බැරි ද? මට නම් ඔබේ ඉල්ලීමට අවසර දිය නොහැකි ය.'' යනුවෙන් මහ ඇමති තරයේ ම කියා සිටියේ ය.

''මගේ, ආදරණීය පියාණනි, මම මැරෙන්නට බිය නොවෙමි. මා මැරුණත් එය නිර්භීත මරණයකි. එනම් රටේ තරුණියන් වෙනුවෙන් දිවි පිදීමකි. මගේ උපක්‍රමය සාර්ථක වුවහොත් එය මුළු රටේ ම ජනතාව වෙනුවෙන් කරන පුණ්‍ය කර්මයකි. කෙසේ වෙතත් මා හෙට මැරෙන්නේ නැති බව සහතික ය. ඉතින් පියාණනි, නොබියව මගේ ඉල්ලීමට අවසර දෙන්න.'' යනුවෙන් පියාගේ දෙපා මුල වැඳ වැටී රජු සමඟ විවාහ වීමට අවසර ඉල්ලුවා ය.

''දියණියනි, ඔබ මරණයට බිය නැති බව මම දනිමි. එහෙත් මගේ අතින් ඔබගේ මරණය සිදු කිරීම මා මැරෙනවාටත් වඩා ශෝකය ගෙන දෙන්නකි. ඔබට මෙය නොතේරෙන්නේ ඇයි? තව ද, මගේ දියණිය ගෙන එන

ලෙස රජුගෙන් තවමත් අණ ලැබී නැත. ඉතින් එම අණ ලැබීමට පෙර මට ඔබව වෙනත් අයෙකුට විවාහ කර දීමට පුළුවන. ඔබ ඔබේ ම මරණයට සූදානම් වන්නේ කුමක් නිසා ද? එය මෝඩ ක්‍රියාවක් නොවන්නේ ද?'' ආදී වශයෙන් මහ ඇමති සිය දියණියට තේරුම් කර දීමට නොගත් උත්සාහයක් නැති තරම් විය. එහෙත් රටේ තරුණියන් බේරා ගැනීම සඳහා තමා පෙනී සිටින බැවින්, තමාට රජු සමග විවාහ වීමට නොදීම රටේ තරුණියන්ට තම පියා විසින් කරන විශාල අපරාධයක් බව ඇය තරයේ කියා සිටියා ය. එමෙන් ම දිනපතා තරුණියන්ගේ බොටු මිරිකා මැරීමට තම පියා කැමතිද්ද යි ෂිහර්සාදි තම පියාගෙන් ඇසුවා ය. එවිට මහ ඇමතිගේ සිත බොහෝ දුරට වෙනස් වුයේ ය. ''දියණිය, ඔබේ නිර්භීත කම ගැන මා සතුටු වෙමි. එහෙත් ඉතාම කල්පනාකාරී ලෙස වැඩ කරන්න''. යනුවෙන් කියමින් රජු හා විවාහ වීමට දියණියට අවසර දුන්නේ ය.

මහා ඇමති එදිනම ගොස් ශාෘරියර් රජතුමාට මේ පුවත දැන්වූයේ ය. මහා ඇමතිගේ දියණිය සිය කැමැත්තෙන් ම තමාගේ බිසව වීමට එන බව අසා ඔහු මහත් පුදුමයට පත් වුණේ ය. ඇයගේ සිහි විකල් වී ඇත්ද යි රජතුමා ඇසුවේ ය. මහ ඇමතිගේ දියණිය වුවත්, විවාහ කරගත් දිනට පසු දින මහ ඇමති අතින් ම මරණයට පත් කිරීමට අණ දිය යුතු බැවින් තවත් වරක් කල්පනා කරන ලෙස මහ ඇමතිට රජතුමා කීවේ ය. එහෙත් දියණියගේ බලවත් ඉල්ලීම ඉවත දැමිය නොහැකි බව ඇමති තුමා කීවේ ය.

''ඇමතියණි, අද රාත්‍රී ඔබගේ දියණිය විවාහ කරගෙන, හෙට උදේ ඇයගේ දිවි තොර කිරීමට මම ඔබට අණ කරමි. ඔබ විසින් එය කළ යුතුම ය. නොඑසේ නම් මම

ඔබගේ දිවි තොර කරීමට අණ කරමි.'' යනුවෙන් රජතුමා තවදුරටත් කීවේ ය. එවිට ද ඇමති තුමාගේ අදහස වෙනස් නොවූ බැවින් දියණිය කැදවාගෙන ඒමට රජ අණ ලැබුණි. ෂිහර්සාදිගේ මව ශෝකය දරිය නොහැකිව ක්ලාන්ත වූවා ය.

''තමා රජතුමාට පාවාදීම සතුටට කාරණයක් මිස කිසිසේත් ම කණගාටුවට කාරණයක් නොවන බව තම පියාටද මවටද කියා ඔවුන් අස්වසමින් රජතුමා බැහැදකීමට ඉතා අලංකාර වස්ත්‍රාභරණයෙන් සැරසී සූදානම් වූවාය. ඉන්පසු තම නැගණිය වූ දිනර්සාදිද තමා සමග යාමට කැඳෙව්වාය. ඇයද එයට කැමති වී සූදානම් වූවාය. එදින රාත්‍රියේ රජු හා ෂිහර්සාදි නිදන කාමරයට ළඟම ඇති කාමරයක දිනර්සාදිටත් නිදා ගැනීමට අවසර ඉල්ලා දෙන බව පැවසුවා ය. එසේ නිදාගෙන සිට පසුදා එළිවන්නට ළංවූ විට තමාට ඇසීම සඳහා රසවත් කතන්දරයක් කියන ලෙස, ෂිහර්සාදිගෙන් ඉල්ලීමක් කරන ලෙසත් නැගණියට පැවසුවාය. දිනර්සාදිද සහෝදරියගේ යෝජනාවට එකඟ වූවාය. මෙසේ කතිකා කරගෙන දෙදෙනාම රජතුමාගේ මාලිගයට ගියහ. මහ ඇමති තුමා ෂිහර්සාදි රජතුමාගේ මාලිගෙය තුලට යවා ආපසු ගියේය. ෂිහර්සාදි වෙතට පැමිණි රජතුමා ඇගේ මුහුණු වැස්ම ඉවත් කළේය. ඇගේ රූප ශෝභාව දුටු රජු මහත් සේ සතුටට පත්විය. එහෙත් හෙට දින ඇය මරණයට පත් කිරීමට නියම කළ යුතු බැවින් ශෝකයක් ද ඇති විය. මෙවිට ෂිහර්සාදි අඬන්නට පටන් ගත්තා ය. රජතුමා එයට හේතුව විමසුවෙය. තමා ඉතා ආදරය කරන එකම නැගණියට අන්තිම මොහොතේ සිප ආචාර කොට සමු ගැනීමට තදබල ආශාවක් ඇති බැවින් එදින රාත්‍රියේ ඇයටද තමා නිදන ශාලාවේම තිබෙන කාමරයක නිදාගැනීමට අවසර දෙන මෙන් ඉල්ලා සිටියාය. එදින රජු ඉතා සතුටින් සිටියේය. මේ දක්වා තමා

විවාහ කරගත් තරුණියන් සිටියේ මරණ භයෙන් වෙව්ලමින් හඬා වැලපෙමින්ය. ඔවුන් හා රාත්‍රිය ගත කිරීමෙන් රජුට කිසිම සතුටක්, බුක්ති විඳීමට නොහැකි විය. කෝපයෙන් දැවෙමින් ඉතා අසතුටු මුහුණින් යුතුව ඔවුහු රාත්‍රිය ගත කළහ එහෙත් ෂිහර්සාදි ඉතා ප්‍රීතියෙන් ප්‍රසන්න ලෙස රජු සමග අල්ලාප සල්ලාපයේ යෙදුන බැවින් ඇගේ ඉල්ලීම ඉටුකිරීමට රජතුමා කැමති වුයේය.

පසුවදා එළිය වැටෙන්නට පැයකට පමණ පෙර දිනර්සාදි අවදි වී තම සොහොයුරියට කතා කළාය. ෂිහර්සාදි සමග කතා කරන අන්තිම පැයෙහි ඇයගෙන් රසවත් කතාවක් ඇසිමට ආශාවෙන් සිටින බව දිනර්සාදි කීවාය. තම නැගණියගේ ඉල්ලීම ඉටු කිරීම ෂිහර්සාදි රජතුමාගෙ න් අවසර ඉල්ලුවාය. රජතුමා කතන්දරය ඇසීමට කැමති බැවිනුත්, ෂිහර්සාදිගේ කතා විලාශයට කැමැත්තක් දක්වු නිසාත් දිනර්ෂිදිගේ ඉල්ලීමට අවසර ලැබිණ.

ෂිහර්සාදි ඉතා රසවත් කතාවක් කීමට පටන් ගත්තාය. රජතුමාද ඉතා ආශාවෙන් මේ කතාවට ඇහුම්කන්දුන්නේය. කතාව කියා අවසන්වීමට පෙර එළිය වැටුනේය. ෂිහර්සාදි කතාව නැවැත්තුවාය. අද ඔබ මරණයට පත් වු පසු මේ අපූර්ව කතාවේ ඉතිරි ටික අසා ගන්නේ කොස්දැයි'' කියමින් දිනර්සාදි අඬන්නට වුවාය. මේ කතාවේ ඉතිරි කොටස මීටත් වඩා අපූර්ව හා රසවත් බවද අද දින පමණක් ජීවත් විමට රජතුමාගෙන් අවසර ලැබුණොත් කතාවේ ඉතිරි කොටස අද දින රාත්‍රියේ පැවසීමට හැකි බවද ෂිහර්සාදි කීවා ය. රජතුමාටද කතාවේ ඉතිරිකොටස අසා ගැනීම සඳහා ආශාවක් ඇති විය. එමෙන්ම ෂිහර්සාදිගේ කතා විලාසයටද ඔහු බොහෝ සේ ප්‍රිය කළේය. ෂිසර්සාදි ගැන අනුකම්පාවක්

ද ඇති විය. එබැවින් ෂිහර්සාදි අවසර ඉල්ලීමටත් පෙර, එදින ඇගේ මරණය සිදු නොකරන ලෙස රජතුමා අණ දුන්නේ ය. එසේ අණ දී එදින රාත්‍රියේත් තමා සමග ගත කරන ලෙසද, කථාවේ ඉතිරි කොටස ඊළඟ දින පහන් වීමට පෙර කියා අවසන් කරන ලෙසද, ෂිහර්සාදිට කිවේය.

එදින රාත්‍රියේ මහ ඇමති තුමාට හා බිරිඳට නින්දක් නොවී ය. මහ ඇමති තුමා අතින්ම තම දියණිය මරණයට පත්වන අයුරු සිතමින්, විලාප නගමින්, සුසුම් හෙළමින් රාත්‍රිය ගතකළහ. එමෙන්ම තම දෙවැනි දියණියටද මෙම ඉරණම හිමිවේදැයි සිතා තව තවත් විලාප නැගුහ. පසුදින උදේ තම දියණියගේ මරණය සිදු කිරීමට අණ නොදී රජතුමා රජ්‍ය සභාවට පැමිණෙනු දැක මහ ඇමති තුමා අතිශයින්ම පුදුමයට හා ප්‍රීතියට පත්විය. එහෙත් එදින රාත්‍රීයේත් රජතුමා තම දියණිය සමග වාසය කරන බව ඇසූ මහ ඇමති තුමා නැවතත් බිය වූයේය.

දෙවෙනි දිනයෙත් ෂිහර්සාදි රජතුමා සමග රාත්‍රිය ගත කළාය. දිනර්සාදිද ඔවුන්ගේ ශාලාවේම නිදාගත්තාය. තුන්වන දිනයට එළිවන්නට පෙර දිනර්සාදි අවධි වී සොයුරියට කතා කොට, පෙරදින කියන ලද කථාවේ ඉතිරි කොටස කියන මෙන් ඉල්ලීමක් කළා ය. එය අසා සිටි රජතුමා ෂිහර්සාදිට කතා කොට පෙර දින කියන ලද කථාවේ ඉතිරි කොටස කියන මෙන් කිවේය. තුන්වන දින එළිය වැටෙන විටද ෂිහර්සාදිට කථාව කියා නිම කිරීමට නොහැකි විය. කථාවේ අවසන් කොටස අපූර්වයි. ෂිහර්සාදි තම නැගණියට කීවා ය. රජතුමාටද කථාවේ අවසන් කොටස ඇසීමට කුතුහලයක් ඇතිවිය. ෂිහර්සාදි තුන්වන දින රාත්‍රියත් තමා සමග ගත කර ඊළඟ දිනය උදාවන්නට පෙර කතාව කියා නිමකරන ලෙස

රජතුමා අණ කළේ ය. හතරවන දිනයේ උදයේ කතාව කීමට පටන්ගත් නමුත් එළිය වැටීමට පෙර එහි අවසන් කොටස කීමට නොහැකි විය. කථාව අවසන් වන තුරු ඇසීමේ කුතුහලය නිසා එදිනද ෂිහර්සාදි නොමරණ ලෙස අණ දුන්නේය.

මේ ආකාරයට දිනපතා උදේ එළිය වැටෙන්නට පෙර ෂිහර්සාදි, දිනර්සාදිට ඇසෙන්නට කතා කීමත්, එළිය වැටෙන විට එය කියා නිමකිරීමට නොහැකි වීමත්, එවිට එදිනද ෂිහර්සාදි නොමරා රාත්‍රියේ තමා සමග ගත කිරීමට අණ දීමත් දිගින් දිගටම සිදුවිය.

මේ ආකාරයෙන් රජතුමා ෂිහර්සාදි නොමරා ඇගේ කථාව අසමින්, එක් දහස් රැයක් ගත කළේය. මෙසේ දිනපතා රසවත් කථා කියමින් රජතුමා සතුටු කිරීමේදි ෂිහර්සාදි කෙරෙහි ටිකින් ටික ආදරයක් රජු තුළ ඇති වුයේය. දිනර්සාදි කෙරෙහි ඇති අනුකම්පාවද දිනෙන් දින වැඩි වුයේය. ස්ත්‍රීන් කෙරෙහි රජතුමගේ සිත්හි තිබු වෛරය ක්‍රමක් ක්‍රමයෙන් තුනී වෙමින් පැවතුණේය. ෂිහර්සාදිගේ රූප ශෝභාවත් කථා විලාශයත්, එවායේ රසවත් බවත්, අවංක භාවයත්, එඩිතර කමත්, ප්‍රියමනාප බවත් නිසා රජතුමා තුල ෂිහර්සාදි කෙරෙහි බැඳීමක් ඇති විය. රට වැසියන් තමාට අපහස කරමින්, නින්දා කරමින්, වෛරකරමින්, බියෙන් සිටියදී තමා ළඟට අභීතව පැමිණ මහත් ආදරයෙන් කථා කියමින් තමා ප්‍රීතියට පත් කරන ලද ෂිහර්සාදි මරා දැමීම ලෝකයේම ඇති ලොකුම අපරාධය ලෙස රජුට අවබෝධ විය ෂිහර්සාදිගේ ඇසුර තමාට නැතිව බැරි බව ඔහුට හැඟෙන්නට විය. රජු අවසාන තීරණයකට එළඹුණේ ය.

දහසක් රාත්‍රීන් ඉතා ප්‍රීතියෙන් ගත කළ පසු එක්දහස්

එක් වැනි රැය අවසන් වත්ම, රජතුමා, ෂිහර්සාදි ඔහුගේ අගබිසව ලෙස තෝරා ගත්තේය. තරුණියන් මරා දැමීමේ නීතිය අවලංගු කළේ ය. ඉන්පසු තම සහෝදර ශාඃසේනත් රජුද ගෙන්වා, ඔහුට දිනර්සාදි සරණ පාවා දුන්නේ ය.

රට වැසියෝද, මහ ඇමති තුමා හා භාර්යාවද මහත් සේ සතුටට පත්වූහ. රජවරු දෙදෙනාගේ සරණ මංගල්‍ය උත්සව ඉතා අලංකාර ලෙස පැවැත්විණ. සතියක් මුළුල්ලේ රටවැසියන් ෂිහර්සාදිට ප්‍රසංශා කරමින් සැණකෙළි පැවැත්වූහ.

අරාබි නිසොල්ලාසයේ දැක්වෙන්නේ එක්දහස් එක් රැයක් මුළුල්ලේ ෂිහර්සාදි විසින් රජතුමාට ඇසෙන සේ පවසන ලද කථාවන්ය.

# ගානම්ගේ කථාව.

පුරාණ කාලයේ සිරියාවේ අගනුවර වූ ඩැමස්කස් නගරයේ අබව් අයුබ් නැමැති ඉතා පොහොසත් වෙළෙන්දෙක් සිටියේය. ඔහුට ගානම් නමැති කඩවසම් පුත්‍රයෙක්ද ඇල්කොලම් නමැති අප්‍රමාණ රූපශ්‍රීයෙන් යුත් දියණියකද වූහ. ගානම් ඉගෙනීමෙහිද අති දක්ෂයෙක් විය. අබව් අයුබ්ගේ දරුවන් තරුණ වියේ පසුවෙද් දී ඔහු මිය ගියේය. ඒ අවස්ථාව වන විට අයුබ් සතුව මහත් වස්තුවක් තිබුණේය. තවද ඉතා වටිනා රෙදි මිටි දහස් ගණනක් තිබුණේය. සෑම රෙදි මිටියකම එම රෙදි ගෙනයනු ලබන නගරයේ නම ලියා තැබීම අයුබ් සිරිතක් වශයෙන් කළේය. ඔහු මිය යන විට රෙදි මිටිවල ලියා තිබුණේ බැග්ඩෑග් නගරයේ නමය.

පියා මියගොස් ටික දිනකට පසුව ගානම් තම මෑණියන් සමග ඉදිරියට කළ යුතු දේ ගැන කතා කළේය. තම පියාගේ ව්‍යාපාරික කටයුතු ගැනද මවගෙන් ඇසුවේය. තම සැමියා බැග්ඩෑග් නගරයට වෙළෙඳාම සඳහා යාමට සූදානම්ව සිටියදී මියගිය බැවින් රෙදි මිටි සියල්ලම ගෙන යා යුත්තේ බැග්ඩෑග් නගරයට බවද ඇය පැවසුවා ය. ''එසේනම් මෙම

බඩු තොගය වහාම බැග්ඩෑග් නුවරට ගෙනගොස් විකිණිය යුතුයයි'' ගානම් කිවේය. එසේ නොකළහොත් මෙම රෙදි තොගය විකිණීමට නොහැකිව දිරායාමට ඉඩ ඇති බැවින් තමා එම ගමනට සූදානම් බව ගානම් මවට කිවේය.

ගානම් මෙසේ කී විට මව පුදුම වූවාය. තම පුත්‍රයාට වෙළදාම් කටයුතු ගැන පුරුද්දක් නැති බැවින් ඔහුට දුක් විඳීමට සිදුවේ යයි ඇය බිය වූවාය. තව ද තම ස්වාමියා නැති සොවින් වැලපෙමින් සිටියදී තම පුත්‍රයාත් තමාගෙන් වෙන්වී ඈත රටකට යාම ගැනද ඇය අසතුටු බව කීවාය. බැග්ඩෑග් නුවරට ගොස් වැඩිපුර ලාභ ලබනවාට වඩා ඩැමැස්කස් නගරයේ වෙළෙඳුන්ට මෙම බඩු විකුණා ස්වල්ප ලාභයක් ලැබීම හොඳ බවද පැවසුවාය. එහෙත් ගානම්ගේ අදහස වෙනස් කිරීමට ඇයට නොහැකි විය. රටින් රටට ගොස් ලෝකය ගැන දැනගෙන වෙළදාම් කොට දියුණුවීමට බලවත් ආශාවක් ඇති බව ගානම් තම මවට කිවේය.

කෙසේ හෝ මැණියන්ගේ අවසරය ලබාගෙන තම මැණියන් හා තම නැගණියන් වූ ඇල්කොලම්, ඩැමස්කස් නුවර සිටියදී ගානම් බැග්ඩෑග් කරා යාමට සූදානම් විය. ඔහු ශක්තිමත් වහලුන් සීයක්ද ඔටුවන් සීයක්ද මිලට ගත්තේය. ඉන්පසු වෙළඳුන් කිපදෙනෙක්ද සමග විශාල තවලමක් ලෙස ගමන පිටත් වුයේය. වහලුන් සහ මගීන් බොහෝ දෙනෙක්ද ගමනට සම්බන්ධ වූ බැවින් මග රැක සිටින කොල්ලා කන සොර සතුරන්ගෙන් උපද්‍රවයක් සිදු නොවී ගමන අවසන් කරන්නට හැකිවිය. ඔවුහු ප්‍රවේශම් සහිතව බැග්ඩෑග් නුවරට සමීප වූහ.

ගානම් තමාට නවාතැන් ගැනීමට ගෙයක් කුලියට ගත්තේය. මෙය ඉතා අලංකාර ගෙවත්තකින් යුත් සියලු සැප පහසුකම් ඇති ගෘහයක් විය. ගානම් තම බඩු තොග ප්‍රවේසම් සහිතව ගබඩාවක රැස්කර තැබුවේය. දින දෙක තුනක් ගමන් විඩාව සන්සිඳුවා ගැනීම සඳහා විවේක ගෙන ඉන් පසු තම වෙළඳාම් කටයුතු ආරම්භ කළේය.

ගානම් ඉතා හොඳින් ඇඳගෙන ලස්සන පටරෙදි මිටියක්ද රැගත් වහලෙක් සමග බැග්ඩෑග් හි වෙළෙඳුන් ගනුදෙනු කරන ප්‍රසිද්ධ ස්ථානයකට ගියේය. එහි වූ වෙළෙඳුන් විසින් ගානම් ඉතා ආදරයෙන් පිළිගන්නා ලදහ. ඒ ඒ රෙදි මිටිවල සඳහන් කර තිබූ මිල ගනන් වලටම එදින ගෙන ගිය රෙදි තොග විකුණා ගැනීමට ගානම්ට හැකිවිය. දින කීපයකින් ඔහු ගෙන ගිය රෙදි මිටි සියල්ලම විකුණා අවසන් විය. අවසාන දිනයේ ඔහු ළඟ ඉතිරිවූයේ එක් රෙදි මිටියක් පමණක් විය.

එම රෙදි මිටිය වහලා අතේ නවාතැනට යැවූ ගානම් තනිව වෙළෙඳුන් රැස්වන ප්‍රධාන ස්ථානයට ගියේය. ඔහු එහි යනවිට සල්පිල් සියල්ලම වසා තිබිණ. එක් සල්පිල් හිමියෙක් මියගොස් ඇති බැවින් සියලුම සල්පිල් අයිතිකරුවන් තම සල්පිල් වසා අවමංගල කටයුතු වලට සහභාගී වීමට ගොස් ඇති බව දැනගන්නට ලැබිණ. ගානම්ද මෙම මියගිය වෙළෙන්දාගේ අවසන් කටයුතු කරන දේවස්ථානයට ගියේය. එය බැග්ඩෑග් නුවරින් තරමක් දුරින් පිහිටි ස්ථානයක් විය. දේවස්ථානයට මියගිය වෙළෙන්දාගේ පවුලේ සියලු දෙනාත්, අසල්වැසියනුත්, පූජකවරුත් පැමිණ සිටියහ. සොහොන විවෘත කර මිණිය එහි තබා පූජකවරු කුරාන් පොතෙහි

නියමකර ඇති පරිච්ඡේද කියවමින් යාඥා කරන්නට පටන් ගත්හ. පූජකවරුන්ට යාඥා කිරීමට බොහෝ වේලාවක් ගතවිය.

එවිට රෑ බෝවීමටත් ළංවී තිබුණ නිසා ගානම්ට ඉක්මනින්ම ආපසු යාමට අවශ්‍ය විය. එහෙත් මහමදාග ම්කාරයින්ගේ අවමංගල්‍ය කෘතිය අවසන් වන්නේ රාත්‍රී ආහාරයද දීමෙන් පසු බව ඔහුට දැනගන්නට ලැබී බිය විය. පසුවදා එළිවන තුරු වෙළෙන්ඳන් එළියට නොපැමිණෙන බව දැනගත් ගානම් තවත් කැළඹීමට පත්විය.

''මා වෙනත් රටකින් පැමිණි බවත්, පොහොසත් වෙළෙන්දෙක් බවත් දූන් ප්‍රසිද්ධ වී ඇත. එබැවින් මා ගෙදර නැති විට මගේ රත්රන් හා බඩු සොරු ගෙන යනු ඇත.'' යනුවෙන් ගානම්ට කල්පනා විය. ඔහු ඉක්මනින් කෑම ටිකක් අනුභව කර තම නවාතැනට යාමට පිටත් වූයේය. රාත්‍රිය නිසා ඔහුට පාර වැරදුණේය. නගරයේ දොරටුව ළඟට පැමිණෙන විට මධ්‍යම රාත්‍රිය ද පසු වී තිබුණ බැවින් එහි දොරටුව වසා තිබිණ. එබැවින් ඔහුට එළිවන තුරු එහි රැඳී සිටීමට සිදු විය. ගානම් තමාට රාත්‍රියේ ඉතිරි කොටස ගත කිරීමට ස්ථානයක් සෙව්වේය. ඔහු අසල තිබූ සොහොන් පිටියකට ඇතුලු වී එහි සුදුසු තැනක් තිබේද'යි බැලුවේ ය. එහි උස් බිත්ති වලින් වට කරන ලද කොටුවක් වැනි කුඩා බිම්කොටසක් තිබෙණු දැක එහි ගොස් බැලුවේය. එය පවුලක මිණී වළලන ස්ථානයක් විය. එම කොටුවේ දොර ඇර තිබුණ බැවින් ගානම් එහි ඇතුල් වී දොර වසා ගත්තේය. ඔහු බිම තණ බිස්සේ දිගා වී නිදාග ත්නට උත්සාහ කළේය. එහෙත් නිදා ගැනීමට නොහැකි විය. ගානම් කීප වතාවක්ම දොර ළඟට ගොස් එය ඇර බැලුවේය.

මෙසේ බලන විට ඈතින් එළියක් එනු ඔහු දුටුවේය. ගානම් මහත්සේ බිය විය.

ගානම් වහාම කොටුව තුළ වූ තල් ගසක් මුදුනට නැග සිදුවන්නේ කුමක්දැ'යි බලා සිටියේය. වහලුන් තුන් දෙනෙක් සොහොන් භූමියට ඇතුල් වනවා ඔහු දුටුවේය. පළමුව පැමිණි වහලා අත පන්දමක් විය. අනෙක් දෙදෙනා අඩි පහක් හයක් පමණ දිග පෙට්ටියක් කර තබාගෙන පැමිණියහ. ඔවුන් ගෙන එන ලද පෙට්ටිය සොහොනෙහි දමා ආපසු යමුදැ'යි එක් වහලෙක් ඇසුවේය. එහෙත් අනෙක් වහලුන් දෙදෙනා එයට අකමැති වූහ. ''අපේ ස්වාමිදියණිය නියම කළේ මේ පෙට්ටිය සොහොන් බිමේ වළලා ඒමටය. ඉතින් මෙය වල නොදමා ගිය බව ඇයට ආරංචි වුවහොත් අපට දඬුවම් ලැබෙනු ඇත. එබැවින් පසුතැවිලි වීමට කාරණා සිදු නොවීම සඳහා අපි මෙය වළලා යමු.'' යනුවෙන් අනෙක් වහලුන් දෙදෙනා පැවසූහ. ඉන්පසු තිදෙනාම එකතු වී ඔවුන් ගෙන එන ලද ආයුධ වලින් ගැඹුරු වලක් සාදා පෙට්ටිය එහි දමා පස් වලින් වසා ආපසු ගියහ.

වහලුන්ගේ කථාව අසා සිටි ගානම්ට මෙම සිදුවීම ගැන සැකයක් ඇති විය. එබැවින් පෙට්ටියේ වටිනා දෙයක් අඩංගු විය හැකි යයි ඔහු සිතුවේය. ඔහු ගසෙන් බැස වල හාරා පෙට්ටිය පාදා ගත්තේය. පෙට්ටියට ඉබි යතුරක් දමා තිබුණේ ය. ගානම් ගලකින් ගසා ඉබියතුර කඩා පෙට්ටිය ඇරියේය.

එහි වස්තුව තිබේ යයි ගානම් සිතු නමුත් ඒ වෙනුවට දකින්නට ලැබුණේ ඉතා රූමත් කාන්තාවක් ය. පෙට්ටිය තුළ ඇත්තේ මළ මිනියක් යයි සිතා ඔහු මහත්සේ බියටත්



මවිතයටත් පත් විය. පෙට්ටියේ තිබුණේ මළ මිනියක් යයි සිතූ නමුත් තරුණිය හුස්ම ගන්නා බව ගානම් දුටුවේය. ඇගේ මුහුණ රෝස පැහැයෙන් යුක්ත විය. ඇය ඉතා වටිනා ඇඳුම් පැළඳුම් ඇඳ පැළඳ සිටියාය. ඇගේ ඉතා වටිනා දියමන්ති, මුතු, මැණික් ආදියෙන් යුත් ඇඳුම් දුටු ගානම් ඇය රජ මාළිග යේ කාන්තාවක් බව සිතුවේය. ඔහු වහාම ගොස් සොහොන් භූමියේ දොර වසා ආවේය. ඉන්පසු ස්ත්‍රීය පෙට්ටියෙන් ඉවතට ගෙන බිම වාඩි කරවූයේය. එවිට කාන්තාව ඇස් පිසදමා කිඹිසින්නට පටන් ගත්තාය. ඉන් පසු ඇය වහල් ස්ත්‍රීන් හය දෙනෙකුගේ නම් කියා අඬ ගසන්නට විය. වහල් ස්ත්‍රීන් කිසිකෙනෙක් නොපැමිණි බැවින් ඇය හොඳින් වටපිට බැලුවාය. එවිට, තමා සිටින්නේ සොහොනක බව දැන ගත් කාන්තාව මහත්සේ බිය වී කෑ ගසන්නට වූවාය. ඇය ගානම් දැක, ''මේ මොන පුදුමයක් ද?'' සොහොනෙහි වළලන ලද කෙනෙක් නැගිට සිටින්නේ කෙසේ ද?'' ''ඔබ හොල්මනක් නේද?'' යනුවෙන් නැවතත් කෑ ගසන්නට වූවාය.

ගානම් ඉතා ආදරයෙන් හා ගෞරවයෙන් යුතුව කාන්තාවට කතා කළේ ය. ඇයට උපකාර කිරීමට තමා සූදානම් බව ගානම් කීවේ ය. තව ද තමා කෙරෙහි විශ්වාසය ඇති කිරීම සඳහා තමා කව්ද යන බවත්, තමාට සිදු වූ දේ ගැනත් කීවේ ය. වහලුන් තුන්දෙනෙක් පෙට්ටියක දමා කාන්තාව ගෙන ආ සැටිත් ඔවුන් වළක් සාදා එහි පෙට්ටිය වලලා උඩින් පස් දමා ගිය සැටිත් ගානම් ඇයට කිවේය.

කාන්තාව, ගානම් ට තමාගේ ජීවිතය බේරා දීම ගැන බොහෝ සේ ස්තුති කළාය. තවදුරටත් ගානම්ගේ උපකාර අවශ්‍ය බැවින් ඇය අත්හැර නොයන මෙන් ගානම් ගෙන්

ඉල්ලා සිටියාය. නගරයට ගොස් අශ්ව කරත්තයක් ගෙනැවිත් තමා පෙට්ටියේ දමා එය ගානම්ගේ නිවසට ගෙන යන මෙන් ද ඉල්ලීමක් කළාය.

ඇය පයින් ගියහොත් ඇයගේ ඇඳුම් නගරයේ අනෙක් කාන්තාවන්ගේ ඇඳුම්වලට වඩා අලංකාර හා වටිනා ඒවා බැවින් මිනිසුන් සැක සිතීමට ඉඩ ඇති බව ද, ඇය පැවසුවාය. ගානම් ද එම ඉල්ලීමට කැමති වූයේය. ඔහු නගරයට යාමට පෙර කාන්තාව පෙට්ටියට දමා ඇයට හුස්ම ගැනීමට පහසු වන සේ පෙට්ටිය වසා පසෙකින් තබා, පස් දමා වල වසා දැමුවේය. ඉන්පසු සොහොන් භූමියේ දොර ද වසා ඉක්මනින් නගරයට ගොස් අශ්ව කරත්ත කාරයකු හමු වූයේය.

''තමා පෙරදින රාත්‍රියේ අශ්වකරත්ත කාරයකු සමග බඩු පෙට්ටියක් ද රැගෙන පැමිණි, නමුත් ඔහුට ආපසු යාමට හදිසි බැවින් මෙහි පෙට්ටිය දමා ගිය බව ගානම් අශ්වකරත්ත කාරයාට කීවේය. එසේ, පවසා පෙට්ටිය නිවසට ගෙනයාම සඳහා අශ්වකරත්ත කරුවා කැඳවාගෙන සොහොන් බිමට පැමිණියේය. ඉන්පසු පෙට්ටිය අශ්වකරත්තයේ බැඳගෙන තම නවාතැන කරා ගියේය. මෙම තරුණිය දකිනතුරු ගානම් කිසිම තරුණියකට ආලය කර නොතිබුණේය. ඔහුට තමාගේ වැඩ කටයුතු විනා තරුණියක් ගැන සිතීමට අවශ්‍ය නොවීය. එහෙත් එදින පෙට්ටිය කරත්තයෙන් පිටට ගන්නා තෙක් ඔහු ඉවසිල්ලක් නැති විය. අශ්වකරත්තය ආපසු යැවූ විගස පෙට්ටිය වහලෙකු ලවා ගෙන්වා වහාම නිවසෙහි දොර වසා පෙට්ටිය ඇර කාන්තාවගේ අතින් අල්ලා නැගිටුවා තම කාමරය තුළට කැඳවාගෙන ගියේය.

තමාගේ ජීවිතය බේරා ගැනීම ගැනත්, තමාට ආරක්ෂාව සැලසීම ගැනත් කාන්තාව නැවතත් ගානම්ට ස්තුති කළාය. ගානම්ගේ කාමරයේ ඇඳක වාඩි වූ ඇය, ගානම් කරන ලද උපකාරය ගැන කළගුණ සැලකීමක් වශයෙන් තමාගේ මුහුණෙහි වැස්ම ඉවත් කළාය. තිවසේ හෝ කාමරයේ අලංකාරය දෙස නොව, තමාට උපකාර කරන ලද තරුණයා දෙස බැලීමට කාන්තාවට ද ආශාවක් ඇති විය. ඇය ඔහු දෙසම බලා සිටියාය. කාන්තාවගේ මුහුණ වැස්ම ඉවත් කිරීමෙන් කරන ලද ගෞරවය ගැන දැනගැනීමෙන් සතුටට පත් ගානම්, ඇයගේ මුහුණේ රූප ශෝභාව දැකීමෙන් තව තවත් සතුටට පත්විය. ඔහු තුළ කාන්තාව කෙරෙහි ආලයක් ඇති විය.

ගානම්ගේ ආලය ගැන කාන්තාවට වැටහුණ නමුත් ඔහු මහත් ගෞරවයෙන් ඇයට සලකන බැවින් ඔහු කෙරෙහි බිය නොවූවාය. කාන්තාව තම කාමරයේ හිඳුවා ගානම් භෝජන ශාලාවට ගොස්, ඇයට සංග්‍රහ කිරීම සඳහා මංගල්‍ය කෑමක් සූදානම් කරන මෙන් සේවකයින්ට නියම කළේය. ඉන්පසු පලතුරු වර්ග ද, මිදි රස ද ගෙනැවිත් ඉතා අලංකාර පිඟානක තබා කාන්තාවට දුන්නේය. මංගල්‍ය කෑම පිළියෙල කරන තුරු පලතුරු අනුභව කරන මෙන් ගානම් කාන්තාවට කිවේය.

ගානම්ට ද ඇය සමඟ වාඩි වී පලතුරු අනුභව කරන මෙන් කාන්තාව ඉල්ලා සිටියාය. ගානම්ද එයට කැමති වූ බැවින් දෙදෙනාම එකතු වී පලතුරු අනුභව කරන්නට පටන් ගත්හ. මෙසේ පළතුරු අනුභව කරමින් සිටියදී. ඇඳ උඩ තිබූ ඇගේ මුහුණ වැස්මේ රන් අකුරින් යමක් ගෙත්තම් කර

ඇති බව ගානම් දුටුවේය. ඔහු එය බැලීමට කාන්තාවගෙන් ඉල්ලුවේය. ගානම්ට එහි ඇති අකුරු කියවන්නට පුළුවන් දැයි කාන්තාව ඇසුවාය. තමා වෙළෙන්දෙක් බැවින් අකුරු කියවන්නත් ලියන්නත් ඉතා හොඳින් දන්නා බව ගානම් කීවේය. ''එසේනම් මුහුණ වැස්මේ ඇතිදේ කියවන්න'' යනුවෙන් කියා කාන්තාව තම මුහුණ වැස්ම ගානම් අතට දුන්නාය. ගානම්ද එය කියෙව්වේ ය.

''මම ඔබගේය. ඔබ මගේය. ඔබ රාජපරම්පරාවෙන් පැවත එන්නෙකි'' යනුවෙන් එහි ගෙත්තම් කර තිබුණේය. මෙහි ඔබ යනුවෙන් දන්වා තිබුණේ එවකට බැග්ඩෑග් නුවර රාජ්‍ය කළ හරවුන් අල්රාසිද් කාලිප් රජතුමාය. ගානම් මේ වචන කියවූ පසු මහත් කණගාටුවට පත්වී කාන්තාවට කතා කළේය.

''කුළවත් කාන්තාවනි, මෙහි ඇති රහස් කිසිවක් මට නොවැටහෙයි. මම ඔබේ ජීවිතය බේරා දුනිමි. ඔබ හමුවූ දින සිටම මා තුළ ඔබකෙරෙහි ඇති වූ ආලය දැන්වීමට බොහෝසේ වෙහෙසුනෙමි. ඔබට ගෞරව කර, හැසිරීමෙන් ද, සැලකීමෙන් ද, නිතර ඔබට මෙහෙවර කිරිමෙන් ද, ඔබගේ සිත දිනා ගැනීමට වෑයම් කළෙමි. නමුත් ඔබ මට අයිති කර ගත හැකි නොවන බව මේ අකුරු කියවීමෙන් පසු තේරුම් ගතිමි. උතුම් කාන්තාවනි, මට සමාවන්න'' යනුවෙන් ගානම් කියන්නට වුයේය. ගානම්ගේ කථාව ඇසීමෙන් කාන්තාවගේ හිත උණු විය. ඔහුට අකමැති වනවා වෙනුවට ඇය හිත යටින් ඔහුට කැමති වුවාය. ඇගේ සිතද, ගානම්ගේ කථාව, හැසිරීම, ගුණවත්කම, හා රූප ශෝභාව නිසා ඔහු කෙරෙහි වසඟවන බව ඇයට දැනුනාය. නමුත් ඒ බව නොදන්වා, ගානම්ගේ

කථාව ගැන එතරම් සැලකිලිමත් නොවූ ලෙසින් ඇය කතා කළාය.

''ඔබ ඔපමණ කණගාටුවන බව දැනගෙන සිටියා නම් මගේ මුහුණ වැස්ම ඔබට නොපෙන්වා සිටීමට තිබුණි'' යනුවෙන් පවසා කාන්තාව තමා පිළිබඳව කථාව කියන්නට පටන් ගත්තාය. ''මම, බැග්ඩෑග් නගරයේ රජ කරන හරවුන් අල්රාසිද් කාපිල් රජතුමාගේ හිතේසි ස්ත්‍රියක් වූ පැට්නා වෙමි. මගේ නම බැග්ඩෑග්හි සියලු දෙනාම දන්නා බැවින් ඔබද දන්නවා ඇතැයි සිතමි. මා කුඩා කල සිටම වැඩුනේ රජමාලිගා වේය. එහිදී මට හොඳින් ඉගෙන ගැනීමට ලැබුණි. මගේ උගත් කමත්, යහපත් හැසිරීමත්, රූප ශෝභාවත්, නිසා කාලිප් රජතුමා මට ඔහුගේ කාමරයට යාබද කාමරය දුන්නේය. තවද මට සේවය කිරීම සඳහා ස්ත්‍රීන් විසි දෙනෙක්ද, බොහෝ පරිවාර ස්ත්‍රීන්ද, දුන්නේය. එපමණක් නොව රජතුමා මට බොහෝ තෑගි බෝග දුන් බැවින් මා ලෝකයේ සිටින සියලු බිසවුන්ට වඩා පොහොසත් විය. මේ නිසා කාලිප් රජුගේ අගබිසව වූ සොබයිදි හා ඇගේ නෑදෑ ස්ත්‍රීහු මට ඊර්ෂයා කරන්නට වූහ. රජතුමා, සොබයිදි ට කොපමණ සැලකුවත් ඇය මා විනාශ කිරිමට අවස්ථාවක් බලමින් සිටියාය. මෙතෙක් කල්, මා ඇයගේ උගුල්වලට අසුනොවූ නමුත් අද ඇගේ උගුලකට හසුවී ඇත. ඔබ නොසිටියානම් අද මා මියයන්නට පිළිවන්ව තිබුණේය. සොබයිදිගේ උගැන්වීම අනුව මහලු ස්ත්‍රීයක් පොන්සා වතුරට බෙහෙතක් දමා මට දුන්නාය. එය බිව් මට සිදුවූ කිසිදෙයක් මතක නැති විය. මා සිතන්නේ පැය හතක් අටක් ගතවන තුරු මට නින්දගොස් ඇති බවය. ඒ අවස්ථාවේ මා පෙට්ටියක දමා සොහොනේ වළලා ඇති බව දූන් මට පැහැදිලිය. කාලිප් රජතුමා පසුගිය දිනවල තමාට

විරුද්ධව කැරලි ගැසූ රජවරු මැඩපැවැත්වීමට ගිය බැවින්, සොබයිදි මා විනාශ කිරීමට ඒ අවස්ථාව යොදාගෙන ඇත.'' යනුවෙන් කාන්තාව තම විස්තරය නොනවත්වාම කියන්නට වූවාය.

''ඉතින්, මට කාලිප් රජතුමා පැමිණෙන තෙක් ඔබගේ නිවසේ නැවතී සිටීමට ඉඩ දෙන්න. එසේම මෙම සිද්ධිය රහසක් වශයෙන් රැක ගන්න. යම් විදියකින් සොබයිදි බිසවට මා ජීවත්වන බව ආරංචි වුවහොත් මගේ පණ බේරා දූන් ඔබට ද දඬුවම් කිරීමට ඉඩ ඇත. කාලිප් රජතුමා පැමිණි පසු මට සිදු වූ සියල්ල ඔහුට දැන් වූ විට නැවත මා ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු ඔහු කරනවා ඇත.'' යනුවෙන් ද පැට්නා කීවාය.

පැට්නා, තමා පිළිබඳ සම්පූර්ණ විස්තරය පැවසීම ගැන. ගානම් ස්තුති කළේය. එසේම, ඇයට ආරක්ෂාව සැලසීමටත්, රහස රැක ගැනීමටත් ඔහු පොරොන්දු වූයේය. ''මට ඔබ මුණ ගැසුන අන්දම හා ස්ථානය ගැන මගේ වහලුන් ද දන්නේ නැත. තරුණයන් විසින් වහල් ස්ත්‍රීන් මිල දී ගැනීම සාමාන්‍ය සිද්ධියක් බැවින් ඔබ ද මා විසින් මිලට ගන්නා ලද වහල් ස්ත්‍රියක් යයි ඔවුන් සිතනු ඇත. එබැවින් ඔබ බිය නොවී මෙහි රැඳී සිටින්න. රජතුමාගේ හිතෛෂී ස්ත්‍රියකට ලැබිය යුතු ගෞරවයද ඔබට මෙහිදී ලැබෙන බැවින් කණගාටු නොවී සතුටින් සිටිනු මැනව. ඔබට පුදන ලද මගේ සිත වෙනස් කිරීමට නොහැකි බව ද පැවසීමට අවසර දෙන්න. මගේ සිත ඔබට බැඳුනේ ඔබ කාලිප් රජුගේ හිතේසියක් බව දැනගැනීමට පළමුවය. එහෙත් ස්වාමියාට අයිති දේ වහලාට අයිති නැති බව මම කිසිදිනක අමතක නොකරමි. කාලිප් රජු පැමිණි පසු

ඔබ ආපසු ඔහු ළඟට යා යුතුය. එදින රජු සොබයිදීන්ගෙන් පළිගන්නා අයුරු දැකීමට මම ද කැමැත්තෙමි. ඔබ කෙරෙහි මා තුළ ඇති ආලය රජුගේ ආලයට වඩා වැඩි බව ද මම දනිමි. රජතුමා යටතට ගිය පසු මේ අවාසනාවන්ත ගානම් අමතක නොකරනු මැනවි. මම ලෝකයේ කොතනක සිටියත් ඔබට ආලය කිරීම නොනවත්වමි.'' යනුවෙන් ගානම් ද නොනවත්වාම කියන්නට වූයේය.

ගානම් තමාට බලවත් සේ ආලයෙන් බැඳී ඇති බව පැට්නාට අවබෝධ විය. එහෙත් ඒ කථාවට පක්ෂව හෝ විපක්ෂව යමක් නොකීමට ඇය අදිටන් කර ගත්තාය. ඇය කථාව වෙනත් අතකට යොමු කළාය. එදින සොහොන් පිටියේ දී ගානම් හමු නොවූයේ නම් නැවත කවදාවත් සූර්යාලෝකය බැලීමට තමාට නොලැබෙන බව සිතෙන විට, ගානම්ට එයට සෑහෙන කළගුණ සැලකීමට නොහැකි වේදෝයි සිතා කණගාටුවන බව ඇය පැවසුවාය. ගානම්ගේ කාමරය තුළදීම දෙදෙනා විසින් ආහාර ගැනීමෙන් පසු ගානම් නගරයට ගියේය. ඔහු පැට්නාට සේවය කිරීම සඳහා ස්ත්‍රීන් දෙදෙනෙකුත් වටිනා රෙදි මිටියකුත්, සුවඳ විලවුන් ආදියත් ගෙනැවිත් දුන්නේය. වහල් ස්ත්‍රීන් කාමරයෙන් ගිය පසු ගානම් නැවත තමාගේ ආලය ගැන පැට්නාට කියන්නට පටන් ගත්තේය. එවිට, ''ඔබගේ ආලය ගැන මා නිශ්ශබ්දව සිටීමට හේතුව ඔබ දන්නවා ඇතැයි සිතමි.'' යනුවෙන් පැට්නා කීවාය.

මෙය අසා ගානම් බොහෝ සේ සතුටු විය. කාලිප් රජතුමාට, පැට්නා කොපමණ ණය වී ඇත්දැයි තමා දන්නා බවත්, ''ස්වාමියාට අයිති දෙය වහලාට අයිති නැති බව''

දැනගෙන හැසිරෙන බවත් ගානම් කීවේය. රෑ බෝවෙන විට ගානම් ගොස් පලතුරු හා මිදි රස ගෙන ආවේය. දෙදෙනා එක්ව පලතුරු අනුභව කරමින් මිදි රස පානය කළහ. ගානම් තමාගේ ආලය පිළිබඳ පවසමින් ඉතා මිහිරි හඬින් ගී ගයන්නට පටන් ගත්තේය. පැට්නා ඊටත් වඩා මිහිරි හඬින් ගීත ගැයුවාය. මෙසේ බොහෝ වේලාවක් ඉතා සතුටින් ගත කළ ගානම් නිදා ගැනීමට වෙනත් කාමරයකට ගියේය. පසු දිනද ගානම් හා පැට්නා ප්‍රිය සල්ලාපයේ යෙදෙමින් ද රසවත් දේ අනුභව කරමින් ද ගීත ගායනා කරමින් ද ඉතා සතුටින් දවස ගත කළහ. මේ ආකාරයට ටික දිනක් ඔවුන් දෙදෙනා සතුටින් කාලය ගත කළහ. ගානම් වැදගත් අවශ්‍යතාවයකට හැර, පැට්නාගෙන් වෙන් වී පිටතට නොගියේය. පිටතට ගියේ පැට්නා නිදාගෙන සිටින වේලාවේදී පමණය. ගානම්ගේ ආදරය සැලකිලි නිසා පැට්නා තුළද ඔහු කෙරෙහි ආලයක් ඇති විය. දෙදෙනාට දෙදෙනාම ආලය කරන නමුත් කාලිප් රජුට ගරු කිරීමක් වශයෙන් දෙදෙනාට වෙන්ව සිටීමට සිදු විය.

පැට්නා මරණයෙන් බේරී ගානම් සමඟ සතුටින් ජීවත් වෙද්දී ඇය මැරීමට උපක්‍රම යෙදූ දින සිට සොබයිදී බිසවගේ සිත කලඹන සුළු කල්පනා හටගත් නිසා නින්ද නැතිව කල් ගෙව්වා ය. කාලිප් රජු ආපසු පැමිණි විගස පැට්නා ගැන තොරතුරු අසන බැවින් තමා ඒවාට පිළිතුරු දෙන්නේ කෙසේදැයි සිතුවාය. රජතුමාට මේ අපරාධය ගැන සැකයක් පහළ නොවන සේ රහස සඟවා ගැනීමට උපක්‍රම කල්පනා කරමින් රාත්‍රිය ගත කළාය. ඇයට කිසිම උපායක් කල්පනා නොවීය. අවසානයේ දී වෙනත් කෙනෙකුගේ උපදේශයක් ගත යුතු යැයි සිතුවාය. බාල කාලයේ සිටම

තමා හදා වඩා ගත් මහලු කාන්තාවක් ගැන ඇයට මතක් විය. පසුදා උදයෙන්ම ඇය ගෙන්වා මේ රහස ඇයට කීවාය. කාලිප් රජතුමා අසතුටට පත් නොවන ආකාරයට පැට්නාගේ මරණය ගැන ප්‍රකාශ කරන ක්‍රමයක් ගැන සොබයිදී බිසව එම කාන්තාවගෙන් ඇසුවාය. මහලු කාන්තාවද ටික වේලාවක් කල්පනා කිරීමෙන් පසු රජතුමා රැවටීම සඳහා උපක්‍රමයක් කියා දුන්නාය.

"සොබයිදී බිසවුන් වහන්ස, පළමුව පැට්නාගේ රූපයට සමාන රූපයක් ලීයෙන් සාදවන්න. ඉන්පසු එයට මෘත ශරීරයකට අන්දවන අන්දමේ ඇඳුම් අන්දවා පෙට්ටියක දමා මාලිගාව අසල සුදුසු ස්ථානයක වලලා ඊට උඩින් අර්ධ කවාකාර සොහොන් කොතක් සදවා සොහොන් ගෙයක් සාදන්න. එය කළු රෙදි වලින් වසා දිනපතාම ඉටි පන්දම් පත්තු කරන්න. ඔබ ද ඔබගේ ශෝකය ප්‍රකාශ වන අන්දමේ ඇඳුම් ඇඳ මාලිගාවේ සියලු දෙනාට ද එවැනි ඇඳුම් ඇඳිමට නියම කරන්න. කාලිප් රජතුමා පැමිණ, මාලිගාවේ සියලු දෙනා මෙසේ ශෝක ප්‍රකාශවන අන්දමේ ඇඳුම් ඇඳ සිටින්නේ මන්දැයි ඇසූ විට පැට්නාගේ මරණය නිසා ඔබ සැම ශෝක වන බව පවසන්න. තවද ඇගේ මෘත ශරීරයට සියළු ගෞරව කර තැන්පත් කර සොහොන් ගෙයක් ද සෑදූ බව කියන්න. එය අසා රජතුමා ඔබ ගැන පැහැදෙනු ඇත. සමහර විට ඇය මළ බව බොරුවක් යැයි සිතා ඔබ ගැන සැක කර මිණී පෙට්ටිය විවෘත කර බැලීමට ද ඉඩ ඇත. එසේ වුවද මිණිය දුටු විගස පැට්නා මළ බව විශ්වාස කරනු ඇත. දැන් කළ යුත්තේ රූපය කප්පවා ගැනීම ය. ඉන්පසු ඊයේ රෑ පැට්නාට පොන්ස දුන් ස්ත්‍රිය ලවා තම ස්වාමි දුව ඇඳේ මැරී සිටින බව ප්‍රචාරය කරවන්න. තවද ඇය මැරුණු බව සොබයිදී බිසවට දැන්වූ

බවත් ඇය විසින් මෘත ශරීරය වැලලීමට මැෂ්රූර්ට නියම කළ බවත් එම ස්ත්‍රිය ලවා මාලිගාවේ සියළු දෙනාටම දන්වන්න.'' ආදී වශයෙන් මහලු කාන්තාව සියලු උපදෙස් දුන්නාය. මේ ඇසූ සොබයිදී ඇය දුන් උපදෙස් හරියට පිළිපදින බව පවසා ඇයට බොහෝ තෑගිබෝග දුන්නාය.

ඉන්පසු සොබයිදී දඬුරුව සදවා මැහැල්ල විසින්ම මෘත ශරීරයකට අන්දවන අන්දමින් ඇඳුම් අන්දවා මිනී පෙට්ටියක තැබුවාය. පැට්නා මැරුණු බව මැස්රූස්ට දැන්වූ විට ඔහු පැමිණ සිරිත් පරිදි අවමංගල්‍ය කටයුතු සිදු කළේය. පළමුව පැට්නාට පොන්සා දුන් ස්ත්‍රිය අඬන්නට පටන් ගත්තාය. එවිට සියළුම ස්ත්‍රිහු අඬන්නට පටන් ගත්හ. ඉන්පසු වාසල ගෙවල් සාදන්නා ගෙන්වා සොහොන් කොත ද සොහොන් ගෙයද සෑදෙව්වාය. රජමාළිගයේ සියළු දෙනාම දුක් ප්‍රකාශ වන අන්දමට ඇඳුම් ඇඳ ගත්හ. රටේ සෑම තැනම පැට්නාගේ මරණය ගැන ආරංචි විය.

දිනක් පිටතට ගිය ගානම්ට ද මෙම මරණය ගැන අසන්නට ලැබුණේය. මෙම ආරංචිය ඇසුණු ගානම් බොහෝ සතුටු විය. ඔහු වහාම පැට්නා ළඟට ගොස්, මෙම ආරංචිය කීවේය. පැට්නා ජීවතුන් අතර නැති බව සොබයිදී බිසව ඇතුලු රටේ සියලු දෙනාම විශ්වාස කරන බැවින් පැට්නාට ආරක්ෂාව සහිතව සිටිය හැකි බව ද ප්‍රකාශ කළේය. මේ ඇසූ පැට්නා, ''සොබයිදී බිසව දැනට ජය ලබා තිබෙන බව පෙනේ. ඈ ඇගේ වරද සඟවා ගැනීමට යොදන ලද උපක්‍රමය ගැනද පුදුම නොවෙමි. එහෙත් කාලිප් රජු පැමිණි විගස සිදුවූ සියල්ල ගැන ඔහුට දැනුම් දීමට මාර්ගයක් සොයා ගනිමු. එවිට ඇගේ විජයග්‍රහණය සමග ම මහත් දොම්නසක් ඇති වනු

නොඅනුමානය. එබැවින් මා ජීවත් වන බව දැන ගත හොත් අප දෙදෙනාටම මහත් විපත්ති වනු ඇත.''යි ගානම්ට කීවාය.

කාලිප් රජතුමා අසල්වැසි කැරලිකාර රජවරුන් මැඩපවත්වා ජයග්‍රහණය කර තුන්මසකට පසු බැග්ඩෑග් නුවරට පැමිණියේය. ඔහු මහත් සතුටින් පැට්නා වැළඳ ගැනීමේ නොඉවසිලි භාවයෙන් සිටියේය. එහෙත් මාලිගාවට ඇතුල්වන විට මාලිගාවේ සියළු දෙනාම ශෝක ප්‍රකාශ කිරීමේ ඇඳුම් ඇඳගෙන සිටිනු දැක කාලිප් රජතුමා පුදුම වූයේය. ඔහු සොබයිදීගේ කාමරයට යන විට ඇය ද ස්ත්‍රීන් ද දුක් ප්‍රකාශ කිරීමේ ඇඳුම් ඇඳගෙන තමා ඉදිරියට පැමිණෙනු දැක තවත් පුදුම වූයේය. මෙසේ දුක් වන්නේ කුමක් නිසාදැ'යි රජතුමා සොබයිදීගෙන් ඇසුවේය. මාලිගයේ සියලු දෙනා දුක් වන්නේ පැට්නාගේ මරණය නිසා බව බිසව කීවාය. මේ ඇසූ රජතුමා දුර්වල හඬින් කෑ ගසා ක්ලාන්ත විය. මඳ වේලාවකින් ක්ලාන්තය සුව වූ වහාම පැට්නාගේ මෘත ශරීරය වැලලූ ස්ථානය කොහිදැයි ඇසුවේය. සොබයිදී ඇය වැලලූ ස්ථානය දන්වා මහත් වැයමක් දරා එහි සොහොන් කොතක් සහ සොහොන් ගෙයක් සෑදූ බවද පැවසුවාය. රජතුමා මොහොතක්වත් ප්‍රමාද නොවී මැස්රූර් සමඟ සොහොන බැලීමට ගියේය. පැට්නාගේ සොහොන් ගෙයි තබන ලද ඉටි පන්දම් එළියද, කොතෙහි අලංකාරය ද දුටු රජතුමා පුදුම විය. එහෙත් පැට්නාට ඊර්ෂ්‍යා කරන සොබයිදී තමා නැති අවස්ථාවේ ඇය මාලිගයෙන් පන්නා දමා බොරුවක් කරන්නට ඇතැයි ද, රජතුමාට සැකයක් පහළ විය.

සොහොන් ගෙය බිඳ හෙළා වල හාරා පෙට්ටිය පිටතට ගෙන එය ඇරීමට කාලිප් රජතුමා සේවකයින්ට නියම කළේය.

මිනී ඇඳුම් අන්දවා තිබූ දඬු රුව දුටු රජතුමා තවදුරටත් පරීක්ෂා නොකළේය. මියගිය කාන්තාවකගේ ශරීරය අතගෑම ආගමට විරුද්ධ දෙයක් බැවින් රජතුමා එසේ නොකළේය. පැට්නා මිය ගොස් ඇති බව විශ්වාස කළේය. මිනී පෙට්ටිය වසා තිබුණ ආකාරයටම වලලා නැවත සොහොන් ගෙය සෑදීමට සේවකයින්ට නියම කළේය.

තම හිතේසි ස්ත්‍රියගේ මරණය ගැන මහත් සේ කණගාටුවට පත් වූ රජතුමා දේවගැතියන් ද මාළිගාවේ මුලාදෑනින් ද, කුරාන් පොත් කියවන්නන්ද ගෙන්වීමට පණිවිඩ යවා ඔවුන් එනතුරු හඬමින් සොහොනෙහි සිටියේය. සියළු දෙනාම එකතුකර යාඥා පවත්වා කුරාන් පොත් කියවන්නන් ලවා පරිච්ඡේද කීපයක්ම කියෙව්වේය. මාසයක් යන තුරු දිනපතා අවමංගල්‍ය වතාවත් සෑම දාම උදේ සවස කළේය. රජතුමා කිසිම කටයුත්තක නොයෙදී මාසයක් යන තෙක්ම ඇඬූ කඳුලින් ගත කළේය. මාසයක් සම්පූර්ණ වන දිනයේ උදේ සිට පසුවදා එළි වන තෙක් යාඥා කිරීම හා කුරාන් පොත කියවීම සිදු කළේය.

මෙහිදී රාත්‍රි නොනිදා සිටීම නිසා වෙහෙසට පත් වූ රජතුමා පසුදා විවේක ගැනීම සඳහා නිදා ගත්තේය. රජතුමාට පවන් සැලීම සඳහා හිස පැත්තෙනුත් පා පැත්තෙනුත් ස්ත්‍රින් දෙදෙනෙක් වූහ. රජතුමාට නින්ද ගොස් ඇතැයි සිතූ එක් ස්ත්‍රියක් අනෙක් ස්ත්‍රියට කතා කොට රහසක් කීවාය. එනම් පැට්නා මරණයට පත් නොවී සජීපයෙන් ජීවත් වන බවය. අනෙක් කාන්තාව එය අසා මහත් සේ ප්‍රීතියට පත්ව "අහෝ දෙවියනි, රූපයෙන් හා යහපත් ගතිගුණ වලින් අගතැන්පත් වූ පැට්නා ජීවතුන් අතර සිටීද"? යි කියමින් ශබ්ද නගා කෑ

ගැසුවාය. ස්ත්‍රියගේ කෑ ගැසීම නිසා රජතුමා අවදි විය. මෙසේ ශබ්ද කිරීමට හේතුව කිමෙක්දැ'යි ඇසුවේ ය. පැටිනා තවමත් ජීවතුන් අතර සිටින බව දැන ගැනීම නිසා ප්‍රීතිය මැඩපවත්වා ගැනීමට නොහැකිව කෑ ගැසූ බව ස්ත්‍රිය කීවාය.

රජතුමා පුදුමයට පත්විය. ''ඇය නොමළ බව ඔබලා දන්නේ කෙසේ ද? ඇය නොමළා නම් ඇයට සිදු වූයේ කුමක්ද? '' යනුවෙන් රජතුමා ඇසුවේය. පැටිනාගේ අත් අකුරින් ලියන ලද ලිපියක් නාඳුනන අයෙක් ගෙනැවිත් දුන් බවත් රජතුමා මහන්සි වී සිටින බැවින් මදක් විවේක ගත් පසුව එය දීමට සිතා සිටි බවත් ස්ත්‍රිහු පැවසූහ. ලිපිය තමාට දීමට ප්‍රමාද කිරීම ගැන තදින් දොස් නගා වහාම ලිපිය ගෙනැවිත් දෙන ලෙස රජතුමා ස්ත්‍රීන්ට කීවේය. ස්ත්‍රීහු ද වහාම ලිපිය රජතුමාට දුන්හ. රජතුමාද නොඉවසිල්ලෙන් යුතුව ලිපිය කියවන්නට වූයේය. පැටිනා තමාට සිදුවූ සියල්ල එහි විස්තර කර තිබිණ. එහෙත් ගානම් ගැන ප්‍රමාණයට වඩා ලියා තිබෙනු දැක රජතුමා ඊර්ෂ්‍යා කළේය. සොබයිදී විසින් කරන ලද අපරාධය ගැන කෝප වනවා වෙනුවට අහිංසක පැටිනා ගැන කෝප විය. ''මා ආපසු පැමිණ මාසයක් ගත වන තුරුත් පැටිනා ඇය ජීවත්ව සිටින බව දන්වා සිටීමට අතපසු කර ඇත. මා ඇය නැති ශෝකයෙන් හඬා වැළපෙමින් සිටියදී ඇය ගානම් නැමැති වෙළෙන්දෙකු සමග භාරමාසයක් ජීවත් වී ඇත. එපමණක් නොවේ, ඇය කිසි විලි බියක් නැතිව වෙළෙන්දා ඇයට ආදරයෙන් සලකන බව අගය කරමින් ලියා ඇත. මා ආදරය කරන පැටිනා මට ද්‍රෝහී වී ඇත. මට ද්‍රෝහිකම් කරන වෙළෙන්දාගෙනුත්, පැටිනාගෙනුත් මම පළිගනිමි.'' යනුවෙන් රජතුමා සිතුවේය.

ඉන් පසු රජ්‍ය සභාව කැඳවා යසාපර් නැමැති මහ ඇමතිතුමාට කථා කළේය.

"ඇමතියනි, මම දූන් ඔබට වැදගත් කාරණයක් සිදු කිරීමට නියම කරමි. මුරකරු හේවායන් හරසීයයක් සමඟ ගොස් ගානම් නමැති ඩැමස්කස්හි වෙළෙන්දාගේ නිවස බිමට සමතලා කරනු. එයට පෙර ගානම් සහ පැට්නා අල්වාගෙන එනු." යනුවෙන් අණ කළේය.

මහ ඇමතිද හේවායන් සමඟ ගානම් සොයන්නට පටන් ගත්තේය. ඔහු පිට රට වෙළඳුන් පැමිණ වෙළඳාම් කරන ස්ථානයේ කළමනාකරු හමුවීමට ගියේය. ඩැමස්කස් නගරයෙන් පැමිණි ගානම් නමැති වෙළෙන්දෙකු ගැන දන්නේ දැයි ඔහුගෙන් ඇසුවේය. ගානම් බොහෝ දිනකින් වෙළඳ පොළට පැමිණියේ නැති බවත්, ඔහු මේ ප්‍රදේශයේ සිටින්නේ නම් නිවසෙහිම සිටින්නේ කුමක් නිසාදැයි නොදන්නා බවත් කළමනාකරු කීවේය. එහෙත් ගානම් පදිංචි වී සිටින ස්ථානයට යන මාර්ගය යසාපර්ට කියා දුන්නේය. මහ ඇමතිද, විනිශ්චයකාරයාද, සේවක පිරිසද ගොස් ගානම් ගේ නිවස වටලා ගත්හ.

එවේලෙහි පැට්නා සහ ගානම් ආහාර අනුභව කරමින් සිටියහ. කවුළුව ළඟින් ශබ්දයක් ඇසී බලන විට මහ ඇමති හා පිරිස පැමිණෙනු පැට්නා දුටුවාය. ඔවුන් පැමිණෙන විලාශයෙන් යහපතක් සිදු නොවන බව පැට්නාට අවබෝධ විය. තමා යවන ලද ලිපියට හොඳ පිළිතුරක් ලැබේ යයි සිතූ නමුත්, ඊර්ෂ්‍යාවන්ත රජතුමා ගානම් ගැන කෝපවී ඇතැයි ඇය සිතුවාය. තමාට කාලිප් රජුගෙන් වරදක් වේ යයි ඇය කෙසේවත් සිතුවේ නැත. එහෙත් ගානම්ට වරදක්

කරනු ඇතැයි සිතා බියෙන් වෙව්ලන්නට වූවාය. මහ ඇමති සහ පිරිස ආයුධ අමෝරාගෙන මෙහි පැමිණෙන බවත්, ඔවුන් එන්නේ තමා හා ගානම් අල්ලා ගැනීමට බවත් පැටිනා ගානම්ට කීවාය. ගානම් ද කවුළුවෙන් බලන විට මුරකරු භේවායන් හෙල්ල ඇදගෙන මහ ඇමති හා විනිශ්චකාර තැන පෙරටු කොටගෙන එන විලාශය දැක බියෙන් වෙව්ලන්නට විය. ඔහු බියපත්ව කථා කරගැනීමට නොහැකිව සිටියේය. එවිට පැටිනා කථා කළාය.

''ගානම් දූන් ඔබ වාහම වහලෙකුගේ ඇඳුම් ඇඳගෙන, මුහුණෙත් අත්වලත් දැලි කුණු තවරාගෙන පිඟන් ටිකක් හිස තබාගෙන කුස්සිය දෙසට යන්න. එවිට මහ ඇමති ඇතුළු පිරිස ඔබ භෝජන ශාලාවේ වහලෙක් යැයි සිතා යන්නට ඉඩ හරිනු ඇත. ස්වාමියා කොහේද'යි ඇසුවොත් පැකිලීමකින් තොරව ඔහු ඇතුළේ සිටින බව කියන්න.'' යනුවෙන් ගානම්ට කීවාය. ''මා පමණක් ප්‍රවේශම් වී ඇත්ද? එවිට ඔබට කුමක් සිදුවේද?'' යි ගානම් ඇසුවේය.

''මා ගැන බිය නොවන්න. මේ නිවසේ ඇති සියළු දේ ප්‍රවේශම් කරගෙන සිට කාලිප් රජුගේ කෝපය සංසිඳුණු පසු ඔබේ භාණ්ඩ සියල්ල ඔබට භාර දී මම රජු වෙත යමි.'' යනුවෙන් පැටිනා කීවාය. ගානම් ට බලා සිටීමට වේලාවක් නැති බැවින් ඉතා ඉක්මනින් වෙස් මාරු කරගන්නා ලෙස ඇය බල කළාය. ඔවුහු ඉතා ආදරයෙන් සිප වැළඳ ගත්හ. ගානම් වහාම වහලෙකුගේ වෙස් ගත්තේය. එවිටම දොරට තට්ටු කරන ශබ්දයක් ඇසිණ. වහාම ගානම් පිඟන් ටික හිස තබා ගෙන පිටවී ගියේය. මහ ඇමතිට ඔහු හමුවූ නමුත් තමා සොයන පුද්ගලයා ඔහු නොවන බව සිතා ගානම්ට

යාමට ඉඩ හැරියේය. ගානම් ඉතා ඉක්මනින් නුවර දොරකින් පිටවී ගියේය. මහ ඇමති ගානම් සොයමින්, පැට්නා වාඩිවී සිටි කාමරයට පැමිණියේය. එහි ගානම්ගේ ඇඳුම් පුරවන ලද පෙට්ටිය ද මුදල් ද තිබුණේය. මහ ඇමතිතුමා දුටු පැට්නා ඔහුගේ දෙපා මුල වැඳ වැටුණේය. ''මාගේ ස්වාමිනි, කාලිප් රජතුමා විසින් නියම කරන ලද ඕනෑම දඬුවමක් විඳීමට මම සූදානම්ව සිටිමි. ඔබ විසින් එය මට දෙනු මැනවි.'' යනුවෙන් පැට්නා කියා සිටියාය. තමා ඇයට කිසිම හානියක් සිදු නොකරන බවත්, රජතුමා අණ දුන්නේ පැට්නා සහ ගානම් ඔහු ළඟට කැඳවාගෙන යාමට පමණක් බව මහ ඇමති කීවේය. ''හොඳයි, ඇමතිතුමනි අපි යමු. ගානම් නමැති මගේ පණ බේරා දුන් වෙළෙන්ඳා දනට මාසයකට පමණ පෙර ඩැමස්කස් නගරයට යන බව කියා ගිය නමුත් තවම පැමිණියේ නැත. ඔහුගේ මෙම පෙට්ටි මා භාරයේ තබා ඇති බැවින් ඒවා ආරක්‍ෂා කර දීම මගේ යුතුකමය. එබැවින් ඒවා මාලිගාවට ගෙන ගොස් ආරක්ෂා කර දෙන මෙන් ඉල්ලමි.'' යනුවෙන් පැට්නා ඉල්ලා සිටියාය. පැට්නාගේ නිවැරදි බව මහ ඇමතිතුමාට තේරුණු නමුත් රජ අණ අනුව ගානම්ගේ නිවස පොළොවට සමතලා කළ යුතුය. මහ ඇමති තුමා පැට්නාට අනුකම්පා කොට ඇගේ ඉල්ලීම පමණක් ඉටු කිරීමට සිතුවේ ය. ඒ අනුව ගානම්ගේ පෙට්ටි සියල්ල මන්සූර් නැමැති මුලාදෑනියාගේ නිවසට ගෙන යාමට අණ කළේය. මෙහෙකරුවන් පෙට්ටිය ගෙන ගිය පසු, පැට්නාගේ වචනය විශ්වාස නොකොට තවදුරටත් නිවස පුරා ගානම් සොයන්නට පටන් ගත්තේය. නමුත් ගානම් සොයා ගත නොහැකි විය. ගානම්ගේ නිවස පොළොවට සමතලා කොට මහ ඇමති, පැට්නා කැඳවාගෙන රජතුමා හමුවට ගියේය.

මහ ඇමතිතුමා මාලිගයට පැමිණ රජතුමා හමුවූයේය. ''නුඹ මගේ අණ ඉෂ්ට කළෙහි ද'' යි රජතුමා ඇසුවේය.

''එසේය, ස්වාමිනි, ගානම් පදිංචි වී සිටි නිවස බිඳහෙලා බිමට සමතලා කළෙමි. ඔබ වහන්සේගේ හිතේෂී ස්ත්‍රිය වන පැට්නාද කැඳවාගෙන පැමිණියෙමි. ගානම් නමැති වෙළෙන්දා නම් සොයා ගත නොහැකි විය. ඔහු මසකට පෙර ඩැමස්කස් නුවරට ගිය බව පැට්නා පවසන්නේය.'' යනුවෙන් ඇමතිතුමා කීවේය. ගානම් අල්ලා ගැනීමට නොහැකි වීම ගැන රජතුමා බලවත් සේ කෝපයට පත්වීය. හිතෙසි ස්ත්‍රිය පැට්නා ද තමාට බොරු කියා ඇති බැවින් ඇය සමග කතා කිරීමටද නොකැමති වූයේය. ඉන්පසු මැස්රූර් නමැති සේවකයාට කථා කොට තමාට ගුණමකුකම් හා ද්‍රෝහි කම් කරන ලද පැට්නා ගෙන ගොස් අන්ධකාර සිරගෙයි දමා වසන ලෙස අණ කළේය. මාලිගාවට නුදුරින් තිබුණු එම සිරගෙය රජතුමා අසතුටු කරවන හිතෙසි කාන්තාවන් දමන ස්ථානයක් විය. මැස්රූර් ද පැට්නා ගැන අනුකම්පාවක් ඇති වූ නමුත් රජ අණ ඉටු කළ යුතු බැවින් අකමැත්තෙන් වුවද පැට්නා ගෙන ගොස් අන්ධකාර සිරගෙය තුළට දමා වැසුවේය. තමාට මහත් සේ ආදරය කරන ලද රජතුමා කතා කරනවා විනා තමා දෙස බැලුවේවත් නැතිව දෙන ලද දඬුවම ගැන බලවත් සේ පැට්නා ශෝක වූවාය. ඇය අඬා වැළපෙමින් සිරගෙය තුළ කාලය ගත කළාය.

රජතුමා පැට්නාට දඬුවම් නියම කිරීමෙන් පසුව ගානම් අල්ලා ගැනීමට උපක්‍රම යෙදුවේය. ගානම් ඩැමස්කස් බලා ගිය බව දැනගත් රජතුමා එහි රජ කරන තමාගේ මස්සිනා වන සිනිබ් රජතුමාට ලියුමක් ලිව්වේය. (සිනීබ රජතුමා

කාලිප් රජතුමාට කප්පම් දී රාජ්‍ය කරන්නෙක් බැවින් කාලිප් රජුගේ ඉල්ලීම ඉටු කිරීමට බැඳී සිටියේය.) ගානම් නමැති වෙළෙන්දෙක් තමාගේ හිතෙසි රූමත් කාන්තාවක් තමාගෙන් වෙන්කර ගැනීමට උත්සහ කර දූනට ඩැමස්කස් හි සැඟවී සිටින බව ආරංචි වී ඇති බැවින් ඔහු අල්ලා විලංගු දමා තුන් දවසක් කකුල්වලට පාර පනහ බැගින් තලා නගරයේ සෑම තැනම ඔහු ප්‍රදර්ශණය කර මුරකරුවන් සමඟ තමා ළඟට එවන මෙන් කාලිප් රජු සිනිබි රජුට ලියා යැවුවේය. එසේම, ''ඔහුගේ නිවස බිඳ දමා පොළවට සමතලා කරන ලෙස ද ඔහුගේ මව, පියා, සහෝදර සහෝදරියන්, දූ දරුවන් සියළු දෙනා නගරයේ සියළු දෙනාට ප්‍රදර්ශණය කොට ඔවුනට වාසය කිරීමට නිවසක් දෙන අයෙක් සිටී නම් ඔවුන් ද මරණ බව ප්‍රකාශ කරනු.'' යනුවෙන් ද ලීවේය. ලියුම ලියා අවසන් කළ රජතුමා විශේෂ පණිවිඩ කරුවෙකු අත එය සිනීබ් රජුට යැව්වේය. කාලිප් රජුගේ හසුන ලද විගස එය කියවා බැලූ සිනීබ් රජු තමා එම හසුනේ සඳහන් අන්දමට සියළු කටයුතු කරන බවට සඳහන් කරමින් පිළිතුරු හසුනක් එව්වේය. ඉන් පසු විනිශ්චකාරවරයාද, වාසල මුලාදෑනි ද සමඟ හේවායින් ද සමඟ රජතුමා ගානම්ගේ නිවස වෙත ගියේය.

ගානම් වෙළඳාම සඳහා බැඩ්ඩෑග් බලා ගිය දා සිටම ඔහුගේ මැණියන්ට ඔහුගෙන් ලියුමක් නොලැබුණේය. පුතා ගැන කිසිම තොරතුරක් නොලැබුණ බැවින් ඔහු මිය යන්නට ඇතැයි මැණියන් සිතුවාය. කිසිම මවක් දුක් නොවන තරමට ඇය තමාගේ පුත්‍රයා ගැන දුක් වූවාය. ඇයත් ගානම්ගේ නැගණියත් දුක ප්‍රකාශ කිරීම සඳහා කළු ඇඳුම් ඇඳගෙන හැඬූ කඳුලින් දවස් ගෙවූහ. ගානම්ගේ මව ඇගේ ගේ ඉදිරිපිට සොහොන් ගෙයක් සාදවා ගානම්ගේ රූපයට

සමාන රූපයක් සාදා එය කළු රෙදි වලින් වසා ගානම්ගේ මෘත ශරීරය එහි තැන්පත් කර ඇති බව සලකමින් දවසේ වැඩිපුර කාලයක් සොහොන්ගෙය තුළට වී හඬමින් කාලය ගත කළාය. ගානම්ගේ නැගණිය ද මව මෙන් ශෝකයෙන් කල් ගත කළාය.

මෙසේ සිටියදී සිනිබ් රජු හා පිරිස ගානම් සෙවීම සඳහා ඔහුගේ ගෙට ඇතුළු වූහ. ගානම්ගේ නිවසේ සිටි වහල් ස්ත්‍රිය රජතුමා ඇතුළු පිරිස දැක බිය වූවාය. රජතුමා සොයන ගානම් මළ බවත් ඔහුගේ මව ගානම්ගේ සොහොනේ වැළපෙමින් සිටින බවත් ඇය කීවාය. වහල් ස්ත්‍රියගේ කීම නොපිළිගත් රජතුමා ගානම් සිටීදැයි නිවසේ සෑම තැනම පරීක්‍ෂා කිරීමට සේවකයන්ට අණ දුන්නේය. එහෙත් ගානම් සොයාගත නොහැකි විය. ඉන්පසු රජතුමා සොහොන් ගෙය ළඟට ගියේය. සොහොන් ගෙය තුළ කඳුලු පිරි දෙනෙතින් යුතුව පැදුරක වාඩි වී ශෝක වෙමින් සිටින මවත් දියණියත් සිනිබ් රජු දැක ඔහුට වැඳීමට ඉදිරියට පැමිණියහ. එවිට රජතුමා ගානම් සිටින්නේ කොහොදැයි මවගෙන් විමසුවේය.

"දේවයන් වහන්ස, මගේ ආදරණීය පුත්‍රයා මැරී බොහෝ කල් ගත වී ඇත. මගේ පුතාගේ මෘත ශරීරය මගේ අතින් පෙට්ටියක බහා ඔහුගේ ඇට කටුවක්වත් ළඟ තබා ගැනීමට මට දෙවියන් වහන්සේගෙන් පිහිටක් නොලැබුණේය. ඔහු මා තරම් අවාසනාවන්ත මවක් මේ ලොකේ තවත් සිටීද? අනේ මගේ පෙම්බර පුතා." කියමින් අඬන්නට වූවාය. ඇයට තවදුරටත් කථා කරගත නොහැකි විය. බලවත් ශෝකයෙන් වැළපෙන ගානම්ගේ මෑණියන් කෙරෙහි සිනිබ් රජුට අනුකම්පාවක් ඇති විය. සිනිබ් රජතුමා ඇතුළු සියළු දෙනාම

ගානම් මිය ගොස් ඇති බව සිතුහ. කෙසේ වුවද කාලිප් රජුගේ අණ අකමැත්තෙන් හෝ පිළිපැදීමට සිනීබ් රජුට සිදුවිය. ඔහු ගානම් ගේ මෑණියන්ට හා නැගණියන්ට ගානම්ගේ සොහොන් ගෙයි සිටීම ප්‍රවේශම් සහිත නොවන බැවින්, එය අතහැර තමා සමග මාලිගයට පැමිණෙන ලෙස කීවේය. තමාගේ සලුවෙන් ඔවුන් දෙදෙනා වසා තමාට නුදුරින් යාමට නියම කළේය. රජු සමඟ පැමිණි මුරකරුවන් හා සේවකයින් ගානම්ගේ නිවසේ තිබූ සියළු වස්තුව කොල්ල කා ගත්හ. ඉන්පසු ගේ බිඳ දමා බිමට සමතලා කළහ. සිනීබ් රජතුමා ගානම්ගේ මව සහ නැගණිය තම මාලිගාවට ගෙන ගොස් කාලිප් රජුගේ ආඥාව ඔවුන්ට දනුම් දුන්නේය. ගානම්ගේ මව සහ නැගණිය තමන්ට සිදු වූ විපත ගැන අතිශය පුදුමයටත් දුකටත් පත් වූහ. තුන් දවසක් මේ කාන්තාවන් දෙදෙනා මිනිසුන්ට දක්වීමට කාලිප් රජු අණ දී ඇති බවත්, මෙවැනි කෲරතර දඬුවමක් ක්‍රියාත්මක කරන්නේ ඉතා අප්‍රසන්න භාවයකින් බවත්, මෙම කාර්යය ඉටු නොකළොත් තමාට සිංහාසනයෙන් ඉවත් වීමට සිදුවන බවත් සිනීබ් රජු ප්‍රකාශ කළේය. ඔහු තමාට හැකි තරම් දඬුවම ලිහිල් කළේය.

පසු දින ගානම් ගේ මව ට සහ නැගණිය ට අප්ලොම් වලින් සාදන ලද ඇඳුම් අන්දවා, කේශ කලාපයන් උනා පිට දිගට හෙලා විනිශ්චයකාරයා සහ මුලාදෑනීන් සමග නගරයේ ගෙන යනු ලැබූහ.

''කාලිප් මහ රජු අසතුටු කරන ලද අයට දෙන දඬුවම මේය'' යි වරින් වර කෑ ගසමින් සේවකයන් පිරිසක් ඉදිරියෙන් ගමන් කළහ. අත්වලත් කකුල් වලත් කිසිම වැස්මක් නැතිව කෙස් වලින් මුහුණු වසාගෙන ගමන් ගත්තා මව සහ දියණිය

දුටු සැමගේ නෙත් කඳුලින් තෙත් විය. මෙම ස්ත්‍රීන්ගේ නිර්දෝෂී කමත්, දියණියගේ රූපශ්‍රීය හා තරුණ කමත් දුටු සියලු දෙනා මහත් සේ දුක් වූහ. ඔවුන් තම තවත්ගේ නිවෙස් ළඟින් යන විට කාන්තාවන් රජුට ශාප කරමින් සෝෂා කරමින් අඬන්නට වූහ. එවිට කුඩා ළමයින් ද අඬන්නට වූහ. නගරය මළ ගෙදරක් මෙන් විය. රෑ බෝවී එන විට ගානම් ගේ මව සහ නැගණිය සිනීබ් රජුගේ මාලිගාවට ගෙන යනු ලැබූහ.

පාවහන් නොමැතිව පයින් ඇවිදීමට නුපුරුදු කාන්තාවන් දෙදෙනා අධික ලෙස වෙහෙසට පත් වී සිටියහ. මේ දෙදෙනා මාලිගාවට ගිය විගස ක්ලාන්ත වී බොහෝ වේලාවක් සිටියහ. ඔවුන්ට කිසිම සැපයක් නෙ දෙන ලෙස කාලිප් රජු අණ කර තිබුණ නමුත්, සිනීබ් රජුගේ බිසව එසේ නො කළහ. ඇය මෙම කාන්තාවන් දෙදෙනාට කෑම වර්ගත්, මිදි රසත් දුන්නාය. ඔවුන්ගේ සේවයට ස්ත්‍රීන් දෙදෙනෙකුද යැව්වාය. ගානම් ගේ මව, මෙම සැලකීම් ගැන සිනීබ් රජ බිසවට බොහෝ සේ ස්තුති කළාය. ඉන්පසු ගානම්ගේ මව, සේවිකාවකට කථා කළා ය.

''උතුම් ස්ත්‍රීය, සිනීබ් රජතුමා විසින් අපට මෙසේ දඬුවම් කරන්නේ කුමක් නිසාදැ යි නොදන්නෙමු. අප විසින් කරන ලද අපරාධය කුමක් ද?'' යනුවෙන් ඇසුවා ය.

''යහපත් ස්ත්‍රිය, ඔබලා මෙසේ දඬුවම් විඳීමට හේතුව ගානම් ය. ඔහු කාලිප් රජුගේ හිතේසි කාන්තාවන් අතුරින් ඉතාම රූමත් කාන්තාව වන පැට්නා සොරකම් කිරීම ගැන වැරදිකරු වී සිටියි. කාලිප් රජු සිතන්නේ ඔහු කොහේ හෝ සැඟවී ඇති බවයි. මෙම දඬුවම දීමට අණ දී ඇත්තේ කාලිප්

රජතුමායි'' යනුවෙන් ස්ත්‍රිය කීවා ය.

''අහෝ, දෙවියනි! රජතුමාට ගෞරව කරන ආකාරය මගේ පුතාට මම හොඳින් උගන්වා ඇත. ඔබ කියන අන්දමේ වරදක් ඔහු නොකරන බව මට හොඳටම විශ්වාසය. ඔහු නිර්දෝෂ බව මම බිය නැතුවම කියමි. කෙසේ වෙතත් ඔහු නොමළ බව අසා මම සතුටුවෙමි. කාලිප් රජුගේ දඬුවම් කොපමණ කෲරතර වුවද මම එය පුතා වෙනුවෙන් විඳීමට කැමැත්තෙමි. නමුත් මට ඇති එකම දුක නම් මගේ දියණිය දුක් විඳීමයි.'' යනුවෙන් ගානම්ගේ මව කීවා ය. මෙතෙක් වේලා සිහි නැතිව සිටි ගානම්ගේ නැගණියට මවගේ මේ වචන ඇසී පියෙවි සිහිය ලැබුණේ ය. ඇය ද තමාගේ සහෝදරයා වෙනුවෙන් ඕනෑම දුකක් විඳීමට කැමති බව කීවා ය.

ඊළඟ දිනයේත් මේ දෙදෙනා පළමු දිනයේ මෙන් ම නගරයේ ප්‍රදර්ශනය කිරීමට රජතුමා අණ කළේ ය. එදින ද පෙර දිනයේ මෙන් ම ඉතා දුකසේ මේ ස්ත්‍රීන් දෙදෙනා ම නගරයේ ඇවිදීමට සිදුවිය. දින තුනක් මෙසේ ඇවිද්ද නමුත් දෙවෙනි තුන්වෙනි දිනවල නගරයේ මිනිසුන් නොවී ය. ගානම්ගේ මවටත් නැගණියටත් දෙන දඬුවම් ඉවසාගත නො හැකිව වෙළෙන්දෝ තම සල්පිල් වසා දමා නිවෙස්වල රැඳී සිටියහ. ස්ත්‍රීහු ද කවුළු අතරින් බැලීම නවතා නිවෙස්වල පසු පසට වී සිටියහ. ඩැමස්කස් නගරයේ සියලු වැසියන් නගරය අතහැර ගියාක් මෙන් පාළු විය.

කාලිප් රජුගේ තවත් ආඥාවක් විය. එනම් මේ රටේ කිසිම කෙනෙක් මේ ස්ත්‍රීන් දෙදෙනාට ඉඳුම්, හිටුම් දීම, ආහාර දීම, වතුර දීම හෝ කථා කිරීමවත් කළහොත්,

ඔවුන් මරා මෘත ශරීර බල්ලන්ට කෑමට දෙන බවය. සිනීබ් රජතුමා ඉතා අකමැත්තෙන් වුවද මෙම ආඥාව ද රටෙහි ප්‍රසිද්ධ කළේ ය. ඉන්පසු ගානම්ගේ මවට හා නැගණියට තමා කැමති ස්ථානයකට යන ලෙස කියා මුද හැරියේ ය. මුද හරින ලැබූ ස්ත්‍රීන් දෙදෙනා දුටු දුටු අය ඔවුන් මග හැර යන්නට වූහ. ඔවුන්ට තම හිතේසි මිත්‍රයින් හමුවූ විට ඔවුන් ද අහක බලාගෙන ගියහ. මෙසේ තමන්ගෙන් සියලු දෙනාම ඈත්වනු දුටු ස්ත්‍රීන් දෙදෙනා මහත් සේ පුදුමයටත් ශෝකයටත් පත්වූහ. එදින රාත්‍රියේ ජරාවාස වූ නිවසක මේ දෙදෙනා ගත කළහ. සිනීබ් රජතුමා කාලිප් රජුගේ අණ ඉෂ්ට කළ බව දැනුම් දී ගානම්ගේ මවට සහ නැගණියට කළ යුත්තේ කුමක්දැ යි අසා කාලිප් රජුට පණිවුඩයක් යැව්වේ ය. නැවත කවදාවත් නොඑනසේ ඔවුන් දෙදෙනා ඩැමස්කස් නගරයෙන් පහ කරන ලෙස කාලිප් රජු දන්වා එව්වේ ය. එම නියමය අනුව සිනීබ් රජතුමා ගානම්ගේ මව සහ නැගණිය ගෙන්වා, ඩැමස්කස් නගරයේ සිට බොහෝ ඈත ප්‍රදේශයකට ඔවුන් ඇරලීමට සේවකයින්ට නියම කළේ ය. සිනීබ් රජු කාලිප් රජුගේ නියමය ඉෂ්ට කළ නමුත් මෙම කාන්තාවන් දෙදෙනා ගැන අනුකම්පා කර ඔවුන්ට මුදලුත් කෑමගෙන යාමට මලුත් දුන්නේ ය.

මේ අන්දමින් ඔවුහු පළමුවෙන් එක් ගමකට පැමිණියහ. එය පිටිසර ගමක් විය. ගමෙහි සිටි ස්ත්‍රීහු මේ දෙදෙනා වටකරගෙන තොරතුරු කථා කරන්නට පටන් ගත්හ. ගානම්ගේ මව හා නැගණිය වැදගත් පවුලකට අයත් බව පෙනී ගිය ස්ත්‍රීහු මේ දෙදෙනාට තමන්ට හැකි පමණක් උපකාර කළහ. ගානම්ගේ මව හැඬූ කඳුලින් යුතුව ඔවුන්ට සිදුවී ඇති විපත ගැන කීවා ය. ගමේ ස්ත්‍රීහු ඔවුන්ගේ අස්ලොම්

වලින් සැදූ ඇඳුම් ඉවත්කර වෙනත් ඇඳුම් ඇන්ද වූහ. පාවහන් සහ හිස වැසීමට රෙදි ද ගෙනැවිත් දුන්හ. එදින රාත්‍රිය එම ගමෙහි ගත කර ඊලඟ දිනයේත් මේ දෙදෙනා ඇවිදීමට ගියහ. ඔවුන්ගේ බලාපොරොත්තුව වූයේ බැග්ඩෑග් නගරය කරා යාමටය. ඔවුහු දේවස්ථාන හා මගීන්ට නැවතීමට සාද ඇති නවාතැන් පොළවල්වල රාත්‍රිය ගත කරමින් දින කීපයක් ම ගමන් කළහ. නිතර මගීන්ට කෑම බෙදා දෙන ස්ථානවලින් ඔවුන්ට රොටී, බත් ආදිය ලැබුණේ ය. මෙසේ ඉතා දුකසේ දින ගණනාවක් ඇවිදීමෙන් පසුව ඔවුහු බැග්ඩෑග් නගරය වෙත ළඟා වූහ.

කාලිප් රජුගේ සිරදඬුවමට යටත් වූ දින සිට පැට්නා අන්ධකාර සිරගෙයි හඬමින් වැලපෙමින් කාලය ගත කළා ය. ඇයට ගානම් නිතරම සිහි විය. ගානම් ට සිදුවූයේ කුමක්දැ යි සිතමින් ඇය ශෝක වූවා ය. ඇය ඔහු නිසා කනගාටු නොවී සිටින වේලාවක් නොවී ය. කාලිප් රජතුමා අනුන්ගේ දේවල් දැන ගැනීමට බොහෝ ආශා ඇත්තෙකු විය. ඔහු මේ නිසා රාත්‍රී කාලයේ මාලිගාව වටා ඇවිදීම සිරිතක් ලෙස කළේ ය. දිනක් රාත්‍රියේ කාලිප් රජතුමා පැට්නාගේ අන්ධකාර සිරගෙය ළඟින් ගමන් කරද්දී කව්දෝ කථා කරන ශබ්දයක් ඇසී නැවතුණේ ය. එවිට, පැට්නා ඇතුලේ සිට විලාප නගනා හඬ ඔහුට ඇසුණේ ය.

"අහෝ! ගානම්, ඉතා අවාසනාවන්ත ගානම්! දැන් ඔබ සිටින්නේ කොහේ ද? අහෝ! ඔබ කාලකන්නි කළේ මම ය. මගේ ජීවිතය බේරා ගැනීමට ගොස් ඔබට සිදු වූ විපත ගැන මම කෙසේ සිතන්න ද? එද මට මැරෙන්නට ඉඩ දුන්නා නම් ඔබට මේ විපත සිදු වන්නේ නැත. ඔබ විසින්

මට කොපමණ ගෞරව කළේ ද? ඔබ මා කොපමණ හොඳින් රැක ගත්තේ ද? මා කාලිප් රජුගේ හිතේසියක් බව දැන ගත් මොහොතේ සිට ඔබ තුල මා කෙරෙහි තිබූ ආලය යටපත් කරගත්තේ මොන තරම් කැපවීමකින් ද? මගේ ජීවිතය බේරා දුන් ඔබට රජතුමා විසින් ගෞරව කර තෑගි බෝග දිය යුතුව තිබිය දී ඒ වෙනුවට ඔබ වරදකාරයකු කොට දඬුවම් දීම කොතරම් නීච ක්‍රියාවක් ද? ඔබ සෑම විටම කීවේ, ''රජතුමාට අයිතිදේ වහලාට අහිමි'' බව ය. ඔහු ඔබට කොතරම් ගෞරව කළේ ද? මේ කිසිත් නො විමසා අපට දඬුවම් කරන කෲරතර කාලිප් රජතුමාණනි, දෙවියන් වහන්සේගේ විනිශ්චය දවසේ දී මේ සියලු කාරණා හෙලිවනු ඇත. දැනට මුළු ලෝකයම ඔබගේ බලසම්පන්නකම නිසා ඔබේ දඬුවම් ගැන අසතුට පල කරන්නේ නැත. එහෙත් සත්‍යය හෙලි වූ දිනක ඔබ පසුතැවිලි වනු ඇත.'' මෙසේ කියමින් කඳුළු සලමින් සිට සුසුම් ලීමකින් පසුව පැට්නාගේ විලාපය නතර විය.

රජතුමාගේ හිත වෙනස්වීමට මෙම විලාපය ප්‍රමාණවත් විය. පැට්නා විසින් කියන ලද කාරණා සැබෑ බවත් තම හිතේසි ස්ත්‍රිය නිර්දෝෂි බවත් රජුට වැටහුණේ ය.

පැට්නාටත්, ගානම් හා ඔහුගේ පවුලේ අයටත් දඬුවම් කිරීමට ඉක්මන් වැඩි වුවා යයි රජුට සිතුණේ ය. රජතුමා තම කාමරයට ගොස් මැස්රූර් කැඳවා අන්ධකාර හිරගෙට ගොස් පැටුනා කැඳවාගෙන එන මෙන් නියම කළේය. මැස්රූර් ද ඉතා කැමැත්තෙන් පැට්නා කැඳවාගෙන ආවේය. පැට්නා කඳුලු වගුරුවමින් රජතුමාගේ පාමුල වැටී සිටියාය. ''පැට්නා මා විසින් කාලකන්නි බවට පත් කළේ කවුරුන්ද? මට සියල්ල නොසඟවා කියන්න. මගේ යහපත් කමත්, යුත්තිය ඉෂ්ඨ

කිරීමට ඇති කැමැත්තත් ඔබ දන්නවා නේද?'' යනුවෙන් රජතුමා පැට්නාට ඉතා ආදරයෙන් කථා කළේය. ගානම් නිදොස් බව පැවසීමට මෙය ඉතා හොඳ අවසථාවක් බව පැට්නාට පෙනී ගියේය.

''ස්වාමිනි, ඔබ වහන්සේ විසින් කාලකන්නි බවට පත් කරන ලද නිදොස් පුද්ගලයා ගානම් නමැති වෙළෙන්දෙකි. මගේ ප්‍රාණය ගලවා ඔහුගේ නිවසේ නවාතැන් දී මා ආරක්ෂා කළේ ඔහුය. ඔහු මට ආලය කරන බව දැන්වීමට තැත් කරන ලද බවද සත්‍යයකි. එහෙත් මා ඔබතුමාගේ හිතේසි ස්ත්‍රියක බව දැන ගත් වහාම ඔහු එම හැඟීම යටපත් කරගත් බවද සත්‍යයකි. එසේම ''අහෝ, උතුම් ස්ත්‍රිය, ස්වාමියාට අයිති දේ වහලාට තහනම්'' යනුවෙන් ඔහු නිතරම ප්‍රකාශ කරන ලද බවද සත්‍යයකි. ඉන්පසු ඔහු ඉතා ගෞරවයෙන් මා කෙරෙහි හැසුරුණු බවද සත්‍යයකි. ඔබ වහන්සේ විසින් ඔහුට කොපමණ කෲර ලෙස දඬුවම් කළේද? දෙවියන් වහන්සේ ඉදිරියේ ඔබ විසින් එයට වගකිව යුත්තේය.'' යනුවෙන් පැට්නා කිවාය. මෙසේ ඇත්ත නොසඟවා කීම ගැන කාලිප් රජතුමා පැට්නා කෙරෙහි අමනාප නොවීය. ගානම්ගේ යහපත් කම ගැන ඔබ කියන දේ සම්පූර්ණයෙන්ම සත්‍යදැ යි රජතුමා ඇසුවේය.

''දේවයන් වහන්ස, මම ඔබ තුමාට කිසිදිනෙක බොරුවක් කියා නැත. මගේ අවංකකම නිසා ඔබ තුමාට තවත් කරුණක් කීමට ඇත. සමහර විට ඔබ වහන්සේ අසතුටුවන්නට ද පිළිවන. නමුත් එය මම එය කිමට පෙර ඔබ වහන්සෙගෙන් සමාව ඉල්ලමි'' යි පැට්නා කිවාය. ''පැට්නා, මම ඔබට සමාව දෙමි කිසිවක් නොසඟවා කියන්න'' යනුවෙන් රජතුමා කිවේ ය. ''ගානම්ගේ ගෞරවය සහිත හැසිරීම හා ඔහු මට කරණ

ලද උපකාර නිසා ඔහු ගැන සැලකිලිමත්ව සිටිමට මට ද සිදු විය. මා තුළ ඔහු කෙරෙහි ආලයක් හට ගත්තේ ය. ඔහු ද මට ආලය කළේය. එහෙත් අපි ඔබ වහන්සෙට ගරු කිරිමක් වශයෙන් කිසිම වරදකට අසු නොවී වෙන්ව ජීවත් වූ බව ද දිව්රා කීමට පුළුවන්ය.'' යනුවෙන් පැටිනා කීවා ය.

මේ ප්‍රකාශය ගැන රජතුමා අසතුටට පත් වුයේ නැත. පැටිනාගේ අවංක කම ගැන රජතුමා සතුටු වූයේ ය. එතුමා පැටිනාට නැගිට තමා ළඟින් වාඩි වීමට අණ කලේ ය. ඉන්පසු පැටිනාගේ කථා ප්‍රවෘත්තිය මුල සිටම කියන ලෙස ප්‍රකාශ කළේය. පැටිනාද සොබයිදි සම්බන්ධ කරුණු අඩුවෙන් ද ගානම්ගේ ආධාර ගැන ප්‍රමාණයටත් වැඩියෙන්ද කිවාය. සොබයිදිගෙන් ගැලවී රහසේ ජීවත් වීමට ගානම් කරන ලද උපකාරය ගැන ඉතා උසස් ලෙස කථා කළාය. එසේම ගානම් ගැලවී ගියේ රජතුමාගේ කෝපය නිසා ඔහුට කරදරයක් විමට ඉඩ ඇති හෙයින් තමා විසින්ම යොදන ලද උපක්‍රමයක් අනුව බවද පැටිනා කිවාය. ඇයගේ කථාව අසා සිටි රජතුමා ඇසුවේ ඔබ මේවා දන්වීමට මාසයක් ප්‍රමාද වූයේ කුමක් නිසාද කියා පමණක්ය. ගානම් නිවසින් පිටවූයේ කලාතුරකින් බවත් ගානම් විසින් ඔබ වහන්සේට ලියුම එවීමට ප්‍රස්ථාව ලැබුණේ බොහෝ දවස් ගියාට පසුව බවත් ඇය පැවසුවා ය.

''පැටිනා, ඔපමණක් ඇත. මගේ වරද මා පිළිගනිමි. තරුණ වෙළෙන්දාට කරන ලද හානිය පිරිමැසීමට මම ඔහුට ආධාර කරමි. ඔබට කැමති වරයක් මගෙන් ඉල්ලා සිටින්න.'' වනුවෙන් රජතුමා පැටිනාට කිවේය.

''දේවියන් වහන්ස, ගානමට ඔබ වහන්සේ සමාව

දෙන බවත්, ඔබ වහන්සේ වෙතට පැමිණිය යතු බවත් කියා ඔබ වහස්සේගේ රාජ්‍යය සැම තැනම ප්‍රකාශ කරවන ලෙස ඉතා යටහත්ව ඉල්ලා සිටිමි.'' යනුවෙන් පැවිනා ඉල්ලීමක් කළාය. ඔබේ ප්‍රාණය ගැලවීම නිසාත් ඔහුගේ වස්තුව නැති වීම නිසාත් මා විසින් ඔහුට ඊට වඩා ඔහුට යමක් කළයුතුව ඇත. එබැවින් මා ඔහුට බොහෝ වස්තුව දී නුඹට, ඔහු ස්වාමි පුරුෂයා කොට සරණ කර දෙමි.'' යනුවෙන් රජතුමා ප්‍රකාශ කළේය. කාලිප් රජතුමාගේ ගුණවත් කම ගැන ස්තුති කිරීමට පැවිනාට වචන නැති විය. ඇය රජතුමාගේ පා මුල නැවතත් වැඳ වැටුනාය. ඉන්පසු ඇය තමා මුලින්ම ජීවත් වූ කාමරයට ගියාය. එහි තමාගේ බඩු පෙර තිබුණ ආකාරයටම තිබුණේය. මැස්රූර්ගේ කාමරයේ තබන ලද ගානම් ගේ රෙදි පෙට්ටිය හා මුදල් ද තම කාමරයේ තිබෙනු දැක ඉමහත් සතුටට පත්විය. රජතුමා ගානම් ට සමාව දුන් බව රාජ්‍යයේ සැම තැනම පහුවදාම ප්‍රචාරය කළේ ය. නමුත් තරුණ වෙළෙන්දා ගැන කිසිම තොරතුරක් දැනගැනිමට නොහැකි විය. තමා නැති ශෝකය ඉවසා ගත නොහැකිව ගානම් මියයන්නට ඇත්දැයි පැවිනා විටෙක සිතුවාය. එහෙත් ගානම් කෙරෙහි ආලය නිසා ඔහු සොයා යාමට සිතා ඇය රජතුමාගෙන් අවසර ඉල්ලුවාය. ගානම් සොයා යාමට අවසර ලබා ගත් පැවිනා රන්කාසි දහසක් අඩංගු පසුම්බියකුත් රැගෙන සරසන ලද කොටළුවකු පිට නැගී උදයෙන්ම මාලිගාවෙන් පිටත් වී ගියාය. ඇය දෙපසින් වහලුන් දෙදෙනෙක් ද ගමන් කළහ. ඇය දෙවස්ථාන කරා යමින් ගානම් සොයා දෙන මෙන් යාඥා කළාය. දෙවස්ථානවල සිටින ශුද්ධවන්තයින්ට රන් කාසි දන් දුන්නාය. ඇය මුදල් සියල්ලම වියදම් කොට හවස මාලිගාවට පැමිණියාය.

පසුවදාත් ඇය රන්කාසි දහසක් ගෙන කොටළුවා පිට නැගී ගානම් සෙවීමට පිටත් වූවා ය. එදිනද ඇය වෙළෙන්දන්ගේ සල්පිල් තිබෙන ප්‍රසිද්ධ වෙළදාම් කරණ ස්ථානයට ගොස් කොටළුවා පිටින් නොබැසම ප්‍රධාන වෙළෙන්දාට පණිවුඩයක් යැව්වාය. ප්‍රධාන වෙළෙන්දා අසරණ වූවන්ට හා රෝගීන්ට තම ආදායමින් තුනෙන් පංගුවකටත් වඩා වියදම් කරණ ඉතා කරුණාවන්ත පුද්ගලයෙක් විය. ''පැට්නාගේ ඇඳුම දුටු ප්‍රධාන වෙළෙන්දා ඇය රජ මාලිගයට අයත් ස්ත්‍රියක බව දැන ගත්තේය. ප්‍රධන වෙළෙන්දා පැට්නා හමුවට පැමිණි විට, ''ප්‍රධාන වෙළෙන්දාණෙනි, ඔබගේ භක්ති වන්ත කම ගැන මුළු නගරයම දන්නා බව මම දනිමි. උපකාර ඉල්ලන්නන් හට ඔබ බොහෝ ආධාර කරන බැවින් එවැනි තැනැත්තන්ට මෙම මුදල් බෙදා දෙන්න.'' යනුවෙන් කියා රන් කාසි දහස වෙළෙන්දා අතට දුන්නාය. එසේ ආධාර කිරිමට මම ද කැමැත්තෙමි. යනුවෙන්ද පැට්නා කිවාය. ''කාන්තාවනි, ඔබගේ අදහසට මම බොහෝ සේ කැමති වෙමි, කැමතිනම් මගේ නිවසට පැමිණෙනු මැනවි. ඔබ විසින් අනුකම්පා කළ යුතු ස්ත්‍රීන් දෙදෙනෙක් එහි වෙති'' යි වෙළෙන්දා කිවේය.

''ඊයේ ඔවුන් නගරයට එන කළ මට හමුවිය. ඔවුන් ඉතා අසරණ තත්වට වැටී ඇති නමුත් වැදගත් අය බව සිතුන බැවින් මගේ සිත උණුවිය. ඔවුන් කඩමළු ඇඳගෙන සිටියත්, අව්වෙන් මුහුණු දැවී තිබුණත් වෙන අයට වඩා උතුම් ලීලාවක් ඔවුන් තුළ දක්නට ලැබුණි. ඉතින් මා ඒ දෙදෙනා ගෙන ගොස් මගේ භාර්යාවට භාරදුනිමි. මගේ භාර්යාවද මා මෙන් සිතා ඔවුන් ගෙට කැඳවා උණු දියෙන් නහවා පිරිසිදු ඇඳුම් ඇඳීමට දී කෑම බීම දී මද වේලාවක් විවේක ගැනීමට ඉඩදී සිටිමු. ඔවුන් කවුරුන්දැයි අපි තවම නොදනිමු. ප්‍රශ්ණ අසා

කරදර කිරිමට මත්තෙන් ඔවුන්ට විවේක ගැනිම සුදුසුයයි අපි සිතුවෙමු.'' යනුවෙන් ප්‍රධාන වෙළෙන්දා පැට්නාට කීවේ ය. පැට්නාටද ඔවුන් බැලීමට මහත් ආශාවක් ඇතිවිය.

ප්‍රධාන වෙළෙන්දා විසින් දෙන ලද වහලකු සමග පැට්නා ප්‍රධාන වෙළෙන්දාගේ නිවසට ගියාය. ඉන්පසු තමා පැමිණි බව වෙළෙන්දාගේ භාර්යාවට දන්වා පණිවුඩයක් යැවුවාය. වෙළෙන්දාගේ භාර්යාවද පැට්නාට ආචාර කොට පිළිගත්තාය. තමාට ඊයේ රෑ බැග්ඩෑග් නුවරට පැමිණි දෙදෙනා බැලීමට දෙන ලෙස පැට්නා වෙළෙන්දාගේ භාර්යාවගෙන් ඉල්ලා සිටියාය.

''කුලවත් ස්ත්‍රිය, අර පෙනෙන කාමරයේ එක ළඟ ඇති ඇඳන් දෙකේ නිදාගෙන සිටින්නේ එම කාන්තාවන් දෙදෙනාය.'' යනුවෙන් ඇය පැට්නාට කාන්තාවන් සිටින තැන පෙන්නුවාය. පැට්නා වහා ඔවුන් සිටි ඇඳ ළඟට ගොස් කථා කළාය. ''කාන්තාවනි, ඔබලා කරදරයක වැටී අසරණ වී ඇති බව මට පෙනෙයි. එබැවින් ඔබ දෙදෙනාට උපකාර කිරිමට මම කැමැත්තෙමි. මට එසේ කිරීමට බලපුළුවන් කමක් තිබේ. කරුණාකර ඔබලාට සිදුවූ විපත පිළිබඳ විස්තරයක් කියන්න. මම ඇසිමට කැමැත්තෙමි.'' යනුවෙන් පැට්නා කිවාය.

''දෙවියන් වහනසේ, සම්පූර්ණයෙන්ම අපව අත් නොහැරි බව පෙනේ. ඔබතුමිය මෙසේ අපට උපකාර කරන්නට පැමිණීම දෙවියන්ගේ ආශිර්වාදයක් බව පෙනේ.'' කියමින් කඳුලු වගුරවමින් ගානම්ගේ මවත් නැගණියත් අඬන්නට වුහ. මෙය දුටු පැට්නා හා වෙළෙන්දාගේ භාර්යාවත් අඬන්නට වුහ. මඳ වෙලාවකට පසු ගානම්ගේ මව කථා කළාය.

''උතුම් කාන්තාවනි, කාලිප් රජතුමාගේ හිතේෂී කාන්තාවක් වන පැට්නා නම් ස්ත්‍රිය නිසා අපට මේ සියලු විපත් පැමිණියේය.'' යනුවෙන් ඇය පැවසුවාය.

මෙම වචන පැට්නාට අකුණු පහරක් මෙන් විය. එහෙත් ඇය ඒ දුක මර්ධනය කරගෙන තව දුරටත් විස්තර කියන මෙන් ගානම්ගේ මවගෙන් ඉල්ලා සිටියාය.

''මට ගානම් නම් පුත්‍රයෙක් සිටියේ ය. ඔහු බැග්ඩෑග් නුවරට පැමිණ පැට්නා ඇරගෙන සිටීමේ වරදට අසුවිය. ඔහු මරණයට පත් කිරීම සඳහා කාලිප් රජු විසින් රට සැම තැනම ඔහු සොයා යන්නේ ය. ''ගානම් සොයා ගැනීමට නොහැකි වූ රජතුමා විසින් අපේ නිවස බිඳ හෙලා බිමට සමතලා කොට අප දෙදෙනාට අස් ලොම් වලින් සාදන ලද ඇඳුම් අන්දවා පාවහන් ගලවා නගරයේ දින තුනක් ඇවිද්දවා දඬුවම් කර අපේ රටෙන්ද පිටුවහල් කරවන ලදි.'' ගානම් වැරදි කරුවෙක් නොවන බව මට සහතික කළ හැකිය. සියලු වස්තුව හා ගෙවල් දොරවල් අහිමි උවත් ගානම් දකින්නට ලැබෙනම් අප දෙදෙනාට ඊට වඩා සතුටක් නැත.'' යනුවෙන් ගානම්ගේ මව කීවා ය.

''ගානම් නිදොස් බව මමද සහතික කර කියමි. එසේ කියන්නේ ඔබ ඔපමණ දොස් තබන පැට්නා වෙන කෙනෙක් නොව මා බැවිනි.'' ඔහු විපතට වැටුණේ මගේ ජීවිතය බේරා දුන් බැවිනි. ඔහුට මා සදා ණය ගැතියි. කෙසේ හෝ මා ගානම්ගේ නිවැරදි බව කාලිප් රජතුමාට අවබෝධ කරවූයෙමි. දැන් ඔහු ගානම්ට සමාව දි ඇත. ඔහු කරන ලද දැඩි දඬුවම් ගැන කාලිප් රජතුමා මහත් සේ පසු තැවිලි වෙයි. එතුමා, මම ගානම්ගේ භාර්යාව කොට පවා දෙන්නට සහතික

විය. එබැවින් මා ඔබගේ දියණියක ලෙස සලකා මට සමාව දෙනු මැනවි.'' යනුවෙන් කියමින් පැටිනා ගානම්ගේ මවගේ පා මුල වැඳ වැටුණාය. පැටිනා, ගානම්ගේ මව බොහෝ වෙලා වැළඳගෙන සිට ඉන්පසු ගානම්ගේ නැගණිය වන ඇල්කොලම්ද ඉතා ආදරයෙන් සිප වැළඳ ගත්තා ය.

ඉන්පසු පැටිනා කතා කරන්නට පටන් ගත්තාය.

''මැණියනි, ගානම් ගේ වස්තුව නැති වූයේ නැත. ඔහුට අයත් සියලු ම භාණ්ඩ හා මුදල් සියල්ල මාලිගයේ, මට අයත් කාමරයේ තිබේ. ගානම් නැතිව ලෝකයේ සියලු ම වස්තුව ලැබුණත් නො සෑහෙන බව දනිමි. තරුණ සිත්වල බැඳී ආලයට වඩා ලේ වල ඇති බලවත් කම වැඩි බව මම දනිමි. එහෙත් ගානම් දකින්නට නො ලැබේ යයි නොසිතනු මැනවි. ඔබ දෙදෙනා හමුවීමෙන් මට ද ගානම් ගැන තවත් බලාපොරොත්තු වැඩි වූයේ යැ'' යි කීවාය. පැටිනා තවදුරටත් කථා කිරීමට සූදානම් වන විට ප්‍රධාන වෛද්‍යවරයා ඇවිත් කථා කළේය.

''කුලවත් ස්ත්‍රිය, මම බොහෝ අනුකම්පා කළ යුතු කාරණයක් දුටුවෙමි. එනම් ඔටුවන් දක්කන්නකු විසින් ආරෝග්‍ය ශාලාවට ගෙන යන තරුණයෙකි. ඔටුවාගේ පිට උඩ සිටීමටවත් තරුණයාට ශක්තියක් නැති බැවින් ඔහු ඔටුවාගේ පිටෙහි තබා කඹ වලින් බැඳ තිබුණි. මම තරුණයාට කථා කොට ප්‍රශ්න කීපයක් ඇසුවෙයි. එහෙත් ඔහු පිළිතුරු දෙනවා වෙනුවට සුසුම් හෙලමින් කඳුලු වගුරු වන්නට විය. ඔහුට හොඳින් වෙදකම් කළ යුතු බව මට හැඟුන බැවින් ආරෝග්‍ය ශාලාවට නොයවා එම තරුණයා මගේ නිවසට ගෙන ආවෙමි. මගේ අණ පරිදි වහලුන් විසින් ඔහු රහස්

කාමරයකට ගෙන ගොස් මගේම ඇඳුම් අන්දවා මට සාත්තු කරන ආකාරයට සාත්තු කරති.'' යි කීවේය. මේ වචන අසා පැට්නාගේ සිත බොහෝ සේ උණු විය.

පැට්නා ට එම රෝගියා බැලීමට කැමැත්තක් ඇති වී වෙළෙන්දාගෙන් ඒ සඳහා අවසර ඉල්ලුවාය. වෙළෙන්දා ඇයට කාමරය පෙන්වූයේ ය. ඇය රෝගී තරුණයා ළඟට ගියාය. ඇස් පියවුණු අරුප වූ සුදුමැලි කඳුලින් තෙමුණු මුහුණක් ඇති ඔහු දෙස පැට්නා ඇසිපිය නොහෙලා බලා සිටියාය. ඇගේ පපුව ගැහෙන්නට විය. මේ නම් ගානම් විය යුතු යයි ඇය සිතුවාය. එහෙත් ඇගේ පෙනීම ඇයට ම විශ්වාස කළ නොහැකි විය. මේ ගානම් යයි කියා නිසැකවම සිතීමට බිය වූවාය. ඇය බියෙන් වෙව්ලමින්,

''ගානම්, ගානම්'' කියා කථා කළාය. ඔබට මේ පැට්නාගේ කට හඬ අඳුනාගැනීමට බැරි දැයි ඇය ඇසුවාය. පැට්නා යන නම සඳහන් කළ විට ගානම් ඇස් ඇර බැලුවේය. ඇය පැට්නා බව හඳුනාගත් ගානම් මේ මොන පුදුමයක් දැයි කියමින් ප්‍රීතිය ඉවසාගත නොහැකිව ක්ලාන්ත වූයේය. ප්‍රධාන වෙළෙන්දාට කරුණු අවබෝධ විය. ඔහු මද වේලාවකට කාමරයෙන් ඉවත් වී සිටින ලෙස පැට්නාට කීවේය. සිහිය ලත් වහාම තරුණයා පැට්නා ගැන අසන්නට පටන් ගත්තේය.

''ඇත්තටම පැට්නා කාමරයට පැමිණියේ ද? නැත්නම් මෙය මායාවක්දැ'' යි තරුණයා වෙළෙන්දාගෙන් ඇසුවේය. මෙය මායාවක් නොවන බවත් සනීප වනතුරු ඇය ටික වේලාවකට එතැනින් ඉවත් කරන ලද බවත් වෙළෙන්දා කීවේය. තවද කාලිප් රජතුමා ගානම් ට සමාව දුන් බව බැග්ඩැග් නගරයේ ප්‍රසිද්ධ කර ඇති බැවින් දැනට ඒ ගැන

සිතා සතුටින් සිටින ලෙස ද කීවේය.

ගානම් හැඳිනගත් පැටිනා වහාම ගානම් ගේ මව සහ නැගණියන් ළඟට දිව්වාය. වෙලෙන්දා විසින් ගෙන එන ලද රෝගාතුර තරුණයා ගානම් බව ඇයි ඔවුන්ට කීවාය. මෙය ඇසූ ගානම්ගේ මව අතිශයින් ප්‍රීතියට පැමිණ ක්ලාන්ත වූවා ය. නැගණියට සතුට වැඩි කමට කථා කරගන්නට බැරි විය. ඔවුන්ට ගානම් බැලීමට ඉවසිල්ලක් නැති විය. එහෙත් වෙලෙන්දා එයට ඉඩ නො දුන්නේය. ප්‍රීතිය ඉවසාගත නො හැකිව ගානම් නැවතත් අසනීප වේ යයි ඔහු බිය වූයේ ය. ගානම් ට හොඳින් සුවය ලැබෙන තුරු ඔහු නැබැලීමට ගානම්ගේ මව සහ නැගණිය කැමතු වීහ. පැටිනා මේ ගැන හාබිජ් රජතුමාට දැන්වීමට මැලිගාවට ගියාය.

මාලිගාවට ගිය පැටිනා, රජතුමා සමග රහස් සාකච්ඡාවක් කිරීමට ඇති බව කියා මැස්රූර් අත රජතුමාට පණිවිඩයක් යැව්වාය. රජතුමා තනියම සිටින කාමරයට පැමිණෙන මෙන් පැටිනාට පිළිතුරක් ලැබිණ. ගානම් ගැන තොරතුරක් ලැබුණේ දැයි පැටිනා දුටු විගස රජතුමා ඇසුවේය.

''දේවයන් වහන්ස, මගේ ගමන සර්වප්‍රකාරයෙන්ම සාර්ථක විය. ගානම් පමණක් නොව ඔහුගේ මව සහ නැගණියත් සොයා ගන්නට හැකිවිය.'' යනුවෙන් පැවසුවාය. මෙපමණ කෙටි කලකින් මේ තිදෙනා සොයා ගත්තේ කෙසේ දැයි රජතුමා පුදුම වී ඇසුවේය.

එවිට, ප්‍රධාන වෙලෙන්දාගේ ගුණවත් කම හා ත්‍යාග ශීලී කම ගැනත් ඔහු නිසා මේ තිදෙනාම ජීවතුන් අතර සිටියදී දක්නට ලැබුණ බවත් කීවාය. පැටිනාගේ විස්තරය

ඇසීමෙන් පසු රජතුමා ගානම්ගේ මව ද සහෝදරිය ද ප්‍රධාන වෙළෙන්දා ද දැකීමට කැමති බව කීවේය.

පසුවදා පැට්නා ගානම් බැලීමට යන විට ඔහුගේ අසනීපය බොහෝ දුරට සුව අතට හැරෙමින් තිබිණි. ඔහු පෙර දින රාත්‍රියේ ඉතා හොඳින් නිදා ගත් බවත්, පසුවදා හොඳින් ආහාර අනුභව කළ බවත් දැනගන්නට ලැබිණ. මෙසේ ටික දිනක් ගතවන විට ගානම් ට සුවය ලැබිණ. ගානම් ට ඔහුගේ මව සහ නැගණිය පෙන්වීමට සුදුසු වේලාවක් බලා පැට්නා ඒ සඳහා කාන්තාවන් දෙදෙනා ගානම් ළඟට කැඳවා ගෙන ආවාය. ඔවුහු ගානම් සිටි කාමරයට ඇතුලු වී වරින් වර ඔහු වැළඳ ගන්නා අතර කඳුළු සැලීමේ කෙලවරක් නොවීය. තිදෙනා ම සතුටින් ඉපිලී ගොස් සතුටු කඳුළු සැලූහ. පැට්නාගේ ඇස් වලින් ද කඳුළු ගලන්නට විය.

''ඉතින් පැට්නා, ඔබට රජතුමා සමාව දී නැවත ඔහුගේ හොඳම හිතේසිය ලෙස භාර ගන්නා බව කීවා ද?'' යි ගානම් ඇසුවේ ය. ''මගේ පෙම්බර ගානම්, මා විසින් කරුණු පහදා දුන් පසු ඔබටකරන ලද දඬුවම් වලට වන්දි ගෙවීම සඳහා මා ඔබේ භාර්යාව කොට ගැනීමට නියම කරන ලදී.'' යනුවෙන් පැට්නා කීවාය. ගානම් ට තම කන් අදහා ගත නොහැකි විය. මෙම ප්‍රකාශය ඇත්තක් ද යනුවෙන් ගානම් කීප වතාවක් ම පැට්නාගෙන් ඇසුවේය. කෙසේ වෙතත් පසුවදා ම ගානම් ද, මව ද, නැගණිය ද ප්‍රධාන වෙළෙන්දා ද රජතුමා බැහැ දැකීමට යා යුතු බව කී පැට්නා ඒ සඳහා සූදානම් වන ලෙස දැන් වූවාය. ඇය නගරයට ගොස් සියලු දෙනාටම අවශ්‍ය ඇඳුම් පැළඳුම් රැගෙන ආවාය. එදින ගානම් ද, පැට්නා ද, මව ද, නැගණිය ද තම තමන්ට සිදු වූ දේ ගැන බොහෝ වේලා කථා කළහ.

පසුවදා ගයාපර් නමැති මහ ඇමතිතුමා බොහෝ මුලාදෑනීන් පිරිවරාගෙන ගානම් ඇතුලු පිරිස රජ මාලිගයට කැඳවාගෙන යාමහට ආවේය. සියලු දෙනාම රජතුමා විසින් එවන ලද අශ්වයින් පිට නැගී රජතුමා දැකීමට ගියහ. රජතුමා ඉදිරියට ගානම් ගොස් වැඳ වැටුණේය. එවිට රජතුමා ගානම් ට කථා කළේය.

''නුඹ දකින්නට ලැබුණාට මම කැමැත්තෙමි. මගේ හිතේසී පැටිනා හමු වූ තැන් පටන් සියලු විස්තර දැන් නුඹේ කටින් ම කියනවා ඇසීමට මම කැමැත්තෙමි.'' යි රජු කීවේය. ගානම් ද තමාට සිදු වූ දේ සියල්ල අවංකවම කීවේය. ගානම් ගේ අවංක කම ගැන රජතුමා බොහෝ සතුටට පත් විය. ඉන්පසු ඔහුට ඉතා අගනා ඇඳුමක් තෑගි කළේය.

''ගානම් මම මේ රජ මාලිගයේම ඔබ නවතා ගනිමි'' යි රජතුමා ප්‍රකාශ කළේය. ''ස්වාමීනි, වහලෙකුගේ ප්‍රමාණය හා වස්තුව ඇත්තේ ස්වාමියා ළඟය. එබැවින් ඔබ වහන්සේගේ නියමයට මා අකමැති නොවෙමි.'' යනුවෙන් කීවේය. ගානම් ගේ නිහතමානී කම ගැන රජතුමා තව තවත් ඔහු ගැන පැහැදුනේය.

ඉන්පසු ගානම් ගේ මව සහ නැගණිය වන ඇල්කොලම් පැමිණ රජතුමාට නමස්කාර කළහ. රජතුමා ඇල්කොලම්ගේ රූපශ්‍රීය දැක වශීවී ඉතා ඕනෑකමින් ඈ දෙසම බලා සිටියාය. මම නුඹලාට කරන ලද අන්තරායට පිරිමසින තරම් උසස් සංග්‍රහයක් මා විසින් කළ යුතුය. එබැවින් ඇල්කොලම් මගේ භාර්යා තනතුරෙහි තබාගනිමි. මෙය සොබයිදිට දඬුවමක් වන අතර ඇල්කොලම්ට මහත් වාසනාවක් වනු ඇතැයි රජතුමා ප්‍රකාශ කළේය.

ඉන්පසු ගානම් ගේ මව දෙසට හැරී මෙසේ කීවේය. ''නුඹත් තවම තරුණය. නුඹ මගේ ප්‍රධාන ඇමතිගේ භාර්යාව වීම දකින්නට මම කැමත්තෙමි. එසේම පැට්නා, ගානම් ට විවාහ කර දෙන්නෙමි. මෙම ප්‍රකාශයෙන් පසුව විවාහ ලේකම් ගෙන්වා වහාම විවාහ ගිවිසුම් පත් ලියන මෙන් ද රජතුමා නියෝග කළේය.

මේ තිදෙනාගේ ජීවිත රැක දුන් ප්‍රධාන වෙළෙන්දාට බොහෝ වස්තුව තෑගි දී ඔහු තමාගේ වෛද්‍යවරයා ලෙස රජමැඳුරේ සේවයට බඳවා ගත්තේය.

එදා රජ මැදුර උත්සව ශ්‍රීයෙන් බැබළෙන්නට විය. රටේ සියලු වැසියන්ට සතියක් සැණකෙළි පැවැත් වීමට රජ අණ ලැබිණ. සියලු දෙනාම බොහෝ කාලයක් සතුටින් සාමයෙන් ගත කළහ.

# මෝසල්හි තරුණයා.

මම ඩැමස්කස්හි පදිංචි තරමක් ප්‍රසිද්ධ වෛද්‍යවරයෙකු වෙමි. දිනක් එම නගරයේ ආණ්ඩුකාරවරයාගේ පවුලේ කෙනෙකු අසනීප වී ඇති බැවින් ප්‍රතිකාර කිරීම සඳහා මට එහි යන්නට කියා පණිවිඩයක් ලැබිණි. ඒ අනුව මම ද ලෙඩා බැලීමට ගියෙමි. රෝගාතුරව සිටියේ ඉතා කඩිම තරුණයෙකි. මම නාඩි බැලීම සඳහා ඔහුගේ අත දිගුකරන ලෙස කීවෙමි. ඔහු විසින් එවිට ඔහුගේ වමත දිගු කරන ලදී. දකුණත වෙනුවට වමත දීම ගැන මම විශ්මයට පත්වුයෙමි. එහෙත් ඒ ගැන නොවිමසා, ඔහුගේ නාඩි බලා අවශ්‍ය ප්‍රතිකාර නියම කළෙමි. දෙවෙනි දිනයේදීත් නාඩි බැලිම සඳහා ඔහු විසින් වමත දෙන ලදි. එදිනද මම ඔහුට බෙහෙත් නියම කොට ආපසු ගියෙමි. මේ ආකාරයට දින නවයක්ම මම ඔහුගේ නාඩි බැලූ සෑම අවස්ථාවකදීම ඔහු විසින් වමත පමණක් දිගු කරන ලදී. දහවන දිනය වන විට ඔහුට සුවය ලැබිණි. එදින මම ඔහුට දිය නෑමට පමණක් නියම කළෙමි. ලෙඩා සුවකිරීම පිළිබඳව සතුටට පත්වූ ආණ්ඩුකාරවරයා මට අනර්ඝ සළුවක් තෑගි දී මා නගරයේ ආරෝග්‍ය ශාලාවේ වෛදයවරයකු ලෙසද ඔහුගේ පවුලේ වෛද්‍යවරයා ලෙස ද පත් කළේය.

තරුණයා ද ඔහුගේ අසනීපය සුව කිරීම පිළිබඳව මට බොහෝ සේ ස්තුති කළේය. ඔහු මා සමග මිත්‍රවිය. දසවෙනි දිනයේ ඔහු නාන ස්ථානයට ද මා සමග යාමට අවශ්‍ය බව කිවේය. මම ද ඔහු සමග නාන ස්ථානයට ගියෙමි. නෑම සඳහා ඇඳුම් ඉවත් කරන විට, ඔහුගේ දකුණු අත ළඟදී කපා ඇති බව දක්නට ලැබිණි.

තරුණයාගේ අත කපා ඇති බව මට නොකියා සිටි නමුත් අසනීපයට හේතු වූයේ එය බව මට පෙනී ගියේය. වෙනත් වෙදුන් විසින් තුවාලයට උඩින් බෙහෙත් ආලේප කරන ලද නමුත් ශරීරයේ උණ සුවකිරීමට ඔවුන් අසමත් වී ඇති බැව් මම අවබෝධ කරගතිමි. මම ඔහුගේ අවාසනාවන්තභාවය ගැන දුක්වන බව මගේ මුහුණින් ඔහුට පෙනී මට කතා කළේය. ''වෛද්‍යාචාර්ය තුමනි, මගේ අත කපා ඇති බව දැක ඔබ කනගාටු වන බව මට පෙනෙයි. මම ඔබට මගේ අත කැපීමට හේතුව පසුව කියමි'' යනුවෙන් තරුණයා කීවේය.

එදින දවල් ආහාර අනුභවයෙන් පසුව ආණ්ඩුකාරවරයාගේ උයනෙහි ඇවිදීමට යාමෙන් සනීපයට බාධාවක් ඇතිවේ දැයි තරුණයා මගෙන් ඇසුවේය. ශරීරයට සුළං වැදීම ඉතා ගුණදායක බව මම ඔහුට කීවෙමි. එසේ කීවිට ඔහු මා සමග උයනේ ඇවිදීමෙන් පසු ගසක් යට වාඩිවී ඔහුගේ අත කැපීමට හේතු වූ කතාව මා සමග කියන්නට පටන් ගත්තේය.

''මගේ පියා මෝසල්හි වැදගත් පවුලක, කෙනෙකි. ඔහු සහෝදරයන් දහ දෙනෙකුගෙන් යුත් පවුලේ වැඩිමල් සහෝදරයා විය. මගේ බාප්පලා සියලු දෙනාම විවාහ වී සිටිය නමුත් ඔවුන්ට දරුවන් නොවිය. එහෙයින් පියා ගේ මෙන්ම

බාප්පලාගේ ආදරය ද සැලකීම ද මට නො අඩුව ලැබිණි. මම හොඳින් ඉගෙන වැඩිවියට පැමිණි කල්හි රැකියාවක් කළෙමි.

එක් සිකුරාදා දිනක යාච්ඤාවට පැමිණි බාප්පලා, යාච්ඤාව අවසානයේ දේව මන්දිරයේ මද වේලාවක් නැවතී පියා සමග කතා කරන්නට පටන් ගන්නා ලදී. ඔවුහු රටවල් වල ඇවිදීම ගනත් නැව් වලින් ගමන් කිරීම ගැනත්, සමහර රටවල හා නගරවල ලක්ෂණ ගැනත් කතා කරන ලදී. ඔවුහු මිසරය හා නයිල් ගඟ ගැන විශේෂයෙන් කතා කළ අතර නයිල් ගඟ නිසා මිසරය සාරවත් භූමියක් බවට පත් වී ඇති අන්දම ගැනත්, එහි සිටින ස්ත්‍රීන්ගේ හැසිරීම ගැනත්, ඔවුන්ගේ රූපශ්‍රීය ගැනත් සාකච්ඡා කරන ලදී. ලෝකයෙන්ම ඉතා විශාල ජනගහණයකින් යුක්තවූත් ධනවත් වූත් මහා කයිරෝ නගරය ගැනද පාරාවෝ රජවරු විසින් සාදන ලද පිරමිඩ ගැනද මිසරයේ ඇති විශාල ගොඩනැගිලි ගැනද කතාකළ අතර ඒවා නොදැක ජීවත් වීමෙන් ඵලක් නැති බව ප්‍රකාශ කරන ලදී.

නයිල් ගඟ ගැනද මිසර රාජ්‍යය ගැනද මගේ පියා හා බාප්පා වරුන් විසින් කරන ලද කතාව ඇසූ මට එදින රාත්‍රී නින්දක් නොවීය. මට ද මිසරය බැලීමට යාමට මහත් ආශාවක් ඇති විය. මගේ බාප්පාවරු ධනවත් වෙළෙඳුන්ව සිටි බැවින් මිසරයේ වෙළෙඳාමට යාමට ඔවුහු සියලු දෙනාම සූදානම් වූහ. මම ද මගේ පියා වෙතට ගොස් මිසරයේ වෙළඳාමට බාප්පලා සමග යාමට අවසර ඉල්ලුවෙමි. මේ සමග යාමට මා තරුණ වැඩි බැවින්, ගමනෙන් මා වෙහෙස විය හැකි බවත්, වෙළඳාමෙන් පාඩු සිදුවිය හැකි බවත් කියා මගේ පියා මගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළේය. එකල්හි මා බාප්පා වරුන්ගෙන් මා ද කැටුව යන ලෙස ඉල්ලා සිටියෙමි. ඔවුන් ලවා පියාට

කියවා ගමනට අවසර ලබා ගැනීමට උත්සාහ කළෙමි.

බප්පා වරුන්ගේ ඉල්ලීම මත, මට ඩැමස්කස් නගරය තෙක් යාමට පමණක් පියාගෙන් අවසර ලැබිණි. බාප්පාවරු මිසරයේ ඇවිද එනතෙක් මට ඩැමස්කස් නුවර නැවතී එහි සිරි නරඹන ලෙස පියා මට කීවේ ය. පියාගේ අවසරය ලැබුණ පසු මම බාප්පාවරුන් සමග ගමන්කොට ඩැමස්කස් නගරයට පැමිණියෙමි. ඩැමස්කස් නගරයද දිව්‍යලෝකයක් මෙන් අලංකාර, ස්ථානයක් විය. කොටු, පවුරු, උයන්වතු ආදී ස්ථාන ද අපි සතුටින් නැරඹුවෙමු. බාප්පලා මිසරයට යාමට පෙර මගේ භාණ්ඩ සියල්ල ඩැමස්කස් නගරයේ දී විකුණා ගැනීමට හැකි විය. මගේ බඩු සඳහා සියයට පන්සිය බැගින් මට ලාභ ලැබුණේය. මට මහත් ලාභයක් ලැබීම ගැන මම මහත් සේ ප්‍රීති වුයෙමි. මගේ බාප්පාවරු මා ඩැමසකස් නගරයේ සිටුවා මිසරය බලා පිටත් වූ පසු මගේ මුදල් නිකරුණේ වියදම් නොකිරීමට මම වග බලා ගතිමි.

මම ඉතා අලංකාර ගේ උයනක් සහිත විශාල ගෙයක් ද ගෘහ භාණ්ඩද මිල දී ගතිමි. මම වැඩකාරයන් ද තබාගෙන ඉතා නම්බුකාර විදියට ජීවත් වුනෙමි. වැදගත් මිනිසුන් ආශ්‍රය කරමින් බාප්පලා එනතුරු ඩැමස්කස් නගරයේ වාසය කළෙමි. දිනක් මා නිවසේ දොරටුව අසල සිටින විට. ඉතා අලංකාර ලෙස ඇඳ පැළඳ ගත් මනා රූපශ්‍රීයෙන් යුත් ස්ත්‍රියක් පැමිණ ''රෙදි නොවික්කෙහි ද'' යි මගෙන් අසමින් ගෙට ඇතුල් වුවාය. එවිට මම ද ගෙට ගොස් ඇයට වාඩි වීමට කීවෙමි. ඉන් පසු ඇයට පෙන්වීම සඳහා පටපිළි එවේලෙහි මා ළඟ නැති බව ඇයට කීවෙමි. එවිට කාන්තාව ඇගේ මුහුණෙහි වැස්ම ඉවත් කළාය. ඇගේ මුහුණෙන් පියකරු බව දුටු මම ඇසිපිය නොහෙලා එදෙස බලා සිටියෙමි. ඇගේ රූව

ශෝභාව දුටු මා මහත් චංචල භාවයට පත් වුනෙමි.

''මා මෙහි පැමිණියේ රෙදි ඕනෑ කමකට නෙවෙයි. මා පැමිණියේ ඔබ කැමති නම් ඔබ සමඟ අද හවස ගත කිරීම සඳහායි. මට අවශ්‍ය වන්නේ සුළු ආහාර ටිකක් පමණයි.'' තරුණිය කීවාය. මම මහත් ප්‍රීතියට පැමිණියෙමි. වහාම මිදි රසත්, කැවිලි වර්ගත්, පලතුරුත් ගෙනෙන ලෙස වැඩකාරයකුට කීවෙමි. අපි කැවිලි හා පලතුරු අනුභව කොට මිදිරස බී ඉතා සතුටින් එදින මධ්‍යම රාත්‍රිය වනතෙක් ගත කළෙමු. මෙය මගේ ජීවිතයේ ඉතාම සුන්දර සැන්දෑවක් විය. මධ්‍යම රාත්‍රිය ළඟා වන විට ඇය තව දින තුනකින් නැවත පැමිණෙන බව පවසා මගෙන් සමුගත්තාය. එවේලෙහි මගේ සිත ද ඇය ගෙන ගියාක් මෙන් මට හැඟිණි. දින තුනකට පසු ඇය නැවත පැමිණෙන තෙක් මම මග බලා සිටියෙමි. හරියටම දින තුනකට පසු ඇය නැවත මා හමුවීමට පැමිණියාය. එදින ද මම ඇය ඉතා ආදරයෙන් පිළිගතිමි. එදින ද අපි ඉතා සතුටින් ගත කළෙමු. ඉන්පසු නැවත තවත් දින තුනකට පසු ඇය පැමිණෙන බව කියා සමුගෙන පිටත් වුවාය. නැවත දින තුනකට පසු තුන්වෙනි වරටත් පැමිණි ඇය, ''මා ගැන ඔබ කුමක් සිතන්නේ ද'' යි මගෙන් ඇසුවාය. මම ඇයගේ රූපශ්‍රියට වශී වී ඇති බවත්, ඇයට මහත් සේ ආලය කරන බවත් මම පැවසුවෙමි. ''මට වඩා රූපශෝභාවෙන් යුක්ත, මට වඩා තරුණවූත් මා හඳුනන ස්ත්‍රියක් සිටී. මා ඇයට ඔබ ගැන තොරතුරු කියා තිබේ. ඇය ඔබ දැකීමට මහත් ආශාවෙන් සිටියි. මම ඇය මෙහි කැඳවාගෙන එනවාට ඔබේ අකමැත්තක් නැද්ද?''යි තරුණිය මගෙන් ඇසුවාය. ''ඔබේ යෙහෙළිය කැඳවාගෙන ඒම පිළිබඳව අකමැත්තක් නැත. එහෙත් ඔබ කෙරෙහි බැඳී ඇති මගේ සිත වෙනස් කළ නොහැකිය.'' යි මම කීවෙමි.

යෙහෙලිය සමග තව දින දෙකකට පසු පැමිණෙන බවත්, පැමිණි විට හොඳින් සලකන ලෙසත් පවසා තරුණිය ගියාය. මම ද තරුණියන් දෙදෙනා එනතුරු නොඉවසිල්ලෙන් බලා සිටියෙමි. දින දෙකකට පසු තරුණිය කියන ලද වේලාවට ඔවුහු දෙදෙනා පැමිණියහ. මගේ නිවසට ඇතුල් වූ වහාම දෙදෙනාම මුහුණු වැස්ම ඉවත් කළහ. මට පළමුවෙන් මුණ ගැසුන ස්ත්‍රියට වඩා ඇයගේ යෙහෙලිය රූප සම්පන්න වූවාය. මම මහත් ආශාවෙන් ඇය දෙස බැලුවෙමි. ඇයද මා දෙස බැලූ ආකාරයෙන් මට කැමති බව වැටහිණි. මම අපට ආහාර පිළියෙල කිරීමට සේවකයකු ට දැන්වූවෙමි. මම ඉතා රසවත් ආහාර පාන වලින් ඔවුන්ට සංග්‍රහ කළෙමි. තරුණියගේ යෙහෙලියගේ සිත් අද ගන්නා සුළු වූ ඇස් වලට මම වශී වුනෙමි. මගේ සිත තුළ ඇය කෙරෙහි මහත් වූ ආලයක් ඇති විය. ඇයද මට ආලය කරන බව සිනාවෙන් හා කතාවෙන් මට වැටහිණි. මට පළමුවෙන් හමුවූ ස්ත්‍රිය අප දෙදෙනා දෙස බලා සිනා සෙන්නට වූවාය. ''ඔබේ සිතේ මා කෙරෙහි ඇති බැඳීම වෙනස් නොකරන්නේය යන ගිවිසුම කඩ කළා නොවේ ද'' යි ඇය මගේන් ඇසුවාය. ''ඔබේ මිතුරියක සමග පැමිණි විට සංග්‍රහ නොකළේ නම් ඔබ දෙදෙනාම මට දොස් කියන බැවින් මෙසේ සංග්‍රහ කළෙමි'' යි මම ද සිනාසෙමින් කීවෙමි.

පළමුව මට හමුවූ ස්ත්‍රිය ටික වේලාවකින්, නැවත එන බව කියා නැගිට ගියාය. ඊට ස්වල්ප වේලාවකට පසු, මා සමග තනිවූ තරුණියගේ මුහුණේ පාට වෙනස් වීය. ඇය බලවත් සේ වෙව්ලන්නට විය. ඇය කෙලින් කර අල්ලා ගැනීමට මම වැඩකාරයකුට කතා කරන අතර ඇය මගේ අතේ දීම මළාය. මම වහාම පලමු ස්ත්‍රිය සොයා ගිය විට, ඇය වීදියේ දොර හැරගෙන ගිය බව මිනිස්සු කීහ.



දෙවනුව හමු වූ ස්ත්‍රියගේ මරණය සිදු කළේ පළමුව හමු වූ ස්ත්‍රිය විසින් යයි මම සැක කළෙමි. ඇය දූන් වයින් වීදුරුවට වස දමා තිබිණි. මෙම හදිසි මරණය නිසා මම මහත් සේ බියට පත්වුයෙමි. කුමක් කරම් දැයි, මට කුමක් සිදුවේ දැයි සිතා කැගැසුවෙමි. එහෙත් නිකරුනේ කාලය ගත කිරිමෙන් වැඩක් නැති බව සිතා මම වහාම ක්‍රියාත්මක වුයෙමි. මගේ නිවසේ බිම අල්ලා ඇති කිරිගරුඬ කැල්ලක් ඉවත් කිරීමට වැඩකාරයන්ට නියම කළෙමි. ඉන්පසු එතැන ලොකු වලක් හාරා එහි තරුණියගේ මෘත ශරිරය තැන්පත් කළෙමි. ඊලඟට වල වසා ඊට උඩින් කිරිගරුඬ කැල්ලක් තබා පෙර තිබූ අන්දමටම පොළව සකස් කළෙමි. මගේ බඩු සියල්ලම ගෙට දමා දොරගුලු දමා මගේ මුදල් පමණක් ගෙන මගියකු සේ ඇඳගෙන එම නිවසින් පිටත් වීමි. ඉන්පසු ගේ අයිතිකාරයා හමු වී නිවසේ කුලිය ද තවත් අවුරුද්දක් සඳහා මුදල් ද ගෙවා ඔහුට යතුර භාර දී මම හදිසියේම කයිරෝ හි සිටින බාප්පා හමුවිමට යාමට ඇති බව කියා ඔහුගෙන් සමුගෙන ඩැමැස්කස් නගරයෙන් පිට වුනෙමි.

දින කිපයකින් මම කයිරෝ නගරයට පැමිණියෙමි. එහි සිටි බාප්පාවරු පිළිබඳ කිසිම ආරංචියක් නොලැබුණු බැවින් ඔවුන් බැලීමට කයිරෝ නගරයට පැමිණි බව මම කීවෙමි. බාප්පාවරු මා දැක පුදුම වූහ. තවද පියාගෙන් අවසරයක් නොගෙන කයිරෝ නගරයට යාම ගැන ඔවුහු අසතුටු වූහ. එහෙත් මා ඔවුන් එන තුරු ඩැමස්කස්හි බලා සිටි බවද අන්තිමේදී ඔවුන්ට අනතුරක් සිදුවී ඇත් දැයි බැලිමට පැමිණි බවද මම කිවෙමි.

මම බාප්පලාගේ නවාතැන් පළෙහි නැවති දින කීපයක් ගත කළෙමි. කයිරෝ නගරයේ ඇති සියලුම දේවල්

බලා සතුටු වුනෙමි. මට මිසර දේහයේ තවත් දේවල් බැලීමට ඇති බැවින් බාප්පලාගේ නවාතැනෙන් තරමක් දුරින් පිහිටි නවතැනකට ගොස් නැවතුනෙමි. බාප්පාවරුන් වෙළෙඳාම අවසන් කොට ආපසු යාමට සූදානම් වූ නිසා මම එහේ වෙනත් නවාතැනක් සොයාගෙන ඔවුන් ආපසු යන දිනයේ සැඟවී සිටියෙමි. බාප්පාවරුද කයිරෝ නගරයේ සෑම තැනම මා සෙවූ නමුත් සොයා ගත නොහැකිව ආපසු සිය රටට ගියහ.ඉන්පසු මම කයිරෝ නගරයේ තුන් අවුරුද්දක් නැවතී සිටි මිසර දේශයේ ඇති සියලුම පුදුම දේවල් බැලීමි. ඩැමැස්කස් නුවර තිබූ මගේ කුලීගෙට මා කයිරෝ නගරයේ සිටියදීත් ගෙවල් කුලිය යැව්වෙමි.

අවුරුදු තුනකට පසු මම ඩැමැස්කස් නුවර මගේ ගෙවල් හිමියා හමුවීමට ගියෙමි. ඔහු විසින් මා ඉතා ආදරයෙන් පිළිගෙන මගේ කුලී නිවසේත් දොර ඇර පෙන්වන ලදී. නිවසත් එහි වූ භාණ්ඩත් තිබූ ආකාරයෙන්ම තිබෙන බවද ඔහු විසින් පෙන්වන ලදි. කුලි නිවසේ සිටි අන්තිම දවසේ මා තරුණියන් දෙදෙනා සමග ආහාර අනුභව කරන ස්ථානය ශුද්ධ කරද්දී ලොකු මුතු දහයක් අල්ලා ඇති රත්රන් මාලයක් දක්නට ලැබිණි. එය වස කැවී මරණයට පත්වූ තරුණියගේ බෙල්ලේ තිබූ මාලය විය හැකි බව ද ඇය මියයන වේලාවේ එය කැඩී විසි වෙන්නට ඇතැයි ද මම සිතුවෙමි. එසේ සිතා මාලය රෙදි කැබැල්ලක ඔතා මා ළඟ තබා ගතිමි.

නැවතත් ඩැමැස්කස්හි පදිංචි වූ මම මගේ පැරණි යහලුවන් සමග විනෝද වෙමින් කාලය ගත කළෙමි. මෙසේ විනෝද වීම සඳහා මා අත තිබූ මුදල් සියල්ලම වියදම් කළෙමි. වියදමට මුදල් ලබා ගැනීම සඳා තරුණියගේ රන් මාලය විකිණීමට අවසාන වශයෙන් සිතුවෙමි. මම වෙළෙඳපලට

ගොස් තැරැව් කාරයන්ට මාලය පෙන්වා, එය විකුණා දෙන ලෙස කීවෙමි. තැරැව් කාරයන්ද මාලයේ ලස්සන දැක පුදුම වී එය ඉතා අනර්ඝ ආභරණයක් බැවින් විශාල මුදලක් ලබා ගත හැකි බව පැවසූහ. එක් තැරැව්කාරයෙක් මා සමග ගොස් මගේ ගෙවල් අයිතිකාර ආභරණ වෙළෙන්දාගේ සල්පිළෙහි නවතා, වෙනත් වෙළෙන්දන් සොයන්ට ගියේය.

ටිකවේලාවකට පසු තැරැව්කාරයා ආපසු පැමිණ, මට පැත්තකට අඬගසා එය මසුරන් දෙදහසක් වටිනාබව නොකියා මසුරන් පනහක් වටිනා බව කිවේය. මුතුවල වටිනාකම නොදත්කම නිසාත්, මුදල් අවශ්‍යතාව නිසාත් මම එය දී මසුරන් පණහක් ගැනීමට කැමති බව කීවෙමි. මසුරන් දෙදෙහක් වටිනා මාලයකට මසුරන් පණහක් ගැනීමට කැමති වීමෙන්, මා මාලයේ වටිනාකම නොදන්නා බවත්. වෙළෙන්දා දැනගත්තේය. එය මා විසින් සොරකම් කරන ලද මාලයක් බව ඔහු සිතුවේය. මගේ පණිවිඩය ගෙන ආපසු ගිය තැරැව්තාරයා අල්ලාගත් වෙළෙන්දා ඔහුත් කැටුව විනිශ්චයකාරතුමා ළඟට ගියේය. විනිශ්චයකාරතුමාට රන්මාලය පෙන්වා, ''විනිශ්චයකාරතුමනි, මගෙන් සොරකම් කරගන්නා ලද මාලයක් ගෙන ආවෙමි. සොරා වෙළෙන්දෙකුගේ විලාශයෙන් දැන් වෙළෙඳපලේ සිටියි. ඔහු මසුරන් දෙදහසක් වටිනා මාලයකට මසුරන් පණහක් ගැනීමට කැමති වීමෙන් මෙය සොරකම් කරන ලද මාලයක් බව පෙනේ'' යනුවෙන් වෙළෙන්දා විනිශ්චයකාර තුමාට කීවේය. විනිශ්චයකාරතුමාගේ මිනිසුන් පැමිණ මා අල්ලාගෙන ඔහු ඉදිරියට ගෙන ගියහ. එවිට, විනිශ්චයකාරතුමා මාලය පෙන්වා. ''මෙය විකිණීමට ගෙන ආවේ නුඹ ද'' යි මගෙන් ඇසුවේය. එය මා විසින් ගෙනෙන ලද මාලය බැව් මම කිවෙමි. එය මසුරන් පණහකට විකිණීමට කැමතිවූයේ ද යි මගෙන්

ඇසුවේය. මම එය මසුරන් පණහකට විකිණීමට කැමති වූ බව ද පැවසුවෙමි. එවිට විනිශ්චයකාරතුමා මගේ අත් පා බැඳ තැලිමට සේවකයන්ට නියම කළේය. මා විසින් ඇත්ත කියන තුරු තැලීමට අණ කළේය. ඇත්ත පැවසුවොත් මා මිනීමැරුම් චෝදනාවකට හසුවන බැවින්, මාලය සොරකම් කරන ලද බව කීවෙමි. මාලය සොරකම් කිරිමේ වරදට දඬුවම ලෙස මගේ දකුණු අත කපනමෙන් අණ දී විනිශ්චකාරතුමා ගියේය.

මගේ අත කැපූ පසු අසල සිටි කීපදෙනෙක් එකතු වී මගේ අතට බෙහෙත් දමා වෙලා, මගේ කුලී නිවසට කැඳවාගෙන ගියහ. එහි ගිය ගොහොතෙහිම ගෙවල් අයිතිකාරයා පැමිණියේය. ඔහු මා ඉතා අවංක යහපත් කෙනෙකු ලෙස සිතා සිටි බවත්, මුදල් අවශ්‍යතාවක් තිබුණා නම්, එය තමාගෙන් ඉල්ලන්නට තිබුණ බවත් කියමින් දොස් කිවේය. තවද මා වැනි සොරකුට ඔහුගේ නිවස කුලියට දීමට අකමැති බැවින් තව දින තුනකින් නිවසින් බැහැර වන ලෙස ද කිවේය. මට සිදු වූ නින්දාව ගැන සිතමින් මම මහත්සේ කණගාටු වුයෙමි. මගේ පියාට මට සිදුවූ විපත ගැනත් මගේ නිර්දෝෂ භාවය ගැනත් කෙසේ කියම්ද යි සිතමින් ඉවසාගත නො හැකි ශෝකයෙන් පසු වුනෙමි.

මෙසේ පැය තුනක් පමණ කල්පනා කරමින් සිටින විට ගේ අයිතිකාරයා ද මාලය සොරකම් කළා යනුවෙන්, මට චෝදනාකළ වෙළෙන්දා ද විනිශ්චයකාරතුමාගේ මුලාදෑනීන් ද බලහත්කාරයෙන් මගේ ගෙට ඇතුල් වුහ. මා විසින් විකිණීමට ගෙන යන ලද මාලය, ආණ්ඩුකාරයාණන්ට අයිති බවත්, මීට අවුරුදු තුනකට පෙර, එය නැතිවූ දින පටන් තමාගේ දියණියක් ද දකින්නට නොලැබුණ බවත් ඔවුහු කීහ. එසේ පවසා මා අල්ලාගෙන ආණ්ඩුකාරතුමා ළඟට ගෙන ගියහ.

ආණ්ඩුකාරතුමා මා දෙස අනුකම්පාවෙන් බලා මා බැම්මෙන් නිදහස් කිරීමට නියම කළේය. ඉන්පසු විත්තිකාර වෙළෙන්දාටත්, ගේ අයිතිකාරයාටත් කතාකොට, ''මේ මාලය වික්කේ මේ මිනිසා ද'' යි ඇසුවේය. ඔවුහු ''එසේය'' යි පැවසූහ. එවිට ආණ්ඩුකාරතුමා, ''මේ මාලය මොහු සොරකම් නොකළ බව සත්තය. මොහුට කරන ලද අයුතුකම ගැන මම පුදුම වෙමි.'' යි පැවසුවේය. එවිට, මට ද ධෛර්යය ලැබී, ''ආණ්ඩුකාර උතුමාණනි'' සත්‍ය වශයෙන්ම මෙය මා විසින් සොරකම් නොකරන ලදී. විනිශ්චයකාරතුමාගේ අන පරිදි මට පහර දෙන විට එය ඉවසා ගත නොහැකිව මාලය සොරකම් කරන ලදැයි බොරුවක් කීවෙමි.'' යනුවෙන් කීවෙමි. එවිට, ආණ්ඩුකාරවරයා, බොරු පැමිණිලි කරන ලද වෙළෙන්දාට මට පමුණුවන්නට යෝජනා කළ දඬුවම් සියල්ලම පමුණුවන ලෙස නියම කළේය.

ඉන්පසු එහි සිටි සියලු දෙනාටම ඉවත්ව යන ලෙස දන්වා මට පමණක් එහි රැඳී සිටීමට කීවේය.

ඉන්පසු ආණ්ඩුකාරතුමා, මට කතා කරමින්, ''මගේ පුත්‍රය, මේ මාලය ඔබට ලැබුණු ආකාරය කිසිම බියක් නැතුව මා සමග කියන්න.'' යයි කීවේය. මම ද සිදු වූ සියලු දේ පිළිබඳ විස්තරය ආණ්ඩුකාරවරයාට පැවසුවෙමි. මෙම සිද්ධිය ප්‍රසිද්ධියේ කීමට වඩා හොර නාමයක් ඇසීම හොඳ යයි මා සිතන බව ද කීවෙමි. එවිට ආණ්ඩුකාරතුමා මා දෙසට හැරී, ''පුත්‍රය ඔබට ලැබුණ නින්දාව ගැන මා බොහෝ සේ කණගාටු වෙමි. එයට මා ද සම්බන්ධ බව ඔබට දැන් මම කියන්නෙමි. ඔබ විසින් කියන ලද තරුණියන් දෙදෙනා සහෝදරියන්ය. ඔවුන් දෙදෙනාගේම පියා මම ය. සුදුසු වයසට පැමිණි කල්හි මම ඇය කයිරෝ නගරයේ මගේ සහෝදරියගේ

පුත්‍රයාට සරණ පාවා දුනිමි. ටික කලකින් ස්වාමිපුරුෂයා මිය ගිය බැවින්, ඇය මිසරයේ නොමනා හැසිරීම් ඇති ස්ත්‍රීන් සමග මිත්‍ර වී ඇය ද අනාචාරයේ හැසිරෙන්නට වුවාය. ඇය මගේ සිත නොසතුටු කළාය. දෙවෙනි දියණිය ඉතා හොඳ කල්ක්‍රියාවෙන් යුක්තව කිසි දිනක මා අසතුටු නොකොට ජීවත් වුවාය. එහෙත් වැඩිමල් සහෝදරිය වරින් වර අපේ නිවසට පැමිණ දෙවෙනි දියණිය සමග මිත්‍ර වී ඇය ද නොමගට යැව්වාය. ඔබේ අතේ දි මියගියේ මගේ දෙවෙනි දියණිය යි. දෙවෙනි දියණිය මියගොස් දිනකට පසු කෑම මේසයට ඇය නොපැමිණි බැවින් ඇයට කුමක් සිදු වී ඇත්දැයි වැඩිමල් දියණිය ගෙන් ඇසුවෙමි.

මගේ වැඩිමල් දියණිය එයට පිළිතුරු නොදී අඩන්නට පටන් ගත්තාය. එබැවින්, මගේ දෙවැනි දියණියට කුමක් හෝ අන්තරාවක් වන්නට ඇතැයි සිතුවෙමි. බාල සහෝදරිය ගැන දන්නා දෙයක් කියන ලෙස මම ඇයට බල කළෙමි. පියාණනි, මගේ නංගි ඊයේ ඇයගේ ඉතාම හොඳ ඇඳුමක් ඇඳ මුතු මාලය කර පැළඳගෙන ගියාය. එවේලෙහි පටන් මට ඇය ගැන කිසි දෙයක් අසන්නට නොලැබුණේය. මා දන්නේ එපමණයි'' යනුවෙන් ඇය කීවාය. මා විසින් එදා සිට අද දක්වා දෙවෙනි දියණිය රටේ සෑම තැනම සෙව් නමුත් ඇයට සිදුවුයේ කුමක්දැයි දැනගත නො හැකි විය. වැඩිමහල් දියණියද සහෝදරියගේ වියෝවීම ගැන මහත් ශෝකයෙන් සිට කාලක්‍රියා කළාය.'' යනුවෙන් කීවේය.

ඉන්පසු තවදුරටත් ආණ්ඩුකාරවරයා කතා කරන්නට වුයේය. කෙසේ වෙතත් මාගේ පුත්‍රය, අපි දෙදෙනාම මහත් අවාසනාවන්තයන් වෙමු. දැන් ඉතින් මගේ හිතුවක්කාර නොමනා හැසිරීමෙන් යුතු වු දියණියන් වරුන් ගැන සිත සිතා

ශෝකවීමට හේතුවක් නැත. ඔබටද ශෝකවීමට හේතුවක් නැති බව කියමි. මගේ මියගිය දියණියන් දෙදෙනාටම වඩා රූපශ්‍රියෙන් යුත් තුන්වෙනි දියණියක් මට සිටියි. ඇයගේ ගතිගුණ ඇගේ වැඩිමහල් සොයුරියන්ගේ ගතිගුණ වලට වඩා බොහෝ වෙනස්ය. ඇය ඉතා යහපත් ගතිගුණවලින් යුත් ඉතා උතුම් චරිතයක් ඇති තැනැත්තියකි. මම ඔබට මගේ තුන්වෙනි දියණිය කරකාර බැඳ දෙන්නෙමි.'' යනුවෙන් පැවසුවේය. මමද ඔහුගේ යෝජනාවට කැමති වුනෙමි. තුන්වෙනි දියණියගේ සහ මගේ විවාහය පසුවදාම ඉතා උත්සවශ්‍රියෙන් යුත්තව කරන ලදි. ආණ්ඩුකාරයාගේ නිවසෙහිම මම වාසය කරන්නට ලැබුණි. ආණ්ඩුකාරවරයා මා බොරුවට වරදකාරයා කරන ලද වෙළෙන්දාට දඩුවම් කොට එයින්ද සෑහීමකට පත්නොවී ඔහුට අයිති සියලු දේපල රාජ සන්තක කළේය. මට බොහෝ වස්තුවද ඕනෑතරම් සේවක සේවිකාවන්ද ලබා දුන්නේය.

මම මගේ පියාට හා බාප්පා වරුන්ට මා ගැන සියලු තොරතුරු දන්වා යැවුවෙමි. මගේ පියාගේ දේපල හා බාප්පා වරුන්ගේ දේපල සියල්ලම මට අයිති කර දෙන බවත් මා සහ මගේ භාර්යාව බැලීමට පැමිණෙන බවත් දන්වා ඇත.

මගේ සියලු සම්පත් දැක ඔවුන් ප්‍රීතියෙන් පිනා ගොස් ඉමහත් සතුටට පත්වෙනු ඇත. එහෙත් මාගේ දකුණු අත නොමැති බව දැනගත්විට ඔවුන් කුමක් කරනු ඇත්දැයි මට සිතාගත නොහැකිය.'' යි මෝසල්හි තරුණයා තමාගේ කථාව කියා අවසන් කළේ ය. මෙය මා විසින් මෝසල්හි තරුණයාගෙන් අසන ලද අපූර්ව කතාන්දරයක් බව වෛද්‍යාචාර්ය වරයා කීවේය.

# කුදාගේ කථාව.

ඈත අතීතයේ අරාබියේ එක්තරා නගරයක සන්නාලියෙක් වාසය කළා. ඔහු දිනක් ඇඳුමක් මසමින් සිටිද්දී ඔහුගේ සල්පිල ඉදිරියට පැමිණි කුදෙක් සිංදු කියමින් නටන්නට පටන් ගත්තා. කුදාගේ සිංදුව හරිම මිහිරියි. නැටුමත් ඉතාම චමත්කාර ජනකයි. සන්නාලියා කුදාගේ නැටුම් බලා මහත් සේ සතුටුවුනා. තමා ආදරය කරන බිරිඳටද මෙම නැටුම් පෙන්වීමට ඇත්නම් කොපමණ හොඳදැයි සන්නාලියා හිතුවා. එසේ සිතූ ඔහු කුදට කථා කොට තමා සමග තම නිවසට යාමට කැමති දැයි කුදගෙන් ඇසුවා. කුදා සන්නාලියා සමග ඔහුගේ නිවසට ගොස් නැටුම් පෙන්වීමට කැමති වුනා. හැන්දෑවන විට සන්නාලියා තම සල්පිළ වසා දමා කුදාත් සමග තම නිවසට ගියා. කුදාගේ සිංදු හා නැටුම් පිළිබඳව තම භාර්යාවට කිව්වා.

සන්නාලියාගේ භාර්යාවද කුදාගේ නැටුම් බැලිමට කැමැත්තෙන් ඔහු ආදරයෙන් පිළිගත්තා. ''නැටුම් පෙන්වීමට පෙර ඔහුට සංග්‍රහ කළයුතු යයි'' කී සන්නාලියාගේ භාර්යාව කුදාට මාළු සහිත කෑම පිඟානක් ගෙනවිත් කුදට කෑමට දුන්නා අවාසනාවකට මෙන් ඔහු කෑම අනුභව කරද්දී මාළු

කටුවක් උගුරේ හිරවුනා.

කුදාගේ උගුරේ හිරවු මළු කටුව ඉවත් කිරිමට සන්නාලියාත් ඔහුගේ බිරිදත් බොහෝ උත්සාහ කළා. නමුත් කිසිම උත්සාහයක් සාර්ථක වුනේ නැහැ. මාළු කටුව උගුරේ හිරවීම නිසා හුස්ම ගැනීමට බැරිව කුදා එතැනම මළා.

කුදා මැරුණ බව දැනගත් සන්නාලියාත් ඔහුගේ බිරිඳත් හොඳටම බය වුනා. කුදාගේ මරණය පිළිබඳව ඔවුන් දෙදෙනා වැරදි කරුවන් වී මිනී මරුවන් සඳහා දෙන දඬුවම් විඳීමට සිදුවේ යයි සිතා මෙම වරදින් ගැලවීමට උපායක් කල්පනා කළා. එසේ කල්පනා කොට ඔවුන් දෙදෙනා කුදාගේ මළ කඳ ඔසවාගෙන අසල වූ වෛද්‍යාචාර්යයාගේ නිවසේ තරප්පු පේලිය පාමුලට ගොස් මේ දෙදෙනා විසින් අසාධ්‍ය රෝගියෙකු ප්‍රතිකාර ලබා ගැනිමට කැඳවා ගෙන පැමිණි බව දැන්වුවා. එවිට කළුවරේම වෛද්‍යාචාර්ය වරයාගේ මෙහෙකාරිය තරප්පු පේලිය බැසගෙන පහළට ආවා. තමාගේ රෝගියාට අසාධ්‍ය බවත් ඉතා ඉක්මනින් ප්‍රතිකාර අවශ්‍ය බවත් පවසා මෙහෙකාරිය අතට ප්‍රතිකාර සඳහා අවශ්‍ය මුදල්ද සන්නාලියා දුන්නා. මෙහෙකාරියද ඉක්මනින් ආපසු ගොස් මේ බව වෛද්‍යාචාර්ය වරයාට දැන්වුවා. සන්නාලියා හා බිරිඳ එකතු වී කුදාගේ මළ කඳ තරප්පු පේලියේ මුදුනට ගෙනගෙ ාස් එහි තැබුවා.

කුදාගේ මළකඳ තරප්පු පේලිය මුදුනේ තැබූ සන්නාලියා හා බිරිඳ එහි නොරැඳී වහාම ආපසු ගියා. මෙහෙකාරියගෙ න් රෝගියා ගැන තොරතුරු ඇසූ වෛද්‍යාචාර්ය වරයා අත්පිට මුදල් ලැබීම ගැන මහත් සේ සතුටට පත්වුනා. ඉතා ඉක්මනින්ම රෝගියාට ප්‍රතිකාර කළයුතු යයි ද සිතුවා. මෙහෙකාරියට ඉක්මනින් එළියක් රැගෙන එන ලෙස දන්වා



වහාම රෝගියා බැලීමට යාමට සූදානම් වුනා. මෙහෙකාරිය එළියක් ගෙනෙන තුරු බලා නොසිට වෛද්‍යාචාර්ය වරයා ඉක්මන් ගමනින් තරප්පු පේලියේ මුදුනට ආවා. කලබලයෙන් අඳුරේ පැමිණි වෛද්‍ය වරයා කූදාගේ මළ කඳේ හැපුණා. මළ කඳ තරප්පුවෙන් පහළට පෙරලුනා. වෛද්‍යවරයා වහාම තරප්පුවෙන් බැස රෝගියා පරීක්ෂා කරන්නට පටන් ගත්තා. මෙහෙකාරියද එළියක් රැගෙන පැමිණියා. රෝගියා මිය ගොස් ඇති බව වෛද්‍යාචාර්ය වරයාට පෙනුනා. තමාගේ ඇගේ හැපී වැටීමෙන් රෝගියා මියගොස් ඇති බව ඔහු හිතුවා. ඔහු සියලු දෙවියන්ගෙන් සමාව ඉල්ලා සිටියා. වෛද්‍යාචාර්ය වරයා මහත් කම්පාවටත් භීතියටත් පත්වුනා.

''අනේ මා වගේ අවාසනා වන්තයෙක්. එළියක් නැතිව කළුවරේ තරප්පුව බැසීමට පැමිණි නිසා තමයි මේ සියල්ලම සිදු වුනේ'' යයි කියමින් පසුතැවිලි වුනා.

කූදා මැරීමේ චෝදනාවට වරද කරුවී තමාට දඬුවම් විදිමට සිදු වේයයි'' වෛද්‍යාචාර්ය වරයා හොඳටම බය වුනා. ඔහු වහාම මළමිණිය තමාගේ භාර්යාවගේ කාමරයට ඇදගෙන ගියා. එය දුටු භාර්යාව බියෙන් වෙව්ලා ක්ලාන්තවුවා. ඇයට සිහිය ලැබුණ විගසම මෙම මළ කඳ ඉවත් කිරීමට ක්‍රමයක් සිතුවා.

වෛද්‍යාචාර්ය වරයාගේ නිවසට යාබදව වෙළෙන්දකුගේ නිවසක් තිබුණා. වෙළෙන්දා රජුට එඬරු, කිරි, තෙල් ආදිය සපයන තැනැත්තෙක්. ඔහුට වෙඬරු ආදිය ගබඩා කර තබන ලොකු ගබඩා කාමරයක් තිබුණා. ගබඩා කාමරයේ දුම් කවුළුව තිබුණේ වෛද්‍යාචාර්ය වරයාගේ නිවසේ උඩු මහලට යාබදවයි. වෛද්‍යාචාර්යවරයා හා ඔහුගේ බිරිඳ එකතු වී මළ කඳෙහි උරහිස් දෙකෙහි තොන්ඩු

දෙකක් ගැට ගසා ඒ තුලින් කඹයක් යැව්වා. ඉන්පසු ඉතා ප්‍රවේශමෙන් මළ කඳ වෙළෙන්දාගේ දුම්කවුළුව තුළින් පහලට බැස්සුවා. මළ කඳ පණපිටින් සිටින්නාක් මෙන් ගබඩා කාමරයේ බිත්තියට හේත්තු වන සේ තබා ඉතා ප්‍රවේශමෙන් කඹය ආපසු ඇදගත්තා. ඉන්පසු වෛද්‍යාචාර්ය වරයා හා බිරිඳ හෙමින් සිරුවේ තමාගේ කාමරයට ආපසු ගියා.

ටික වේලාවකට පසු රාත්‍රි භෝජන සංග්‍රයකට ගොස් පැමිණි වෙළෙන්දා ලන්තෑරුමකුත් අතින් ගෙන තමාගේ ගබඩා කාමරයට ගියා. දුම් කවුළුව ළඟ මිනිහෙක් හේත්තු වී සිටින බව ඔහු දුටුවා.

වෙළෙන්දා විශ්මයට පත්වුනා. මේ සිටින්නේ හොරෙක් යයි සිතා බියටත් කෝපයටත් පත්ව මුගුරක් ගෙන හොරාට පහර දෙන්නට පටන් ගත්තා. ''අනේ, අනේ මෙතෙක් කල් මම සිතාගෙන හිටියේ මීයන් විසින් මගේ වෙඩරු ආදිය කා විනාශ කරනවා කියායි. නමුත් දැන් මට තේරෙනවා වෙඩරු සොරකම් කළේ කව්ද කියලා. මේ හොරා තමයි හැමදාම දුම් කවුළුවෙන් බැහැලා මගේ වෙඩරු සොරකම් කරලා තියෙන්නේ'' ආදී වශයෙන් කියමින් දිගටම පහර දුන්නා. එවිට මළ කඳ බිම වැටුණා. වැටුණු මිනිහා පරීක්ෂා කරන විට, ඔහු නොසෙල් වී ඇති බව දැන වෙළෙන්දා බය වුනා. හොරා මිය ගොස් ඇති බවත් ඔහු කුදෙක් බවත් වෙළෙන්දාට පෙනුනා. තමාගේ පහර දීම නිසා සොරා මිය ගොස් ඇතිබව දැක ඔහු හොඳටම බය වුනා. තමාගේපහරදීම දරුණු වැඩි නිසාත් මිය ගොස් ඇත්තේ කුදෙක් නිසාත් ඔහුට මහත් අනුකම්පාවක් ද ඇතිවුනා. ''මම මිනිසෙකු මැරුවෙමි. මම සොරාට ප්‍රමාණයට වඩා දඬුවම් කලෙමි. අනේ දෙවියනේ මට සමාව දෙන්න,'' මම හොරාගේ කුදුකම නොදැක දඬුවම්

කළෙමි,, පහර දුන්නෙමි.. ඔබේ කුදුකම දක්කානම් මම ඔබට පහර නොදෙන්නෙමි. නුඹ මෙහි නොසිට මගේ වෙඬරු සියල්ලම ගෙන ගියානම් වඩා හොඳයි'' ආදි වශයෙන් කියමින් වෙළෙන්දා කෑගසන්නට පටන් ගත්තා. එහෙත් ඔහු මිනී මරුවෙක් බව හදිසියේම මතක්වුනා. මෙම මිනීමැරුම් චෝදනාවෙන් ගැලවෙන්නට මගක් ගැන සිතන්නට පටන් ගත්තා.

වෙළෙන්දා මළ මිනිය උරයේ තබාගෙන වීථියේ කෙළවරට ගොස් සල්පිළක් ඉදිරියේ කෙලින් සිටුවා පසු නොබලා ආපසු ගියා. ඒ අවස්ථාව වන විට මධ්‍යම රාත්‍රියද පසවී පසුදා එළිවෙන්නට කිට්ටු වී තිබුණා.

එදින රාත්‍රියේ මිතුරන් සමග මත් පැන් බොමින් ඉතා ප්‍රීතියෙන් ගත කළ ක්‍රිස්තියානි වෙළෙන්දෙක් එළිය වැටෙන්නට පෙර ස්නානය කිරීමට සිතා මළ කඳ තිබුණ වීථිය දිගේ ගමන් කළා. එළිය වැටෙන විට සෙනග පිරෙන බැවින් ඊට පෙර ස්නානය කිරිමට අවශ්‍ය නිසා ඔහු වේගයෙන් ගමන් කළා. එසේ ගමන් කරද්දී සල්පිල ඉදිරියේ සිටුවා තිබු මළමිනියේ වෙළෙන්දා හැපී මළ මිණිය බිම ඇද වැටුනා. සල්පිල ඉදිරියේ සිටගෙන හිටියේ හොරෙක් යයි සිතා ක්‍රිස්තියාණිකාර වෙළෙන්දා ද ඔහුට පහර දෙන්නට පටන් ගත්තා. ''මෙන්න හොරෙක්, මෙන්න හොරෙක්'' යනුවෙන් වෙළෙන්දා කෑගැසුවා. මේ හඬ ඇසී විථියේ මුරකරුවා දුවගෙන ආවා.

මුරකරුවා පැමිණ බලන විට. කුදා මැරී ඇති බැව් දුටුවා. ක්‍රිස්තියානිකාර වෙළෙන්දෙක් විසින් මහමදාගම් කාරයෙකු වන කුදාට ගසා මැරිම ගැන මුර කරුවාට කෝපයක් ඇතිවුනා.... ''ක්‍රිස්තියානි කාරයෙකු විසින් බය

නැතිව මහමදාගම් කාරයකුට ගසා මරණ ලද්දේ දැයි'' කියමින් මුරකාරයා වෙළෙන්දාගේ අතින් ඇදගෙන විනිශ්චයකාර තුමා වෙත ගෙන ගියා. තමා අතින් ගැසූ පහරවල් නිසා කූදා මිය යන්නට ඇතැ යි ක්‍රිස්තියානි කාර වෙළෙන්දා සිතුවා. ඔහුත් මහත් සේ භීතියට පත්වුනා.

විනිශ්චය කාර තුමා ඉදිරියේදී කූදා මැරීමේ වරද පිළිගැනීමට ක්‍රිස්තියානි කාර වෙළෙන්දාට සිදුවුනා. කූදා සුල්තාන් මාලිගයේ සේවය කළ කවටයෙක් නිසා රජතුමාට මෙම සිද්ධිය දැන්විය යුතු බව විනිශ්චය කාර තුමා තීරණය කළා. එබැවින් රජතුමා හමුවී එන තුරු ක්‍රිස්තියානි කාර වෙළෙන්දා මරණයට පත් කිරීම ප්‍රමාද වුනා.

විනිශ්චය කාර තුමා වහාම ගොස් සුල්තාන් රජ තුමාට මෙම මිනී මැරුම පිළිබඳව කිව්වා. ''මහමදාගම් කාරයෙකු මැරූ, ක්‍රිස්තියානි කාරයෙකු කෙරෙහි කරුණාව පෙන්වීමට අකමැත්තෙමි'' යනුවෙන් පැවසූ රජතුමා මිනී මරුවාට මරණීය දණ්ඩනය නියම කළා. මහමදාගම් කාරයකු මැරීම නිසා වරදකරුවකු වූ ක්‍රිස්තියානි කාර වෙළෙන්දා එල්ලා මරණ බවට නුවර සෑම තැනම ප්‍රසිද්ධ කිරීම සඳහා මිනිසුන් යැව්වා. ක්‍රිස්තියානිකාර වෙළෙන්දා පෝරකය ළඟට ගෙනවිත් එල්ලා මැරීමට සූදානම් වන විට. සෙනග අතරින් ඉදිරියට දිවගෙන පැමිණි වෙඩරු ගබඩා ව හිමි රසකැවිලි වෙළෙන්දා දඬුවම නවත්වන ලෙස කෑ ගසා කිව්වා. ''ඔය මිනී මැරුම සිදු කළේ ක්‍රිස්තියානි කාර වෙළෙන්දා නොවෙයි. මිනි මරුවා මමයි. ඒ නිසා මට මරණ දඬුවම දෙන්න'' යනුවෙන් ඔහු ප්‍රකාශ කළා. මිනී මරුවා එල්ලා මැරීමට පැමිණි මුලාදෑනියා එල්ලා මැරීම නවත්වා රස කැවිලි වෙළෙන්දාගෙන් මිනී මැරුම පිළිබඳ විස්තර ඇසුවා.

තමාගේ වෙඬරු සොරකම් කිරීමේ වරදට කුදාට පහර දුන් බවත් එවිට ඔහු මැරුණ බවත් ඉන්පසු වීථියේ සල්පිල ඉදිරියේ මළ සිරුර තබා ගිය සැටිත් කීවා. තමා විසින් කරන ලද වරදට නිර්දෝශී අයකු දඬුවම් විඳිනවා දකින්නට අකමැති බැවින් තමාට එම දඬුවම දෙන ලෙස රසකැවිලි වෙළෙන්දා විනිශ්චය කාර තුමාගෙන් ඉල්ලා සිටියා. ක්‍රිස්තියානි කාර වෙළෙන්දා නිදහස් කරන ලෙසත් රස කැවිලි වෙළෙන්ද එල්ලා මරණ ලෙසත් විනිශ්චයකාර තුමා අණ කළා. රසකැවිලි වෙළෙන්දාගේ බෙල්ලට තොණ්ඩුව දමන විටම සෙනග අතරින් ඉදිරියට පැමිණි වෛද්‍යාචාර්ය වරයා මෙම දඬුවම නවත්වන ලෙස ඉල්ලීමක් කළා. ''ස්වාමිනී, ඊයේ රෑ අසාධ්‍ය රෝගියෙකු මගේ නිවසට ගෙනත් තිබුණා. ඔහු ගෙන විත් තිබුණේ නාඳුනන මිනිසෙකු හා ගැහැණියකු විසින් ඔවුන් මේ ලෙඩා මගේ නිවසේ තරප්පු පේලිය මුදුනේ තබා ආපසු ගොස් තිබුණා. මෙහෙකාරියට එලියක් ගෙන එමට කිව් නමුත් ඇය ඊට ප්‍රමාද වීම නිසා මම කළුවරේම ලෙඩා බලන්න ගියා.එවිට මා ලෙඩාගේ ඇගේ හැප්පීම නිසා ඔහු තරප්පුවෙන් පහලට වැටී මැරුණා. එබැවින් කුදාගේ මරණයට වග කිව යුත්තේ මමයි. කරුණාකර රසකැවිලි වෙළෙන්දා නිදහස් කරන්න, මිනී මැරුම් චෝදනාවට වරදකරු වීමේ දඬුවම මට දෙන්න'' යනුවෙන් කියා සිටියා.

වෛද්‍යාචාර්ය වරයාගේ කතාව ඇසූ විනිශ්චයකාර වරයා රසකැවිලි වෙළෙන්දා නිදහස් කරන ලෙස අණ කළා. කුදා ගේ මිනීමැරුමට වැරදි කරු වන වෛද්‍යාචාර්ය වරයා එල්ලා මරණ ලෙස අණ කළා. ඔහු එල්ලා මැරීමට සූදානම් වන විට සෙනග අතරින් සන්නාලියා දිවගෙන පැමිණියා. වෛද්‍යාචාර්ය වරයා නිදහස් කරන ලෙස ඔහු කෑ ගසා කිව්වා. ''සවාමිනි කුදා මැරීමේ වරදට දඬවම් විඳිය යුත්තේ

වෛද්‍යාචාර්ය වරයා නොවෙයි. වැරදි කාරයා මමයි. ඊයේ රාත්‍රියේ බීමත්ව සිංදු කියමින් නටමින් සිටි කුදා මගේ නිවසට කැඳවා ගෙන ගියේ මමයි. මගේ බිරිඳ දුන් කෑම අනුභව කරද්දී මාළු කටුවක් උගුරේ හිරවීම නිසයි කුදා මැරුණේ. ''එබැවින් කුදාගේ මරණයට වග කිව යුත්තේ මමයි. මට සුදුසු දඬුවමක් දෙන්න'' යනුවෙන් සිදුවූ සියල්ල සත්නාලියා කිව්වා. මේ සියල්ල අසා සිටි විනිශ්චය කාර වරයා මහත්සේ පුදුමයට පත්වුනා. වෛද්‍යාචාර්ය වරයා නිදහස් කර සත්නාලියා එල්ලා මරණ ලෙස විනිශ්චයකාර වරයා නියම කළා.

තඩු ඇසීම මේ ආකාරයටම සිදු වෙද්දී සුල්තාන් රජතුමාට සේවය කරන කුදා හෙවත් කවටයා අවශ්‍ය වී ඔහු කොහේ දැයි සේවකයකුගෙන් ඇසුවා. කුදා ඊයේ සවස බීමත්ව මාලිගාවෙන් පිටතව ගොස් ආපසු නොපැමිණි බවත්, අද උදේ ඔහුගේ මළ සිරුර සොයාගෙන ඇති බවත් සේවකයා රජතුමාට දැන්වූවා. තව ද, කුදා මැරීම පිළිබඳව වරදකරු එල්ලා මැරීමට සූදානම් වන විට රසකැවිලි වෙළෙන්දෙක් පැමිණ වරද ඔහු පිළිගත් බවත්, ඊළඟට රස කැවිලි වෙළෙන්දා එල්ලා මැරීමට සූදානම් වන විට වෛද්‍යාචාර්ය වරයෙක් පැමිණ කුදා මැරීමේ වරද ඔහු පිළිගත් බවත්, වෛද්‍යාචාර්ය වරයා එල්ලා මැරීමට සූදානම් වන විට සත්නාලියෙක් පැමිණ කුදා මැරීමේ වරද ඔහු පිළිගත් බවත් කිව්වා. මේ කථාව ඇසූ රජතුමාට අසරණ කුදාගේ මළ සිරුර බැලීමට අවශ්‍ය වුනා. සත්නාලියා එල්ලා මැරීම නවත්වා කුදාගේ මළ සිරුරත්, වරදකරුවන් හතර දෙනාම තමා ළඟට කැඳවාගෙන එන ලෙස රජතුමා අණ කළා.

සේවකයා වහාම දිවගොස් සත්නාලියා එල්ලා මැරීම නවත්වන ලෙසත්, මෙම මිනීමැරමට වරදකරුවන්වූ හතර

දෙනාත් කුදාගේ මළ සිරුරත් රජතුමා ඉදිරියට ගෙන්වන ලෙස විනිශ්චය කාර වරයාට දැනුම් දුන්නා. මෙම නියෝගය අනුව සන්නාලියා එල්ලා මැරීම නවත්වා, වැරදි කරුවන් හතර දෙනාත් කුදාගේ මළ සිරුරත් රැගෙන, විනිශ්චයකාරවරයා සුල්තාන් රජු හමුවීමට ගියා.

රජතුමා ඉදිරියට ගිය විනිශ්චයකාරතුමා කුදා සම්බන්ධ කතා පුවත තමා දන්නා පරිද්දෙන් කියන්නට පටන් ගත්තා. මෙම කතාව කොපමණ පුදුමාකාර කතා පුවතක් ලෙස රජතුමාට හැඟුණා ද කිව හොත්, ඒ සියලු කරුණු ලියා තැබීමට එතුමාගේ කතන්දර කාරයාට නියම කළා.

ඉන්පසු රජතුමා, තමා වටේ රැස්ව සිටි පිරිසට කතා කොට, ''මෙබඳු අපූරු කතාවක් ඔබලා කවදා හෝ අසා තිබේද'' යි ඇසුවා.... එවිට පළමුවැනි වරදකරු වූ ක්‍රිස්තියානිකාර වෙළෙන්දා ඉදිරියට පැමිණ රජුට නමස්කාර කොට තමා ඊට වඩා අපූර්ව කතාවක් දන්නා බව පැවසුවා. තවද එම කතා පුවත කිසිවෙකුට පුදුම නොවී අසනු නොහැකි බවත් කීවා. එවිට රජතුමා ක්‍රිස්තියානිකාර වෙළෙන්දාට එම කතාව කීමට අවසර දුන්නා. වෙළෙන්දා ද තමා දන්නා අපූර්ව කතාව කියන්නට පටන් ගත්තා. කතාව කියා අවසන් කොට ''මෙය කුදාගේ කතාවට වඩා පුදුම සහගත අපූර්ව කතාවක් නොවේද'' යි රජතුමාගේ දෙපා වැඳ ඇසුවා. රජතුමා කෝපයට පත් වී, ''මෙවැනි වැදගැම්මකට නැති කතාවක් කියා එය මගේ කවටයාගේ කතාවට සමාන කරන්නට සිතීම මොන තරම් මෝඩ වැඩක් ද.'' මේක තරුණයෙක් පිළිබඳ විස්තරයක් පමණක් නේද? කිසිසේත්ම මෙම කතාව කුදාගේ කතාවට සමාන කළ නොහැකිය. ඒ නිසා මම තොප හතරදෙනාම එල්ලා මැරීමට අණ කරමි.'' යනුවෙන් ප්‍රකාශ කළා.

එවිට රසකැවිලි වෙළෙන්දා ඉදිරියට පැමිණ රජතුමාගේ දෙපා වැඳ තමා ඉතාම අපූර්ව කතාවක් දන්නා බැවින් එය කීමට අවසර ඉල්ලා සිටියා. එම කතාව කූදාගේ කතාවට වඩා අපූර්ව හා පුදුම සහගත එකක් නම් වැරදි කරුවන් හතර දෙනාටම සමාව දෙන මෙන්ද ඉල්ලීමක් කළා.

එවේලෙහි රජතුමා, රස කැවිලි වෙළෙන්දාගේ කතා ප්‍රවෘත්තිය ඇසීමට කැමැත්ත දන්වා කතාව කීමට අවසර දුන්නා. රස කැවිලි වෙළෙන්දා ද තමා දන්නා රසවත් ම හා අපූර්ව කතාවක් කියන්නට පටන් ගත්තා. කතාව කියා අවසන් කර, එම කතාව කූදාගේ කතාවට වඩා රසවත් හා අපූර්ව නොවේදැයි වෙළෙන්දා රජතුමාගෙන් විමසුවා.

''මේ කතාව තරමක් දුරට පුදුම සහගතයි. නමුත් කූදාගේ කතාවට සමාන කරන්න තරම් අපූර්ව නැහැ. ඒ නිසා මා නුඹලාට නියම කරන ලද දඬුවම වෙනස් කරන්නේ නැහැ.'' යනුවෙන් රජතුමා ප්‍රකාශ කළා. එවිට, වෛද්‍යාචාර්ය වරයා රජතුමා ඉදිරියට පැමිණ දණ නමා වැඳ තමා දන්නා අපූර්ව කතාවක් කීමට අවසර ඉල්ලා සිටියා. රජතුමා ඔහුට ද කතාව කීමට අවසර දුන්නා. ''හැබැයි ඔබ කියන කතාව කූදාගේ කතාව තරම් පුදුම සහගත නොවූවහොත් ජීවත්වීම ගැන බලාපොරොත්තු තියන්න එපා.'' යනුවෙන් ද රජතුමා කීවා. තමාගේ ප්‍රාණය ගලවාගන්නට පුළුවන් යැයි සහතික වශයෙන්ම දන වෛද්‍යාචාර්ය වරයා කතාව කියන්නට පටන් ගත්තා. කතාව අසා අවසානයේ සුල්තාන් රජතුමා සතුටු වුණා. ''නුඹ කී කතාව බොහොම පුදුම සහගත කතාවක්, නමුත් කූදාගේ කතාව තරම් රසවත් නැහැ. ඒ නිසා ඔබට ජීවිත දානය දීමට නොහැකියි. ඔබලා හතර දෙනාම එල්ලා මැරීමට නියම කරමි.'' යනුවෙන් රජතුමා ප්‍රකාශ කළා.

එකල, සන්නාලි තෙම ඉදිරියට පැමිණ රජතුමාගේ පාමුල වැටී, ''දේවයන් වහන්ස, ඔබ වහන්සේ අපූර්ව කතා ඇසීමට කැමති බැවින් මටත් කතාවක් කීමට අවසර දෙන්නැ''යි ඉල්ලා සිටියා.

''හොඳයි, නුඹේ කතාවත් මම අසමි. නමුත් කූදාගේ කතාව තරම් පුදුම සහගත කතාවක් නොකීවොත් නුඹලා හතරදෙනාම එල්ලා මැරීමට අණ කරමි.'' යනුවෙන් රජතුමා ප්‍රකාශ කළා. සන්නාලියා ද තමා දන්නා රසවත් ම කතාව කියන්නට පටන් ගත්තා. මීට දින දෙකකට පෙර මංගල උත්සවයකට සහභාගී වීමට ගිය සන්නාලියාට එහිදී කොර තරුණයකු හා ඇම්බැට්ටයා නමැති කපුවෙකු හමු වූ හැටිත්, එහිදී තරුණයා විසින් ඇම්බැට්ටයා ගැන කියන ලද කතාවත්, ඇම්බැට්ටයා විසින් ඔහුගේ සහොදරයින් හත් දෙනා පිළිබඳව කියන ලද කතා හතකුත් අසන්නට ලැබුණ අන්දමත් කීවා. එසේ පවසා තරුණයාගෙන් අසන්නට ලැබුණ කතාවත් ඇම්බැට්ටයා විසින් කියන ලද කතා හතත් සන්නාලියා රජතුමා ඉදිරියේ කීවා.

සුල්තාන් රජතුමා මේ කතා අසා මහත් සේ සතුටු වුණා. ''තරුණ කොරාගේ සහ ඇම්බැට්ටයාගේ කතා ප්‍රවෘත්තිය ද, ඇම්බැට්ටයාගේ සහෝදරයින්ගේ කතා ප්‍රවෘත්තිය ද, මගේ කවටයාගේ කතාවට වඩා ප්‍රියජනකය. පුදුම සහගතය. ඒබවින් මම නුඹලා හතර දෙනාටම සමාව දෙමි. එහෙත් කූදාගේ මළ සිරුර වැලලීමට පෙර ඔබලාට සමාවීමට හේතු වූ ඇම්බැට්ටයා බැලිමට කැමැත්තෙමි.'' යනුවෙන් රජතුමා පැවසුවා. එවේලෙහි ම සන්නාලියා තවත් මුලාදෑණියෙක් සමඟ ඇම්බැට්ටයා සෙවීමට පිටත් වුණා. ඔවුහු වැඩි වේලාවක් නොගොස් ඇම්බැට්ටයා කැඳවාගෙන අවුත් රජතුමාට දැක්වූවා.

ඇම්බැට්ටයා අවුරුදු අනූවක් පමණ වයසැති.... උතුම් පෙනුමක් ඇති තැනැත්තෙක්. ඔහුගේ හිසත් රැවුලත් ඇස් බැමිත් හිම මෙන් සුදු පාටින් දිස් වුණා. කන් පහතට එල්ලී තිබුණා. ඔහුට බොහෝ දිග නාසයක් තිබුණා. රජතුමාට ඔහු දැක සිනා නොවී සිටිය නොහැකි වුණා. ''ඇම්බැට්ටය, නුඹ ඉතා රසවත් පුදුම කතා කියන්නට දක්ෂ බව මම දනිමි. එයින් සමහරක් දැන් කියන්නට කැමතිද'' යනුවෙන් රජතුමා ඇම්බැට්ටයාගෙන් ඇසුවා.

''දේවයන් වහන්ස, දැනට කතා ඇසීම නැවතුව මැනවි. මම ඔබ වහන්සේට ඇසීමට පසුව ඕනෑ තරම් පුදුම සහගත කතා කියමි. ඔබ වහන්සේ ඉදිරියෙන් සිටින මේ මිනිසුන් හතර දෙනාත්, ඉදිරියෙහි ඇති මළ කඳත් ගැන තොරතුරු පවසනු මැනවි. මා එය දැන ගැනීමට කැමැත්තෙමි.'' යනුවෙන් ඇම්බැට්ටයා කීවා. රජතුමා ඇම්බැට්ටයාගේ ඉල්ලීමට කැමති වී කූදාගේ මරණය පිළිබඳ සියලු තොරතුරු පවසන මෙන් සේවකයකුට අණ කළා. එය අසා සිටි ඇම්බැට්ටයා කූදාගේ කතාව අද්භූත කතා වස්තුවක් බව පැවසුවා. එහෙත් තමාට තව ටිකක් ළං වී කූදා බැලීමට අවශ්‍ය බව කීවා. රජුගෙන් එයට ද අවසර ලැබුණා.

ඇම්බැට්ටයා කූදා ළඟ දණ ගසා කූදාගේ හිස අල්ලා හොඳාකාර පරීක්ෂා කළා. ඉන්පසු බිම පෙරළෙමින් සිනා සෙන්නට පටන් ගත්තා.

ඇම්බැට්ටයා මෝඩයකු ලෙස හිනාවෙන්නේ ඇයි දැයි සියලු දෙනාම සිතුවා. ''නුඹ කූදාගේ මළ සිරුර දැක සිනාසෙන්නේ කුමක් නිසා ද''යි රජතුමා පුදුමයෙන් ඇසුවා. ''දේවයන් වහන්ස, තවම මේ කූදා නොමැරී පණ පිටින් බව දිව්රා කියමි. මගේ කීම සැබෑ බව නොපෙන්නුවොත්

මා පිස්සෙක් හැටියට භාර ගන්න.'' යනුවෙන් ඇම්බැට්ටයා ආඩම්බර ලීලාවෙන් කීවා. මෙසේ කියා ඔහුගේ ඔලගුවෙන් බෙහෙත් දියරයක් ගෙන කුදාගේ බෙල්ලේ බොහෝ වේලා ගෑවා. ඉන්පසු ආයුධයක් ගෙන කුදාගේ දත් අතරේ දමා කට අරවා, තවත් සියුම් අඬුවක් උගුරට දමා, මාළු කටු කෑල්ලක් ඇද එළියට ගෙන සියලු දෙනාටම පෙන්නුවා. එකෙණෙහිම කුදා ඇස් ඇර බලා, අත පය දිගු කර පණ ඇති ලක්ෂණ පෙන්නුම් කළා.

ඇම්බැට්ටයාගේ සමර්ථකමින් කුදාට පණ ලැබුණ බව දුටු රජතුමා ඇතුලු සියලු දෙනාම මහත්සේ සතුටට පත්වුණා. සම්පූර්ණ රාත්‍රියක් හා දවල් වරුවක් මළාක් මෙන් සිටියා වූ කුදා කිවිසින්නට පටන් ගත්තා. විශ්මයෙන් ද ප්‍රීතියෙන් ද පිනා ගිය රජතුමා කුදාගෙත්, ඇම්බැට්ටයාගෙත් කතා ප්‍රවෘත්ති නොනැසී පවතින ලෙස ලියා තබන ලෙස රජුගේ කතන්දර කරුට නියම කළා. ඉන්පසු රජතුමා සන්නාලියාට ද, වෛද්‍යාචාර්ය වරයාට ද, වෙළෙන්දන් දෙදෙනාට ද ඉතා වටිනා සළුව බැගින් තෑගි දුන්නා. ඇම්බැට්ටයාට වැටුප් දී තමා ළඟ සේවයට සිටුවා ගත්තා.

# අලිකොජියාගේ රන් මසු දහස.

පුරාණ කාලයේ බැග්ඩෑග් නුවර අලිකොජියා නම් වෙළෙන්දෙක් සිටියේය. දිනක් ඔහු මක්කම බලා වන්දනාවේ යෑමට කල්පනා කළේය. එසේ සිතා, ඔහුගේ නිවස බදු දී නිවසේ තිබූ භාණ්ඩ සියල්ල විකුණා ගමනට සූදානම් වූයේය. ඔහුගේ ගමනට අවශ්‍ය මුදල් පමණක් ගෙන ඉතිරි මුදල් ආපසු පැමිණි පසු ගැනීම සඳහා හිතවතෙකු ළඟ තබා යෑමට ඔහු කල්පනා කලේය. ඔහු භාජනයක් ගෙන එහි රන් කැබලි දාහක් දමා ඊට උඩින් ඔලිව් ගෙඩි සීයක් දමා භාජනය පුරවා කට වසා බැන්දේය. ඉන්පසු තමාගේ මිත්‍ර වෙළෙන්දෙකු ළඟට ගොස් එම ඔලිව් භාජනය තමා ආපසු එනතුරු ප්‍රවේශම් කර තබන මෙන් ඉල්ලා සිටියේය. වෙළඳ තෙමේද එය ප්‍රවේශම කිරීමට පොරොන්දු වී තමාගේ භාණ්ඩා ගාරයේ යතුර අලිකොජියාගේ අතට දී තමා කැමති ස්ථානයක එය තබන ලෙස කීවේය.

පසුවදා අලිකොජියා ගමන ආරම්භ කළේය. මක්කම දක්වා වන්දනාවේ ගිය ඔහුට මිසරයටද යාමට ආසාවක් ඇති විය. එබැවින් අලිකොජියා ආපසු බැග්ඩෑග් යාම වෙනුවට මිසරයට යාමට ගමන් ආරම්භ කළේය. මිසරයේ අලංකාරය

බැලූ ඔහුට ලෝකයේ තව තවත් රටවල් වල ඇවිදින්නට සිතුණේය. ඔහු රට වල් ගණනාවක සංචාරයේ යෙදෙමින් අවුරුදු හතක් ගත කළේය. අවුරුදු හතකට පසු අලිකොජියා ආපසු බැග්ඩෑග් නුවර බලා ඒමට පිටත් වූයේ ය.

ඔලිව් ගෙඩි භාජනය ප්‍රවේශමට තබා ගත් වෙළෙන්දාට මේ කාලය තුල අලිකොජියා ගැනවත් ඔලිව් භාජනය ගැනවත් මතක් වුයේ නැත. දිනක් රාත්‍රී ආහාරයෙන් පසු ඔලිව් ගෙඩි ගැන කථාවක් ඇති වී වෙළෙන්දාගේ භාර්යාව බොහෝ කාලයකින් ඔලිව් ගෙඩි නො කෑ බව වෙළෙන්දාට කීවේය. එවිට වෙළෙන්දාට අලිකොජියා විසින් මීට අවුරුදු හතකට පෙර ප්‍රවේශමට තබා ගිය ඔලිව් භාජනය මතක් විය. ''අලිකොජියා මිසරයට ගිය බව ආරංචි වූ නමුත් ඔහුට කුමක් සිදු වූයේ දැයි නොදනිමි. මෙපමණ කල් යනතුරු ආපසු නොපැමිණි බැවින් ඔහු මියගොස් ඇතැයි මට සිතේ. ඔලිව් ගෙඩි නරක් නොවී තිබුණොත් අපට කන්නට හැකිය. ඒ නිසා මට ඉටි පන්දමක් හා පිඟානක් දෙන්න. මම භාජනය ඇර ඔලිව් ගෙඩි නරක් නොවී තිබේදැයි බලන්නෙමි.'' යනුවෙන් වෙළෙන්දා භාර්යාවට කීවේය.

''ස්වාමි පුරුෂය, අලිකොජියා මිය ගිය බව ඔබ කියන්නේ කෙසේද? එවැනි ආරංචියක් අපට ලැබුණේ නැත. ඔහු මිසරයට ගොස් ඊටත් වඩා ඈත රටවල ඇවිදින්නට ගියේ දැයි නොසිතිය හැකිද? ප්‍රවේශමට අප ළඟ තිබූ එම භාජනය ඇරීම ගැන නම් මම තරයේ විරුද්ධ වෙමි. භාජනය ඇර තිබෙන බව අලිකොජියා දැනගත්තොත් අපට මොන තරම් නින්දාවක් ද?'' ආදී වශයෙන් භාර්යාව වෙළෙන්දාට කීවේය. එහෙත් වෙළෙන්දා තමාගේ අදහස අත් නොහැරියේය.

වෙළෙන්දා ගබඩාවට පැමිණ අලිකොජියාගේ ඔලිව්



භාජනය ඇර බැලුවේය. ඔලිව් ගෙඩි පුස්අල්ලා තිබෙන බව දුටු වේය. නමුත් යට තිබෙන ගෙඩිත් එසේම දැයි බැලීමට භාජනයේ ඇති ඉතිරි ඔලිව් ගෙඩි පිඟානට හැලුවේය. එවිට රන් කාසි දහසද පිඟානට වැටුණේය. වෙළෙන්දා වහාම භාජනයේ තිබු රන්කාසි සියල්ලම ගෙන කාමරයේ සඟවා තබා ඉතිරිවු ඔලිව් ගෙඩි ටික භාජනයට දමා වැසුවේය. ඉන්පසු භාර්යාව ළඟට පැමිණ එම ඔලිව් පුස් අල්ලා ඇති බව කිවේය.

රත්රන් කැබලි ගැන වෙළෙන්දා තම භාර්යාවටවත් නො කීවේය. එහෙත් අලිකොජියා හදිසියේවත් පැමිණියහොත් භාජනයේ අඩක් හිස් වී ඇති බැවින් සැක සිතනු ඇතැයි සිතා ඒ සඳහා උපක්‍රමයක් යෙදුවේය. පසුවදාම නගරයට ගොස් අලුත් ඔලිව් ගෙඩි තොගයක් මිලට ගත්තේය. ඉන්පසු එම ඔලිව් ගෙඩිවලින් භාජනයේ ඉතිරි කොටස පුරවා කට බැඳ මුලින් තිබු ආකාරයටම තැබුවේය.

වෙළෙන්දා මෙම නීච ක්‍රියාව කොට සතියකට පසු අලිකොජියා ආපසු පැමිණ මිත්‍රයාගෙන් තම ඔලිව් භාජනය ඉල්ලුවේය. ''මිත්‍රය ඔබේ ඔලිව් භාජනය ඔබ තිබු තැන එසේම තිබෙනවා ඇත. මගේ ගබඩාවේ යතුර මෙහි තිබේ. එහි ගොස් ඔබ එය තිබු තැනින් ගත මැනවි.'' යනුවෙන් වෙළෙන්දා කීවේය. අලිකොජියාද යතුර ගෙන ගබඩාවට ගොස් ඔලිව් භාජනය රැගෙන වෙළෙන්දාට ස්තුති කොට ආපසු ගියේය. නිවසට ගොස් බලන විට, ඔලිව් ගෙඩි එසේම තිබෙන බවත් රන් කාසී එකක් වත් නැති බවත් දැක්කේය. තම මිත්‍ර වෙළෙන්දා රන්කාසි දහස සොරකම් කරන ලද බව ඔහුට පෙනී ගියේය. ඔහු දෙවියන්ගෙන් පිහිට ඉල්ලමින් අඩන්නට පටන් ගත්තේය.

පසු දින අලිකොජියා තම මිත්‍ර වෙළෙන්දා ළගට ගොස් ඔලිව් බාජනයේ රන් කාසි දහසක් තිබුණා නමුත් දැන් එය නැති බව කීවේය. වෙළෙන්දා ඒ ගැන කිසි දෙයක් නො දන්නා බවත් තමාට එහි රන්කාසි ඇති බවක් කීවේ නැතිබවත් කීවේය. ඔබ මට දුන්නේ ඔලිව් භාජනයක් නොවේදැයි ඇසුවේය. ''ඔබ රන් කැබලි දහස ගෙන ප්‍රයෝජනයට ගත්තා නම් ඒ බව කියන්න. මම ඒ ගැන ඔබට දොස් නොකියමි. ඔබ එය ගත්තේනම් මට ටික ටික ලැබෙන්නට සලස්වන්න. කෙසේවෙතත් ඔබ එය ගත්තා නම් ගත් බව පමණක්වත් මට කියන්න'' යනුවෙන් අලිකොජියා වෙළෙන්දාට කිවේය. භාජනය ගබඩාවේ තිබුවේ ඔබනේද? ආපසු ගත්තේත් ඔබම නොවේ ද? මම නම් ඔබේ භාජනය ඇල්លුවේවත් නැත.'' යනුවෙන් වෙළෙන්දා කීවේය. එහෙත් අලිකොජියා ඉතා මෘදු බසින් කථා කරමින් එම මුදලින් අඩක්වත් දෙන මෙන් ඉල්លුවේය. එවිට වෙළෙන්දා අලිකොජියාට පරුෂ වචන කියමින් පන්නා ගත්තේය.

අලිකොජියා මහත් සේ දුකට පැමිණ මේ ගැන විනිශ්චයකාර තුමාට දන්වා සිටියේය. එවිට විනිශ්චයකාර තුමා වෙළෙන්දා ගෙන්වා වෙළෙන්දාගෙන් නිදහසට කරුණු ඇසුවේය. අලිකොජියාගේ ඔලිව් භාජනය තමා ළඟ ප්‍රවේශමට තිබු නමුත් ඔහු එය ඇල්លුවේවත් නැති බව දිව්රා කිවේය. මේ ගැන සාක්ෂි තිබේදැයි විනිශ්චයකාර වරයා ඇසුවේ ය. වෙළෙන්දා තමාගේ මිත්‍රයකු යයි සිතා සිටි බැවින් සාක්ෂි නැති බව අලිකොජියා කීවේය. භාජනයේ මුදල් තිබුණ බවට සාක්ෂි නැති බැවින් විනිශ්චය කාර තුමා වෙළෙන්දා නිදහස් කර යැව්වේය.

වෙළෙන්දා අලිකොජියාගෙන් ජයගෙන මහත් සතුටට පැමිණ ආපසු ගියේය. අලිකොජියා මෙම තීරණයෙන්

සැහීමකට පත් නොවුයේය. නඩු විසඳීමෙහි අති දක්ෂවුත් බුද්ධිමත් වූ කාලිප් රජතුමාගෙන් තමාට යුක්තිය ඉෂ්ට වේ යයි ඔහු සිතුවේය. එසේ සිතා කාලිප් රජතුමාට මෙම නඩුව කියා සිටියේය.

කාලිප් රජතුමා, තමාගේ මහ ඇමති සමග සාමාන්‍ය රටවැසියෙක් මෙන් සැරසී රාත්‍රියේ නගරයේ සංචාරය කිරීම විනෝදාංශයක් ලෙස කරන්නෙක් විය. මෙම නඩුව ඉදිරිපත් කළ දිනයේ සිට මෙයට සාක්ෂි නැති නමුත් අලිකොජියා නිවැරදි බව රජතුමාට වැටහින. එහෙත් සාක්ෂි ඇතිව එය ඔප්පුකරන්නේ නැතිව තීරණයක් දීමද කළ නොහැකිය. රජතුමාට ද මෙම නඩුව විසඳීම මහා ප්‍රහේලිකාවක් විය. අලිකොජියාගේ නඩුව ඇසීමට පෙර දින රාත්‍රියේ කාලිප් රජතුමා හා ගයාපර් ඇමති සාමාන්‍ය රටවැසියන්ගේ ඇඳුමින් සැරසී රාත්‍රී සංචාරය ආරම්භ කළහ. ඔවුහු වීදියක් පසුකර යන විට ළමුන් පිරිසක් හඳපානේ සෙල්ලම් කරන ආකාරය දැක, ඔවුන් කරන්නේ කුමන සෙල්ලමක්දැයි බලා සිටියහ. ''අපි විනිශ්චකාරයාගේ සෙල්ලම කරමු.'' එක් ළමයෙක් කීවේය. අපි අලිකොජියාගේ රන් කැබලි දහසෙහි නඩුව විසඳමු. තවත් ළමයෙක් කීවේය. ළමයින් සැම දෙනාම එයට සතුටු වූහ. අලිකොජියාගේ හා වෙළෙන්දාගේ ප්‍රවෘත්තිය බැග්ඩෑග් නගරය සැම තැනම පතළ වී තිබුණ බැවින් ළමෝ ද එම කාරණය සෙල්ලමක් ලෙස කිරීමට තෝරාගත්හ. විනිශ්චයකාර වරයා, අලිකොජියා, වෙළෙන්දා, රජයේ මුලාදෑනියා ආදී වශයෙන් එක් එක් ළමයා තම තමන්ගේ චරිත තෝරා ගත්හ. විනිශ්චතයකාර වරයා බොහෝ තේජාන්විත විලාශයෙන් පුටුවක අසුන් ගත්තේය. ඉන්පසු නඩුව විසඳීමට පටන් ගත්තේය.

පළමුවෙන්ම අලිකොජියා ඉතා යටහත්ව තමාට සිදුවූ දේ කියා එපමණ මුදලක් නැති නොවන සේ තමාට යුක්තිය ඉටුකර දෙන මෙන් ඉල්ලා සිටියේය. එවිට, නඩුකාරයා වෙළෙන්දා දෙසට හැරී එම මුදල් ආපසු නොදෙන්නේ කුමක් නිසා දැයි ඇසුවේය. වෙළෙන්දාගේ වෙස් ගත් ළමයාද තමාගේ නිදහසට කාරණා කියා රත්කාසි නොගත් බව දිව්රා ප්‍රකාශ කළ හැකි බව කීවේය. ''ඔබ දිව්රන්නට පෙර, ඔලිව් ගෙඩි භාජනය බැලීමට මම කැමැත්තෙමි'' යි නඩුකාර වෙස් ගත් ළමයා කිවේය. ඉන්පසු අලිකොජියාට කථා කොට වහාම ඔලිව් භාජනය ගෙනෙන ලෙස අණ කළේය. අලිකොජියාගේ වෙස් ගත් ළමයාද භාජනය ගෙනවිත් එය තමා අවුරුදු 7 කට පෙර වෙළෙන්දා ළඟ තබා ගිය භාජනය බව කීවේය. නඩුකාරයා වෙළෙන්දාගෙන්ද එම භාජනය හඳුනාගත හැකි දැයි ඇසුවේය. භාජනය එයම බව වෙළෙන්දාද කිවේය. නඩුකාරයා ඔලිව් භාජනයෙන් ගෙඩියක් ගෙන ''මම මෙය කා බලන්නෙමි'' යනු වෙන් කියා ඔලිව් ගෙඩියක් කන ආකාරය පෙන්නුම් කළේය. ඉන්පසු ''මේවා ඉතා රසය. නමුත් හත් අවුරුද්දක් ගියපසුත් ඔලිව් ගෙඩි මේ ආකාරයෙන් තිබේද කියා නොසිතමි'' යනුවෙන් නඩු කාරයා කීවේය. තවද ''මෙම ඔලිව් ගෙඩි හත් අවුරුද්දක් පැරණි දැයි ප්‍රසිද්ධ ඔලිව් වෙළෙන්දාගෙන් අසා දැන ගත යුතුයි'' ඔහු කිවේය. ඉන්පසු ඔලිව් ගෙඩි කොපමණ කාලයක් හොඳින් තබාගත හැකි දැයි නඩුකාරයා ඔලිව් වෙළෙන්දා ගෙන්වා ඇසු වේය. ''ස්වාමීනි කොපමණ ප්‍රවේශමෙන් තැබුවත් මෙම ඔලිව් අවුරුදු තුනකට වඩා කාලයක් ගත වන විට පුස් අල්ලා පාටවත්, රසවත් නැති වන බව කීහ.

''එසේනම්, මෙම භාජනයේ ඇති ඔලිව් ගෙඩි කොපමණ පැරණි ද'' යි නඩුකාරයා වෙළෙඳුන් ගෙන්

ඇසුවේය. ඔවුන් ඔලිව් ගෙඩි අනුභව කරන ආකාරය දක්වා ඒවා අලුත් හොඳ ඔලිව් බව පැවසුහ. මේ භාජනයේ ඇති ඔලිව් ගෙඩි හත් අවුරුද්දක් පැරණි බව වෙළෙන්දා කියයි. යනුවෙන් නඩුකාරයා කීවේය. එවිට, ''මෙම ඔලිව් මේ අවුරුද්දේ හටගත් ඒවා බව දිවුරා කියමු. එසේ නොකියන ඔලිව් වෙළෙන්දෙක් මේ බැග්ඩෑග් නගරයේම නැත'' යනු වෙන් වෙළෙන්දෝ කීහ. ''මේ වෙළෙන්දා පවසන්නේ බොරුවක් බව නොපෙනේද? මොහු අලිකොජියාගේ භාජනයේ තිබූ රන්කාසි සොරකම් කොට අලුත් ඔලිව් ගෙඩි පුරවා ඇති බව ස්ථිරය. ''මම තා එල්ලා මැරීමට නියම කරමි.'' යනුවෙන් නඩු විභාග කොට ඔවුන්ගේ ක්‍රීඩාව අවසන් කළහ. ළමුන් සියලු දෙනාම අත්පුඩි ගසමින් ප්‍රීති වූහ.

පසුවදා තමාට විසඳීමට නියමව ඇති සාක්ෂි නොමැති නඩුවක් මෙපමණ හොඳාකාරව විසඳීම ගැන රජතුමා විශ්මයටත් සතුටටත් පත්වුයේය. ළමයාගේ දක්ෂකම ගැන රජතුමාත්, ඇමති තුමාත් පුදුමයට පත්වූහ. ළමයින්ගේ නඩු විසඳීම ගැන ඇමති තුමා කියන්නේ කුමක්දැයි රජතුමා ඇසුවේය. ඒ ළමයාගේ නඩු විභාගය නම් අති දක්ෂ විනිශ්චය කාර වරයෙකුගේ නඩු විභාගයටත් වඩා යුක්තිග රුක හා සාධාරණ බව ඇමතිතුමා කීවේය. ''මේ නඩුව හෙට මට විනිශ්චය කිරිමට ඇත්තේය. මේ ළමයා නඩුව විසඳූ ආකාරයටම මමත් එම නඩුව විසඳීමට සිතාගතිමි. මෙය මටද මහඟු පාඩමකි'' යනුවෙන් රජතුමා නිහතමානීව ඇමති තුමාට කීවේය. ''එසේම, අලීකොජියාගේ නඩුව හෙටදින විසඳීමට නඩුකාර වෙස් ගත් ළමයාටම අවස්ථාව ලබා දෙමි'' යනුවෙන් ද රජතුමා ප්‍රකාශ කළේය.

පසුවදා ඇමති තුමා ළමයින් සෙල්ලම් කරන ලද

නිවසට ගියේය. එම නිවසෙහි ළමුන් කී දෙනෙක් සිටිත් දැයි ඇමති තුමා ගෙහිමි කාන්තාවගෙන් ඇසුවේය. තමාට පිරිමි ළමුන් තුන් දෙනෙක් සිටින බව ඈය කීවේය. ඊයේ රාත්‍රියේ සෙල්ලම් කරද්දී විනිශ්චකාරවරයා ලෙස රඟපෑවේ කවුදැයි ඇමති තුම ඇසුවේය. ඒ, තමා බව කී වැඩිමහල් දරුවාගේ මුහුණෙහි පැහැය වෙනස් විය. එවිට, ''රජතුමා ඔබව දැකීමට කැමැත්තෙන් සිටී. මා සමග යාමට එන්න'' යනුවෙන් ඇමති තුමා කීවේය. ඊයේ රාත්‍රියේ තමාගේ පුතා විනිශ්චයකාර වරයකු ලෙස රග පෑ නමුත්, එසේ කරන ලද්දේ සෙල්ලමට පමණක්ම බව කාන්තාව බියෙන් වෙව්ලමින් කියා සිටියාය. මෙසේ සෙල්ලම් කිරිමෙන් විනිශ්චකාර තුමාට අවනම්බුවක් වුයේ නම් දෙපා වැඳ සමාව ඉල්ලන බවද ඈය කියා සිටියාය. ඈයට බිය නො වී සිටින ලෙසද රජතුමා ළමයාගේ දක්ෂකම ගැන පැහැදී ඔහු බැලීමට ආශාවෙන් සිටින නිසා දරුවා කැඳවන බවද ඇමති තුමා කීවේය. ඉන්පසු කාන්තාවද තම වැඩිමහල් පුතා සමග මාලිගයට යාමට අවසර ලබාගෙන පුතාටද රජතුමා බැහැදැකිමට සුදුසු ලෙස ඇඳුම් අන්දවා ගෙන ඇමති තුමා සමග මාලිගාවට ගියා ය.

ඇමති තුමා විසින් ළමයා රජතුමා ඉදිරියට ගෙන යන ලදී. ළමයා මහත් කෝලගතියකින් සිටින බව රජතුමා දැක ඔහුට කථා කළේය.''දරුව, ඊයේ රෑ අලිකොජියාගේ රන්කාසි පිළිබඳ නඩුව විසඳුවේ ඔබ දැයි ඇසුවේය. එවිට ඔහු ඒ තමා බව කීවේය.'' මම ද ඔබ නඩුව විසඳු ආකාරය ළඟ සිටම බලා සිටියෙමි. මා ඒ ගැන සතුටු වෙමි'' රජතුමා කීවේය.

ඉන්පසු ළමයාට තමා ළඟින්ම අසුන් ගන්නා ලෙස රජතුමා ළමයාට කීවේය. ''දැන් ඔබට සැබෑ අලිකොජියා හා වෙළෙන්දා දකින්නට පිළිවන.'' කියමින් රජතුමා, නඩුවේ

දෙපක්ෂයට ඉදිරියට ඒමට අණ කළේය.

ඔවුහු සිංහාසනය ඉදිරියට පැමිණ නළල බිම තබා නමස්කාර කළහ. තුබලා එකිනෙකාට කියන්නට තිබෙන කරුණු මේ ළමයා ඉදිරියේ කියනු. ඔහු ඔබලාට යුක්තිය ඉෂ්ට කරණු ඇත. යම් වැරදීමක් සිදුවුවහොත් මම ඔහුට ආධාර කරන්නෙමි.'' යනුවෙන් රජතුමා ප්‍රකාශ කළේය. අලිකොජියා සහ වෙළෙන්දා තම තමාට කීමට ඇති කරුණු ඉදිරිපත් කළහ. ඉන්පසු වෙළෙන්දා දිවුරීමට ඉල්ලන ලදී. එවිට ළමයා ඒ ගැන ඉක්මන් නොවී සිටිනලෙස කියා ඔලිව් භාජනය ගෙන එන ලෙස නියම කළේය. අලිකොජියා ඔලිව් භාජනය ගෙන ආවේය. රජතුමා ඔලිව් ගෙඩියක් රස බලා ළමයාටද එකක් දුනි. ඉන්පසු ඔලිව් වෙළෙන්දන් ගෙන්වා ඔලිව් රස බැලීමට දුන්හ. ඒවා මේ අවුරුද්දේ කඩන ලද ඔලිව් බව සියලු දෙනාම පැවසුහ. ඒවා හත් අවුරුද්දක් පැරණි බව වෙළෙන්දා පවසන බව ළමයා කීවේය. එය සම්පූර්ණ අසත්‍යයක් බව වෙළෙඳුන් කීහ රන් කහවනු උඩින් ඔලිව් ගෙඩි කීයක් ඇසුරා තැබුවේ දැයි ළමයා අලිකොජියාගෙන් ඇසුවේය. එවිට ඔලිව් ගෙඩි සීයක් දැමූ බව ඔහු කීවේය. එවිට භාජනයේ පතුලේ පැරණි ඔලිව් ගෙඩි කීයක් තිබේදැයි ගණන් කරන ලෙස ළමයා නියෝග කළේය. භාජනයේ ඇති ඔලිව් ගෙඩි පරීක්ෂා කරනවිට හත් අවුරුද්දක් පැරණි පුස්කන ලද ඔලිව් ගෙඩි සීයක් දක්නට ලැබිණ. සියල්ලන්ටම සිදුවී ඇති දේ පැහැදිලි විය. වහාම රන් කාසි දහස ගෙනවිත් අලිකොජියාට දෙන ලෙස නියම කොට දඬුවම් පැමිණ වීම රජතුමාට භාර කළේය.

රන්කාසි දහස ආපසු ගෙනෙන ලෙස රාජ පුරුෂයන් සමග වෙළෙන්දා පිටත් කළේය. ඔහු රන් කාසි ආපසු ගෙනවිත් දුන් පසු වෙළෙන්දට අවුරුදු හතක සිර දඬුවමක් නියම කළේය.

පළමුවෙන් මෙම නඩුව විසඳන ලද විනිශ්චයකාර තුමා දෙසට හැරී, ''මෙම ළමයා දෙසවත් බලා දක්ෂ අන්දමින් යුක්තිය ඉෂ්ඨ කිරීමට ඉගෙන ගනු'' යනුවෙන් රජතුමා කිවේය. ඉන්පසු ළමයාට රන්කාසි දහසක් තෑගි කළේය. තමාගේ මාලිගයේ ඔහු නවත්වාගෙන ශිල්ප ඉගෙන ගැනීමට පහසුකම් සලසන මෙන් මහා ඇමති තුමාට ප්‍රකාශ කළේය.

# ග්‍රිසෙල්ඩාගේ ආදරය

එක් රටක ඉතා ලස්සන තරුණ කුමාරයෙක් සිටියා. ඔහු හරිම ශක්ති සම්පන්නයි. ඒ වගේම කරුණාවන්තයි. ඔහු දුප්පත් අයට හුඟක් උදව් උපකාර කළා. මේ තරුණ කුමාරයාට බිසවක් හිටියේ නැහැ. කුමාරයාගේ මව ඔහුට විවාහයක් කරදීමට බොහෝ උත්සාහ ගත්තා. මව කොපමණ කීවත්, කුමාරයා විවාහයක් කර ගැනීමට කැමති වූයේ නැහැ. ඉතින් මේ මව් බිසව කුමාරයාට හිතවත් මිනිසුන්ට මේ බව කීව්වා. ඉතින් හිතවත් මිනිසුන් ද පැමිණ මේ කුමාරයාගෙන් විවාහ වන ලෙස ඉල්ලා සිටියා.

''කුමාරයාණනි, ඔබ විවාහයක් කරගන්න. එවිට ඔබට ආදරය කරන බිරිඳක් ලැබෙනවා ඇති. එමෙන්ම ඔබට ආදරය ඇති දරුවන් ලැබෙනවා ඇති. එසේ වූ විට ඔබතුමාට ඔවුන් සමග ඉතා සතුටින් කාලය ගත කළ හැකි වෙයි.'' ආදී වශයෙන් කුමාරයාගේ හිතවතුන් ඉල්ලා සිටියා. ''මම ඔබතුමාට ඉතා රූමත්, ධනවත් කුමාරියක් සොයා දෙන්න දැයි එක් හිතවතෙක් ඇසුවා. එවිට කුමාරයා සිනා සුනා.

''මා නිදහසේ සිටීමට කැමති බව ඔබලා දන්නේ

නැද්ද? විවාහ වූ විට කෙතරම් නිදහස සීමා වෙනවාද? යනුවෙන් පැවසූ නමුත් හිතවතුන් මේ අදහසට කැමති වුයේ නැහැ. විවාහ වීමට කැමති වන මෙන් දිගින් දිගටම කුමාරයාගෙන් ඉල්ලා සිටියා. එවිට කුමාරයා විවාහ වීමට කැමති වූනා.

''මම විවාහ වීමට කැමති වෙනවා. නමුත් මගේ භාර්යාව තෝරා ගන්නේ මා විසින්මයි. මම බිරිඳ ලෙස තෝරා ගන්නා තරුණියට රාජ කුමාරිකාවට වගේ ඔබ සැම සැලකිය යුතුයි'' යනුවෙන් කුමාරයා කීවා. ඉතින් කුමාරයාගේ හිතවතුන් සියලු දෙනාම ඉතාම සතුටු වෙලා කුමාරයාගේ විවාහය සිදුවන දිනය එනතුරු බලාසිටියා.

ඉන්පසු කුමාරයා තමාට විවාහ කරගැනීමට සුදුසු කාන්තාවක් සොයමින් ගමන් ආරම්භ කළා. දින කීපයක් ගමන් කළ කුමාරයා දුප්පත් මිනිසුන් සිටින ගම්මානයකට පැටිණියා. ඒ ගමෙහි ජැනිකියුලා නම් වූ දුප්පත් ගොවියෙක් හිටියා. ඔහුට ග්‍රිසෙල්ඩා නැමැති ඉතා ලස්සන දුවක් හිටියා. ග්‍රිසෙල්ඩා ඉතාම හොඳයි. කරුණාවන්තයි. ඇය තමාගේ මහලු පියා ඉතා ආදරයෙන් රැක බලා ගත්තා. දින කීපයක්ම මේ තරුණියගේ ක්‍රියා කලාපය ගැන කුමාරයා පරීක්‍ෂා කළා. ග්‍රිසෙල්ඩා තම පියාගේ ගොවිපලේ සිටින සතුන් කීප දෙනාට වැසි, සුළං නොබලා සාත්තු කරන අන්දම කුමාරයා දැක්කා. ඇයගේ කඩිසරකමට බොහෝ සේ පැහැදුනා. ඇගේ හැසිරීම් රටාව දුටු කුමාරයාට ඇය මේ ලෝකයේ සිටින ලස්සනම තරුණිය බව සිතුනා. කුමාරයා ඇයට තදින්ම ආදරය කළා.

කුමාරයා විවාහ වන දිනය ළංවුනා. නමුත් කුමාරයා විවාහ වන්නේ කව්රු සමගදැයි කිසිවෙක් දැනගෙන සිටියේ නැහැ. ග්‍රිසෙල්ඩා ගැන කුමාරයා කිසි කෙනෙකුට කීවේ

නෑ. එදා කුමාරයාගේ මාලිගය ඉතා අලංකාර ලෙස සරසා තිබුණා. රන් රිදී මුතු මැණික් වලින් මාලිගය සැම තැනම දිලිසෙනවා. කුමාරයාද රජෙකු මෙන් ඉතා අලංකාර ලෙස සැරසුනා. ඉන්පසු කුමාරයා සරසන ලද අශ්වයකු පිට නැගී තමාගේ පිරිසටද පසුපසින් පැමිණෙන ලෙස අණ කළා. කුමාරයා දුප්පත් ගොවීන් සිටින ගම දෙසට ගමන් ආරම්භ කළා. ඔහු සමග ගිය පිරිස පුදුමයෙන් මෙන් එකිනෙකා දෙස බැලුවා. සිදු වන්නට යන්නේ කුමක්දැයි ඔවුන්ට තේරුම් ගැනීමට බැරි වුනා. එහෙත් කුමාරයාගේ අණට කීකරු විය යුතු බැවින් පිරිසද කුමාරයාගේ පසු පසින්ම ගමන් කළා.

කුමාරයා විවාහ වන්නේ කවුරුන් සමග දැයි ග්‍රිසෙල්ඩා දැනගෙන හිටියේ නෑ. කුමාරයා ඇයට ආදරය කරන බව වත් ඇය දන්නේ නෑ. කුමාරයා විවාහ කරගැනීමට බලාපොරොත්තු වන ධනවත්, රූමත්, තරුණිය බැලීමට ග්‍රිසෙල්ඩාටද සිතුනා. ඇය බැලීමට සිතූ ග්‍රිසෙල්ඩා තම පියාටද අලුත් ඇඳුමක් අන්දවා මිදුලේ වාඩි කරවා තමාද අලුත් ඇඳුමක් ඇඳගෙන පැලේ මිදුලට ආවා. එවිට කුමාරයා රජෙකු මෙන් ඉතා අලංකාර ලෙස සැරසී ග්‍රිසෙල්ඩාගේ ගේ දොර ඉදිරිපිටට ආවා.

''ග්‍රිසෙල්ඩා, ඔබේ පියා කොහේද'' යි කුමාරයා ඇසුවා. එවිට ග්‍රිසෙල්ඩාගේ පියා ඉදිරියට පැමිණියා. කුමාරයා ඔහුගේ අතින් අල්ලා ගත්තා.

''ජැනිකියුලා, ඔබේ දියණිය විවාහ කර ගැනීමට මා කැමතියි. ඒ ගැන ඔබ කැමතිද?'' යනුවෙන් කුමාරයා ඇසුවා. ජැනිකියුලා පුදුම වී බලා සිටියා. ඔහුට කතා කර ගැනීමට බැරි වුනා. ''දුව කැමති නම් මමත් කැමතියි.'' යනුවෙන් ජැනිකියුලා කිව්වා. ''එසේ නම් මම ග්‍රිසෙල්ඩාගෙන්



අසන්නදැයි කුමාරයා ඇසුවා. පියා එයට කැමති වුනා. පිරිස එළියේ සිටියදී කුමාරයා ග්‍රිසෙල්ඩාගේ ගෙට ගොස් ඇයට ආදරයෙන් කථා කළා. ඔබ මා සමග විවාහ වීමට කැමතිනම් ඔබේ පියාද ඒ ගැන කැමති ය. ඉතින් මා හා විවාහ වීමට කැමති නම් කියන්න'' යනුවෙන් කුමාරයා ග්‍රිසෙල්ඩාට කිව්වා.

''අහෝ! සවාමීනි, මම ඉතාමත් දුප්පත් අහිංසක කෙල්ලක්. මගේ පියා රැක බලා ගන්නේ මා විසිනුයි. ඔහු ඉතා දුප්පත් නිසා මට ඔබතුමා සමග විවාහ වුවහොත් ඔහුට දුක් විඳීමට සිදුවෙයි. මට මගේ පියාගේ ජීවිතය තිබෙන තාක් කල් ඔහු ආදරයෙන් රැකබලා ගැනීමට අවසර දෙන්නේ නම් ඔබ කියන ඕනෑම දෙයක් කිරිමට මම කැමති වෙමි.'' යනුවෙන් ග්‍රිසෙල්ඩා කිව්වා.

''මගේ ආදරණීය ග්‍රිසෙල්ඩා මට ඒ ඇති.'' යනුවෙන් කියා කුමාරයා ඇගේ අතින් අල්ලාගෙන එළියට ආවා. මේ මගේ භාර්යාව යනුවෙන් කියා ග්‍රිසෙල්ඩා තමා සමග පැමිණි පිරිසට පෙන්නුවා. එවිට පිරිසේ සිටි කාන්තාවන් කීපදෙනෙක් පැමිණ ග්‍රිසෙල්ඩාට ඉතා වටිනා ඇඳුම් අන්දවා ආභරණ පළඳවා සූදානම් කළා. ඇය එසේ සැරසූවිට මිනිසුන්ට ඇස් අදහා ගැනීමට බැරි තරම් අලංකාර ලෙස පෙනුනා. කුමාරයාට හරිම සතුටුයි. එදින රාත්‍රියේ මාලිගය උත්සව ශ්‍රීයෙන් බැබලුනා.

කුමාරයා ග්‍රිසෙල්ඩා සමග ඉතා සතුටින් කාලය ගත කළා. ග්‍රිසෙල්ඩා දුප්පත් මිනිසුන්ට බොහෝ උපකාර කළා. රටේ මිනිසුන් ග්‍රිසෙල්ඩාට ආදරයා කළා. කුමාරයා විසින් කරන ලද්දේ ඉතාමත් ඥනවන්ත ක්‍රියාවක් බව රටේ කව්රුත් පිළිගත්තා. ටික කලකට පසු ඔවුන්ට පුංචි දියණියක් ලැබුණා. මේ දියණිය ග්‍රිසෙල්ඩාටත් වඩා ලස්සන කුමාරියක්

වනු ඇතැයි සෑම දෙනාම කිව්වා. ග්‍රිසෙල්ඩා කුමාරයා විසින් කියන ලද සෑම දෙයක්ම ඒ අයුරින්ම කළා. ඒ නිසා ග්‍රිසෙල්ඩා තමාට බොහෝ ආදරය කරන බව කුමාරයා දැන ගත්තා. තවදුරටත් ඇය තමා ආදරේදැයි බලන්නට හිතුව කුමාරයා ඉතා කණගාටුදායක ඉල්ලීමක් කළා.

එදා කුමාරයා ටිකක් තදින් ග්‍රිසෙල්ඩාට කතා කළා. ''මම ඔබ වැනි දුප්පත් තරුණියක් විවාහ කර ගැනීම ගැන මහජනයා සිටින්නේ අකමැත්තෙන්. දැන් ඔබට දුවක් සිටින නිසා මිනිසුන් ඊටත් වැඩිය අකමැත්තෙනුයි ඉන්නේ . එමනිසා ඔබේ දියණිය මාලිගාවෙන් පිට කල යුතුව තිබෙනවා. ඔබට මතකයි නේද මා සමග විවාහ වන දිනයේ වූ පොරොන්දුව. එනම් මා කියන ඕනෑම දෙයකට කැමති වන බව'' යනුවෙන් කුමාරයා කිව්වා.

ග්‍රිසෙල්ඩාට ඉවසිය නොහැකි තරම් දුකක් ඇතිවුනා. මුලින් ඇය කිසිවක් කීවේ නැහැ. නමුත් පසුව මෙසේ කීවා. ''මමත්, මගේ දියණියත් අයිති වන්නේ ඔබටයි. ඒ නිසා ඔබට කැමති දෙයක් අපට කරන්න.'' ඒ බස් ඇසූ කුමාරයා මහත්සේ සතුටු වුනා.

ඔහු සේවකයකු යවා ග්‍රිසෙල්ඩාගෙන් දරුවා ගෙන්වා ගත්තා. ග්‍රිසෙල්ඩා මහත් ශෝකයෙන් දරුවා සිප වැළඳ ගත්තා. නැවත කිසි දිනක තම දියණිය දකින්නට නො ලැබෙනු ඇතැයි ඇය සිතුවා. ඇය තම, දියණිය ආරක්ෂා කර දෙනමෙන් සියලු දෙවියන්ගෙන් ඉල්ලා සිටියා. කුමාරයා තම සිඟිති දියණිය ඔහුගේ නැගණිය වන බොලෙග්නා වෙතට යැව්වා. මෙම දැරිය ඉතා ආදරයෙන් රැක බලා ගන්නා මෙන් බොලොග්නාට දන්වා යැව්වා. නමුත් මේ දැරිය තමාගේ දියණිය බව කිසිවෙකුට නො පවසන ලෙසට සේවකයන්ට කිව්වා.

මෙසේ දියණිය පිටත් කර යැවූ කුමාරයා ග්‍රිසෙල්ඩාගේ හැසිරීම දෙස විමසිලිමත්ව බැලුවා. ඇය මුලදී මෙන්ම කුමාරයාට ආදරය දක්වුවා. එහෙත් සැම විටම ඇගේ මුහුණේ ශෝකාකුල බවක් පෙනුනා.

ටික කලකට පසු නැවතත් ග්‍රිසෙල්ඩාට පුතෙක් ලැබුණා. කුමාරයත්, රටවැසියනුත් මහත් සේ සතුටුවුනා. රාජ්‍යය භාර ගැනිමට කුමාරයෙක් උපන් නිසා ග්‍රිසෙල්ඩාද සතුටු වුනා. එහෙත් ටික දිනක් ගතවන විට කුමාරයාගේ අදහස වෙනස් වුනා. ඔහුට නැවතත් ග්‍රිසෙල්ඩාගේ ආදරය තමාට ලැබේ දැයි විමසන්නට හිතුනා. '' ආදරණීය ග්‍රිසෙල්ඩා අපට පුතෙක් ලැබීම ගැන මම නම් හරිම සතුටුයි. නමුත් දුප්පත් ගොවියෙක් වන ඔබේ පියාගේ මුණුබුරෙකුට රාජ්‍යය හිමි වනවට රට වැසියෝ කැමති නැහැ. ඒ නිසා අපේ පුත්‍රයාද මාලිගාවෙන් පිටතට යැවිය යුතුවේ'' යනුවෙන් කුමාරයා කිව්වා.

''මගේ සවාමිනි, ඔබ මට කරන්නට කියා පවසන සැම දෙයක්ම මම කළෙමි. ඉතින් අපේ පුත්‍රයාටත් ඔබ කැමති දෙයක් කරන්න. මම ඔබට ආදරය කරමි. ඔබට මා නැතිව සිටීම සතුටක් නම්, මම මිය යාමට වුවද කැමතිය. ඔබට ආදරය කිරීමට පමණක් මට ඉඩ දෙන්න.'' ඉා ශෝකයෙන් යුතුව ග්‍රිසෙල්ඩා මෙසේ කියන ලද නමුත් කුමාරයාගේ අදහස වෙනස් කළේ නැ. ඔහු තම සේවකයාට කතා කොට පුත්‍රයා ගෙන්වා ගත්තා. ග්‍රිසෙල්ඩා තම පුතා නැවත කවදාවත් දකින්නට නො ලැබේ යයි සිතමින් ඔහුව ආරක්ෂා කර දෙන මෙන් සියලු දෙවියන්ගෙන් ඉල්ලා සිටියා මහත් ශෝකයෙන් යුතුව පුතා සිප වැළඳ ගත්තා. සේවකයාද කුඩා දරුවා රැගෙන කුමාරයාගේ නැගණියට ගෙන ගොස් බාර දුන්නා. පසුගිය

වතාවේ මෙන්ම මෙම වතාවේදීත් පොඩි පුතා කුමාරයාගේ බව කිසිවෙකුටත් කිව්වේ නෑ.

කුමාරයා නැවතත් තාමාගේ බිරිඳගේ ඉවසීමේ ගුණය ගැනත් තමාට ඇති ආදරය ගැනත් විමසා බැලුවා. ග්‍රිසෙල්ඩා වෙනදා වගේම කුමාරයාට ආදරයෙන් සැලකුවා. නමුත් තම දියණිය හා පුත්‍රයා තමාගෙන් වෙන් කිරීම ගැන ශෝකවෙමින් මැලවුණ මුහුණින් යුතුව කල් යැව්වා. රට වැසියෝ නොයෙක් ආකාරයට දොස් කියන්නට පටන් ගත්තා.

''කුමාරයා දරුවන් දෙදෙනෙක්ම මරා දැම්මා. ග්‍රිසෙල්ඩා දරුවන්ට ආදරය කරනවා දකින්නට ඔහු කැමති නෑ. ඔහු එයට ඊර්ෂ්‍යා කළා. කුමාරයාට අවශ්‍ය වන්නේ ග්‍රිසෙල්ඩා තමාට පමණක් ආදරය කරනවා දකින්නයි.'' සමහරු කීවා ''ග්‍රිසෙල්ඩා තම සැමියාට ඇති ආදරය වෙනස් නො කළා මෙන්ම දුප්පත් අපට උදව් කිරිමද වෙනස් නොකරන බව අපට සෑහීරයි.'' තවත් සමහරු කිව්වා.

ඊළඟට කුමාරයා තවත් නරක දෙයක් කළා. ඔහු රෝමයට ලියුමක් යවා ආපසු පිළිතුරක් ලබාගත්තා. එම ලිපිය සැබවින්ම රෝමයෙන් එවන ලද ලිපියක් නොවෙයි. නමුත් කුමාරයා කීවේ එම ලිපිය රෝමයේ පාප් වහන්සේ විසින් එවන ලද ලිපියක් බවයි. එහි සඳහන්ව ඇත්තේ දැන් තමා ළඟ සිටින භාර්යාව මාලිගයෙන් පිටකර දමා උසස් පවුලකින් ධනවත් භාර්යාවක් මාලිගාවට කැඳවාගෙන එන ලෙස බව ග්‍රිසෙල්ඩාට කුමාරයා කිව්වා. මෙය ඇසූ සාමාන්‍ය රට වැසියන් මහත් සේ කණගාටු වුනා. ඔවුන් ග්‍රිසෙල්ඩාට මහත් සේ ආදරය කරන නමුත් රෝමයෙන් ලැබුණ ලිපිය අනුව කුමාරයා ක්‍රියා කළ යුතු බැවින් ශෝකය ඉවසා ගෙන සිටියා. ''මම මගේ සවාමියාට මේ ලෝකයේ ඇති සෑම දෙයකටම

වඩා ආදරෙයි. මට අසන්නට ලැබුණ ඉතාම දුක්මුසු සිද්ධිය තමයි කුමාරයා අතහැර යාමට සිදුවීම යනුවෙන් ග්‍රිසෙල්ඩා සිතුවා. කුමාරයා නැතිව ජීවත් වන්නේ කෙසේදැයි කියමින් ග්‍රිසෙල්ඩා සිතින් දුක් වින්දා.

ටික දිනකට පසු කුමාරයා ග්‍රිසෙල්ඩාට කතා කළා. ''ඔබ විවාහ කර ගැනීමෙන් මට නරකක් වුයේ නැහැ. ඔබ මට හොඳ භාර්යාවක් වුනා. ඒ වගේම ඔබේ පියාටත් ඔබටත් එසේම වන්නට ඇතැයි සිතනවා. නමුත් දැන් මගේ ජීවිතය වෙනස් කිරීමට සිදු වී තිබෙනවා. එය මගේ රටවැසියන්ගේ ඉල්ලීමයි.'' දැන් මගේ තරුණ භාර්යාව මග එනවා ඇති'' යනුවෙන් කුමාරයා ග්‍රිසෙල්ඩාට කිව්වා.

''මා ඔබේ භාර්යාව වීමට නොව මෙහෙකාරියක වීමට වත් සුදුසු නැති බව දනිමි. මෙපමණ කාලයක් මාලිගාවේ විසීමට ඉඩදීම ගැන ස්තුතියි. මම ඉතා කැමැත්තෙන මගේ පියා ළඟට යමි. නමුත් මා නැවත කිසිදිනක විවාහ වන්නේ නැත. මා සදහටම ඔබට ආදරය කරමි. මා ආදරය කරන්නේ ඔබට පමණක්ම බව කියමි. ඔබ මුලදී මට ආදරය කරන බව කියා ඇත. එහෙත්, ඔබේ ආදරය දැන් ශිතල වී ඇති බව පෙනේ. මම මගේ සියලුම දේ අත්හැර යන්නෙමි. මගේ පරණ ඇඳුමක් පමණක් ගෙන යමි.'' යනුවෙන් ග්‍රිසෙල්ඩා කියා පිටත් වීමට සූදානම් වුණා. ඇය සතුව තිබූ රන්, රිදී, මුතු මැණික් සහිත ආභරණ සියල්ලත් ඉතා වටිනා ඇඳුම් සියල්ලත් ආපසු භාර දුන්නා. ඇගේ පරණ ඇඳුම ඇඳගෙන ඇය පියා ළඟට යාමට පිටත් වුනා. රටවැසියන් ඇය යන දෙස බලා අඬන්නට පටන් ගත්තා. නමුත් ග්‍රිසෙල්ඩා ඇඬුවේ නැහැ.

ග්‍රිසෙල්ඩාගේ පියා ඇගේ විවාහයට කිසිසේත්ම කැමති වුයේ නැහැ. එයට හේතුව කුමාරයා ඉතා ධනවත්

උසස් පුද්ගලයෙක් නිසා. දියණියගේ දරුවන්ට කුමක් සිදුවූයේ දැයි ජැනිකියුලා දියණියගෙන් කීප දවසක් ඇසූ නමුත් එයට පිළිතුරක් ලැබුණේ නැහැ. ඔහු බොහෝ උත්සාහ කළ නමුත් දරුවන් සොයා ගන්නත් නො හැකි වුනා. එමෙන්ම කුමාරයා නැවත විවාහයක් කරගැනීමට යන බවද ආරංචි වුනා. ග්‍රිසෙල්ඩා පැමිණෙන බව දැක ජැනිකියුලා ඉදිරියට දිවගොස් දියණියගේ අතින් අල්ලා ගත්තා. ග්‍රිසෙල්ඩා පියාට ඉතා ආදරයෙන් සලකමින් පරණ විදියටම ටික දිනක් ගත කළා.

කුමාරයා ග්‍රිසෙල්ඩාට මේ විදියට ඉන්නට ඉඩ දුන්නේ නැහැ. නැවත මාලිගයට එන ලෙස පණිවිඩයක් එව්වා. ග්‍රිසෙල්ඩා කුමාරයා හමුවීමට ගියා. ''ග්‍රිසෙල්ඩා, මම මගේ අලුත් භාර්යාවට හොඳට සලකන්න ඕනෑ. ඔබ මගේත් මගේ භාර්යාවගේත් මෙහෙකාරිය ලෙස වැඩ කරන්න ඕනෑ. ඔව්, දැන්මම වැඩ පටන් ගන්න. මගේ අලුත් භාර්යාවට අවශ්‍ය සෑම දෙයක්ම සූදානම් කරන්න.'' යනුවෙන් කුමාරයා කිව්වා.

ග්‍රිසෙල්ඩාට හරිම සතුටුයි. ''ඔබට සැලකීමට ලැබීම ගැන මහත් සේ සතුටුවෙනවා'' යි. ග්‍රිසෙල්ඩා කීවා. ඇය වහාම මාලිගාවේ වැඩ කටයුතු කරන්නට පටන් ගත්ත. ඇය ගේ දොර පිරිසිදු කළා. බිම සේදුවා, ඇඳන් ඉතා අලංකාර ලෙස පිළියෙල කළා. මල් පෝච්චි තැනින් තැන තබා ගේ සැරසුවා. සුළු සේවකයන්ටද ඉක්මනින් හා හොඳින් වැඩ කරන ලෙස දන්වා ඒ වැඩ ගැනද සොයා බැලුවා. දවල් වන විට රට වැසියන් මාලිගය වටා රැස් වුනා. ඔවුන් සියලු දෙනාම කුමාරයාගේ අලුත් මනමාලිය බැලීමේ ආශාවෙන් සිටියා.

ඔන්න ටික වේලාවකින් කුමාරයා ඉතාම රූපශෝභාවයෙන් යුත් ලා බාල තරුණියක් සමග ග්‍රිසෙල්ඩා ඉදිරියට පැමිණියා. ''ග්‍රිසෙල්ඩා,- මගේ තරුණ භාර්යාවගේ

රූමත්කම ගැන ඔබ කුමක් සිතන්නේ ද'' යි කුමාරයා ඇසුවා. ''මා කවදාවත් මෙපමණ රූමත් තරුණියක් දැකලා නෑ. මැය ඉතාම ලස්සනයි. ඒ වගේම උසස් පවුලකින් පැවත එන තැනැත්තියක් බවත් පේනවා. ඔබ දෙදෙනා ඉතා සතුටින් ජීවත් වන්න. ඔබ සතුටින් සිටිනවා දැකීම මගේ සතුටයි. නමුත් කුමාරයාණනි, ඔබේ අලුත් භාර්යාවට මට වගේ අකාරුණික වන්නට එපා. මට නම් මගේ දුප්පත් පියා සමග දුක් කම්කටොලු මැද ජීවත් වූ නිසා ඕනෑම දුකක් විඳින්නට ශක්තිය තිබේනවා. මම තවමත් ඔබට ආදරය කරනවා.'' යනුවෙන් ග්‍රිසෙල්ඩා තමාගේ අදහස් සියල්ල අවංකවම කියා අවසන් කළා.

ග්‍රිසෙල්ඩා තවමත් තමාට ආදරය කරන බව කුමාරයාට තේරුණා. ''අහෝ ! මා විසින් ග්‍රිසෙල්ඩාට මොන තරම් අකාරුණික ලෙස කරදර කරන ලද දැයි කියමින් කුමාරයා කෑගැසුවා. මම නැවත කිසිදිනෙක ඔබට දුකක් දෙන්නේ නෑ.

''දැන් මට ඔබේ ආදරය කොතරම් දැයි තේරෙනවා. එසේම ඔබේ ඉවසීමේ ශක්තිය ගැන මම පුදුම වෙනවා. ඔබ මොනතරම් අවංක දැයි මට පේනවා'' යනාදී වශයෙන් නොයෙක් දේ කියමින් ග්‍රිසෙල්ඩාට ප්‍රසංශා කළා. ඉන්පසු ඉතා ආදරයෙන් ග්‍රිසෙල්ඩාගේ අතින් අල්ලා ගත්තා. සිදුවූ සියලු දේ ගැන කුමාරයා ග්‍රිසෙල්ඩාට කිව්වා.

''ග්‍රිසෙල්ඩා, මේ සිටින්නේ ඔබේ පුංචි දියණියයි.'' කියමින් තමාසමග පැමිණි පුංචි කුමාරිය ග්‍රිසෙල්ඩාට පෙන්නුවා. මම නැවත විවාහ වෙනවා කිව්වේ බොරුවක්. ඔබේ ආදරය ගැන සොයා බලන්නයි එසේ කිවේ. මේ සිටින්නේ ඔබේ පුතා. මේ දෙදෙනාම මගේ නංගී ළඟ

ඉතා හොඳින් වැඩුනා.'' යනුවෙන් තම පුතාද ග්‍රිසෙල්ඩාට පෙන්නුවා.

ග්‍රිසෙල්ඩා සතුටින් පිනා ගියා. ඇය තම දරුවන් දෙදෙනා ආදරයෙන් සිප වැළඳ ගත්තා. මෙය බලා සිටි පිරිස ප්‍රීතිය ඉවසාගත නොහැකිව සතුටු කඳුලු හෙලන්නට පටන් ගත්තා. ''කුමාරයාණෙනි, ඔබට බොහෝම ස්තුතියි. ඔබ මගේ දරුවන් දෙදෙනා ආරක්ෂා සහිකව රැක බලා ගත්තා. මට මගේ දරුවන් නැවත ලැබුණා මට දැන් මියයන්නට වුවද පුළුවන්.'' යනුවෙන් ග්‍රිසෙල්ඩා ඉතා සතුටින් කීවා.

ඉන්පසු ග්‍රිසෙල්ඩාගේ දුප්පත් පියා මාලිගයට කැඳවා ගෙන ආවා. ඔහුට මාලිගයේ කාමරයක් ලබා දී ඉතා හොඳින් සැලකුවා.

ග්‍රිසෙල්ඩාගේ ඉවසීමේ ගුණය නිසාත් අවංක ආදරය නිසාත් සියල්ල ජය ගන්නට පුළුවන් වුනා.

තාර්තාරියේ අගනුවර වූ සමර් - කණ්ඩ නගරයේ සිට රාජ්‍ය පාලනය ගෙන ගිය ශෘරියර් නම් රජතුමා, තම බිසවගේ අයහපත් හැසිරීම හේතුවෙන් සියලුම කාන්තාවන් හා කලකිරීමට පත්ව දිනපතා තරුණියක බැගින් මරා දමන්නට විය.

එම විපතින් තරුණියන් බේරා ගැනීමට ඉදිරිපත් වූ මහඇමති දියණිය වූ එඩිතර, තීක්ෂණ බුද්ධියකින් යුක්ත වූ රූමත් ෂිහර්සාදි විසින් රජු එම කෲර කටයුත්තෙන් වැළැක්වීමට අනුගමනය කළ ක්‍රියාමාර්ගයේ දී එක් දහස් එක් රැයක් පුරා රජුට පැවසූ කතාන්දර වලින් කීපයක් මෙම පොතෙහි ඇතුළත් ය.

එක දිගට නොනවත්වා රස විඳිය හැකි මෙම කතාන්දර ලෝකයේ බොහෝ රටවල්වල නොයෙකුත් භාෂාවන්ට පරිවර්තනය කර ඇත.

# අරාබි නිසොල්ලාසයේ කතා

පරිවර්තනය - **සිරිමා බස්නායක**

SUSARA CLASSICS

Arabian Nights



www.susarapublications.net
ISBN - 978-955-676-733-9
SUSARA PUBLICATION

LG. 180/43,Peoples park, Colombo 11.
Tele : 0112 430721 Fax : 0112 334597
E-mail : susarapub@gmail.com

TRB061
Rs. 150.00

www.facebook.com/susarapublications